# 2023

# ප්‍රගති වාර්තාව

# முன்னேற்ற அறிக்கை

# Progress Report



**වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය**

**வர்த்தக,வணிக மற்றும் உணவு பாதுகாப்பு அமைச்சு**

**MINISTRY OF TRADE, COMMERCE AND FOOD SECURITY**

# 2023 - ප්‍රගති වාර්තාව

වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය

## ගරු අමාත්‍යතුමාගෙන්...



වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍ය ධුරයේ 2022 මැයි මස මා වැඩභාර ගැනීමෙන් අනතුරුව අමාත්‍යාංශය යටතේ පවතින ආයතන මඟින් අමාත්‍යාංශයේ විෂය පථයට අයත් මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් කටයුතු කිරීමට අවශ්‍ය මාර්ගෝපදේශ ලබාදීමට හැකිවීම මා ලැබූ මහඟු අවස්ථාවකි.

දේශීය වෙළෙඳපොළ තුල පාරිභෝගික භාණ්ඩවල විශේෂයෙන් අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල මිල ඉහළයාමකින් තොරව පවත්වාගෙනයාම සඳහා මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මකවන සීමාසහිත ලංකා සතොස සමාගම අඛණ්ඩ දායකත්වයත් ලබා දෙමින් පවතී. එය රටේ උද්ධමනය පාලනය කිරීමට සුවිශේෂී මෙහෙවරක් ඉටුකරන අතර, අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය වල මිල සැසඳීමේ දී මිලෙහි වාසිය පාරිභෝගිකයා වෙත ලබා දීමට නිරන්තරයෙන් කටයුතු කෙරේ. ලංකා සතොස වෙළෙඳසැල් ජාලය තුලින් වෙළෙඳපොළ අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල මිල පාලනයට දායකත්වයක් ලබාදීමෙන් ජනතාවගේ ජීවන වියදම කළමනාකරණය කිරීමටත් රට තුළ ආහාර සුරක්ෂිතතාවයක් ඇති කිරීමටත් හැකි වි ඇත.

ලංකා සතොස සමාගම 2023 ජූලි මස දක්වා අලාභ ලබමින් පැවැති අතර අවශ්‍ය කළමනාකාරිත්වයේ වෙනස්කම් ඇති කරමින් ව්‍යාපාර කටයුතු මෙහෙයවීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ ලබා දෙමින් නිරන්තර පසු විපරම් කටයුතු සිදු කිරීම නිසා මේ වන විට එම මෙහෙයුම් කටයුතු ලාභදායී තත්ත්වයක් ලබා කරගෙන ඇත.

එමෙන්ම වෙළෙඳපොළ අසමතුලිතතාවයන්ගෙන් භාණ්ඩ හිඟය ඇති වීම වැළැක්වීම සහ පාරිභෝගික ආරක්ෂණය තහවුරු කිරීම සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ කාර්යයන් හැසිරවීමට අවශ්‍ය විධිවධාන යොදන ලදී. එසේම පාරිභෝගික ආරක්ෂාව පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීමේ කටයුතු හා වෙළෙඳ ප්‍රජාව දැනුවත් කිරීමේ කටයුතු පුළුල් කරන ලදී.

එසේම පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනතේ විධිවිධාන අනුව එම අධිකාරියට ලැබෙන පැමිණිලි සඳහා පරීක්ෂණ පවත්වනු ලබන ක්‍රමවේදය කාර්යක්ෂම කිරීම උදෙසා එම කටයුතු විමධ්‍යගත කරමින් දිස්ත්‍රික් මට්ටමින් පැවැත්වීමට විධිවිධාන සැලැස්වීම සහ මේ යටතේ එක් එක් දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහකාර දිස්ත්‍රික් ලේකම්/ සහකාර දිසාපතිගේ ප්‍රධානත්වයෙන් නීති ආධාර කොමිෂන් සභාවේ නියෝජිතයෙකු සහ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ පළාත් සහකාර අධ්‍යක්ෂවරයෙකුගෙන් සමන්විත ත්‍රිපුද්ගල පරීක්ෂණ සභාවක් පිහිටුවා එමඟින් පරීක්ෂණ කටයුතු සිදු කිරීමට අවශ්‍ය මගපෙන්වීම සිදුකර ඇත.

මහපොළ නිර්මාතෘ ගරු දිවංගත ලලිත් ඇතුලත්මුදලි මැතිතුමාගේ සංකල්පයක් ලෙස ආරම්භ කළ මහපොළ අධ්‍යාපන හා වෙළෙඳ ප්‍රදර්ශනය පසුකාලීනව වසර 10කට වැඩි ප්‍රමාණයක් අකර්මන්‍යව පැවැතිනි. 2023 වර්ෂයේ සිට එම වෙළෙඳ ප්‍රදර්ශනය නැවත ආරම්භ කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලදී. ඒ තුළින් මහපොළ අරමුදල ශක්තිමත් කිරීම හා උසස් අධ්‍යාපනය සඳහා යොමු වන ශිෂ්‍ය ශිෂ්‍යාවන් වැඩි ප්‍රමාණයකට මූල්‍ය දායකත්වය ලබා දීමට හා මහපොළ වාරිකය වැඩි කර ලබා දීමට හැකි වීම මේ තුළින් ලැබූ ජයග්‍රහණයක් ලෙස දක්වනු කැමැත්තෙමි.

තවද මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව විසින් පාරිභෝගික අයිතීන් සුරැකීම සඳහා සිදු කරනු ලබන ක්‍රියාකාරකම් විධිමත් කර එය සවිබල ගන්වමින් පාරිභෝගිකයින් දැනුවත් කිරීමේ වැඩසටහන් නව මුහුණුවරකින්, සිදු කෙරේ. තවදුරටත් විශේෂ වැටලීම් හා සම්බන්ධ කාර්යයන්

ඒකාබද්ධ වැඩපිළිවලක් මඟින් සිදු කිරීමේ අරමුණින් පිහිටුවනු ලබන ජාතික මෙහෙයුම් මධ්‍යස්ථානය කඩිනමින් පිහිටුවීමට අපේක්ෂිතය.

සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කේන්ද්‍ර කර ගනිමින් 2022 තුන්වන කාර්තුවේ ආරම්භකළ පාරිභෝගික සේවා කමිටු මේ වන විට සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතී. මෙම පාරිභෝගික සේවා කමිටුව සම්පූර්ණයෙන්ම ස්වේච්ඡා පදනමින් ක්‍රියාත්මක වන ප්‍රජා කමිටුවකි. එමඟින් ප්‍රධාන වශයෙන් ග්‍රාමීය මට්ටමේ අතිරික්ත කෘෂි නිෂ්පාදන හඳුනාගැනීම, ලක් සතොස හා විවිධ සේවා සමුපකාර ජාලය හරහා පරිභෝජන ද්‍රව්‍ය මිලදී ගැනීමේ ක්‍රියාවලියට සහය වීම, භාණ්ඩ හා සේවාවල මිල අඩු වැඩිවීම් පිළිබඳව ජනතාව දැනුවත් කිරීම, අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය හෝ සහනාධාර හිමි විය යුතු දිළිඳු පවුල් නිශ්චිතව හඳුනාගැනීම, හිඟකමක් සහිත අත්‍යාවශ්‍ය ආහාර හා වෙනත් පාරිභෝගික ද්‍රව්‍ය ජනතාවට බෙදාදීමේ ක්‍රමවත් වැඩපිළිවෙලක් සැකසීමට සහාය වීම, ආහාර හෝ අස්වැන්න සුරක්ෂිත කිරීම සහ කල්තබා ගැනීමේ ක්‍රම හඳුන්වා දීමට සහාය වීම, පාරිභෝගිකයින්ට ප්‍රයෝජනවත් පරිදි වෙළෙඳපොළ තොරතුරු ප්‍රචලිත කිරීම ආදී කාර්යයන් සඳහා කටයුතු සිදුකිරීම අපේක්ෂා කෙරේ.

පවතින ආර්ථික අභියෝගතා හමුවේ නව රජයේ ආර්ථික ප්‍රතිපත්තීන්වලට අවනත වෙමින් පාඩු ලබන රාජ්‍ය, අර්ධ රාජ්‍ය, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සංස්ථා ප්‍රතිව්‍යුහගත කිරීම යටතේ මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව එහි සියලු සේවකයින් 2023.09.30 දිනෙන් විශ්‍රාම ගන්වන ලදී.

සමුපකාර ව්‍යාපාරය ප්‍රතිව්‍යුහගත කිරීමේ මූලික අරමුණු සාක්ෂාත් කරගැනීමට රාජ්‍ය අංශයේ සීමිත මැදිහත්වීමකින් සමුපකාර ව්‍යාපාරය ස්වයං පාලන ආයතන වශයෙන් ක්‍රියාත්මක වීමට අවස්ථාව සැලසාලමින් " ජාතික සමුපකාර ව්‍යාපාරය හා සම්බන්ධ රේඛීය ආයතන ප්‍රතිව්‍යුහගත කිරීම" යන මැයෙන් මා විසින් ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා ප්‍රතිපත්තිමය අනුමැතියක් ලබා දී ඇත. ඒ අනුව සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගතකිරීමත්, සමුපකාර සේවක කොමිෂන් සභාව අහෝසි කිරීමත් සිදුකර එම ආයතනයන්හි කාර්යයන් වඩාත් කාර්යක්ෂම කිරීම සඳහා එම ආයතනය කොළඹ 03, ගාලු පාරේ පිහිටි ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලයේ ප්‍රධාන ගොඩනැගිල්ලේ ස්ථානගත කර එහි කටයුතු ඒ ආකාරයෙන්ම පවත්වාගෙන යාමට අවශ්‍ය මාර්ගෝපදේශ ලබා දී ඇත.

ඉහතින් සඳහන්කල සුවිශේෂී කාර්යය ඉටුකර ගැනීම සඳහා දායකත්වය ලබාදුන් ගරු රාජ්‍ය අමාත්‍යතුමා, අමාත්‍යාංශයේ ලේකම් ඇතුළු කාර්යමණ්ඩලය, දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ ව්‍යවස්ථාපිත ආයතනවල සභාපතිවරුන් හා සියලු කාර්යමණ්ඩලය වෙත මාගේ හෘදයාංගම ස්තූතිය පළ කරමි.

**නලීන් ප්‍රනාන්දු (පා.ම.)**
**වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍ය**

**අමාත්‍යාංශ ලේකම්ගෙන්...**



වර්තමාන රජයේ ප්‍රතිපත්ති වලට අනුකූල වෙමින් ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා ඉහළ දායකත්වයක් සැපයීම වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ මූලික කාර්යභාරයකි. ඒ අනුව, වෙළෙඳ අංශයේ නායකත්වය සපයමින් සේවා හා නියාමන ක්‍රියාකාරකම්වල යෙදෙමින් නිෂ්පාදකයන්, ව්‍යාපාරිකයන් සහ පාරිභෝගිකයන්ගේ අයිතිවාසිකම් සුරැකීම සිදු කෙරෙනු ඇත. වෙළෙඳ හා වාණිජ අයිතීන් තහවුරු කරන දේශීය සහ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වූ ජාතික වෙළෙඳ ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීම, පවත්වාගෙනයාම හා නියාමනය කිරීම මඟින් ශ්‍රී ලාංකිකයින්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමේ මෙහෙවර ඉටු කරමින් තිරසාර සංවර්ධිත ශ්‍රී ලංකාවක් ගොඩනැගීම අපගේ ඉලක්කය වේ.

වර්තමානයේ පවතින ආර්ථික අර්බුදය හමුවේ වුවද පාරිභෝගිකයා මෙන්ම වෙළෙඳ ප්‍රජාවද ආරක්ෂා වන අයුරින් විශේෂයෙන්ම අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය වෙළෙඳපොළ තුළ සුලබ කිරීමට කටයුතු කිරීම තුළින් සියලු ජන කොට්ඨාස සඳහා සම ප්‍රතිලාභ හිමිකර දීමට අවස්ථාව සැලසීමට ද බලාපොරොත්තු වේ. ඒ අනුව පාරිභෝගික ගැටලු හඳුනාගැනීම හා ඒවාට විසඳුම් ලබා දීම අරමුණු කර ගනිමින් සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය වන පරිදි පාරිභෝගික සේවා කමිටු ජාලය ක්‍රියාත්මකව පවතී.

පාරිභෝගික භාණ්ඩ මිල අසාමාන්‍ය ලෙස ඉහළ යාම පාලනය කිරීම සඳහා එම භාණ්ඩ ආනයනය කර වෙළෙඳපොළ භාණ්ඩ සමතුලිතතාවය ඇති කිරීමට ද පියවර ගන්නා ලදී. බිත්තර ආනයනය කිරීම තුළින් දේශීය වෙළඳපොළ තුළ බිත්තර මිල ඉහළ යාම පාලනය කිරීමට හැකි වූ අතර හිඟයකින් තොරව වෙළඳපොළ තුළ බිත්තර සුලබ කිරීමට ද හැකියාව ලැබුණි.

ලලිත් ඇතුළත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල යටතේ අඛණ්ඩව පවත්වාගෙන ගොස් දශකයකට ආසන්න කාලයක් නතරව තිබූ අධ්‍යාපන හා වෙළඳ ප්‍රදර්ශනය මෙම වසර තුළ දී නැවත ආරම්භ කිරීමට කටයුතු කර ඇති අතර ඒ තුළින් උසස් අධ්‍යාපනය සඳහා යොමුවන සිසු සිසුවියන් වැඩි ප්‍රමාණයකට ශිෂ්‍යත්ව ලබා දීමටත්, ශිෂ්‍යත්ව වාරික මුදල වැඩි කිරීමටත් අපේක්ෂා කරන අතර ඒ සඳහා සමස්ත ශිෂ්‍යත්ව අරමුදල වර්ධනයකර ගැනීම මෙහි මූලික අරමුණ වේ. මෙම ප්‍රදර්ශනය මඟින් දේශීය ව්‍යවසායකයන්ගේ නිෂ්පාදන ප්‍රචලිත කිරීමට හා වෙළෙඳපොළ අවස්ථා පුළුල් කිරීමට මෙන්ම නවීන සන්නිවේදන තාක්ෂණයට යොමු කරවීමටත්, පාසල් දරුවන් සහ විශ්ව විද්‍යාල ප්‍රවේශය අපේක්ෂාවෙන් සිටින ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ උසස් අධ්‍යාපනයෙහි ඇති නව අවස්ථා හඳුන්වා දිමටත්, විශේෂයෙන් තාක්ෂණික දැනුම හා කුසලතා වර්ධනය කිරීමට ඉඩප්‍රස්ථා ලබා දීමටත්, මෙමඟින් අවස්ථාව උදාවනු ඇත.

වෙළෙඳපොළ අසමතුලිතතාවයන්ගෙන් මතුවන භාණ්ඩ හිඟයන් හා මිල අස්ථාවර වීම වළක්වා ගැනීම, දේශීය ගොවි නිෂ්පාදන සඳහා වෙළෙඳපොළ පුළුල් කිරීම, ප්‍රමිතියෙන් යුත් භාණ්ඩ වෙළෙඳපොළට සැපයීම පුළුල් කිරීම සහ අපනයන ක්ෂේත්‍රය තුළින් විදේශ විනිමය ඉපැයීම වැඩිකරගැනීමට සහය වීම යන ප්‍රධාන අරමුණු සාක්ෂාත් කරගැනීමේදී අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ පවතින ආයතනයන්ගේ දායකත්වය ලබාදෙන ලදී.

විදේශ විනිමය සංචිත ඉහළ නංවා ගැනීමට ඍජුව දායකත්වය දක්වන අපනයන ක්ෂේත්‍රය තුළ නිරත අපනයනකරුවන් සඳහා විදේශ වෙළඳපොළ අවස්ථා පුළුල් කර ගැනීමටත්, ජාත්‍යන්තර වෙළෙඳ කටයුතුවල දී ඇතිවන ආරවුල් නිරාකරණය කිරීමටත්, නෛතික කටයුතුවල දී මැදිහත්ව කටයුතු කර අපනයන සඳහා ඉහල ඉඩ ප්‍රස්ථා සලසා දීමට කටයුතු කිරීමටත් හැකි වීම අප ලැබූ මහඟු අවස්ථාවකි.

ඒ අනුව මෙම කාර්යභාරය ඉටු කිරීමේ දී ඒ සඳහා මාර්ගෝපදේශ හා උපදෙස් ලබාදුන් වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා ගරු අමාත්‍යතුමාටත්, ගරු රාජ්‍ය අමාත්‍යවරයාටත්, අමාත්‍යාංශයේ මෙහෙවර සහ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා කැපවීමෙන් කටයුතු කළ අමාත්‍යාංශ කාර්යමණ්ඩලයට හා අනුබද්ධිත ආයතනවල ප්‍රධානීන් ඇතුළු එම කාර්යමණ්ඩලවලටත් මාගේ ස්තූතිය පිරිනමමි.

**ඒ. එම්. පී. එම්. බී අතපත්තු**

**ලේකම්**

# පෙළගැස්ම

01. පළමු පරිච්ඡේදය - දැක්ම මෙහෙවර අරමුණු සහ කාර්යයන්…………………1

02. දෙවන පරිච්ඡේදය - සුවිශේෂිතා……………………………………………7

03. තෙවන පරිච්ඡේදය - 2023 ප්‍රගතිය………………………………………....15

04. සිව්වන පරිච්ඡේදය - 2024 - ඉදිරි සැලැසුම්………………………………....51

## වගු පෙළගැස්ම


වගු අංකය 3. 1 වෙළෙඳ වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ ප්‍රගතිය ............................ 17

වගු අංකය 3. 2 විදේශීය පුහුණු පාඨමාලා සඳහා නිලධාරීන් යොමු කිරීම ............................ 18

වගු අංකය 3. 3 මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ ආදායම් උත්පාදන ව්‍යාපෘති/ක්‍රියාකාරකම් ............................ 20

වගු අංකය 3. 4 මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය ............................ 20

වගු අංකය 3. 5 මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ මිනුම් විද්‍යාගාර අන්තර් සංසන්දනය ............................ 21

වගු අංකය 3. 6 ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම (ISFTA) යටතේ තීරුබදු අනුපාත කෝටා සහතික (TRQC) නිකුත් කිරීම ............................ 24

වගු අංකය 3. 7 තීරුබදු අනුපාත කෝටා සහතික (TRQC) නිකුත් කිරීම ............................ 24

වගු අංකය 3. 8 අසියා ශාන්තිකර වෙළෙඳ ගිවිසුම (APTA) යටතේ අපනයනය සහ ආනයනය ප්‍රගතිය ............................ 25

වගු අංකය 3. 9 විදේශයන්හි සේවයේ නියුතු වාණිජ නිළධාරින් විසින් ඉටුකරනු ලැබූ කාර්යයන් ... 26

වගු අංකය 3. 10 2023.01.01 සිට 2023.09.30 දක්වා අපනයනකරුවන් වෙත ප්‍රභවස්ථාන සහතික (COO) නිකුත් කිරීම ............................ 27

වගු අංකය 3. 11 ගෝලීය වෙළෙඳ වරණ ක්‍රමය (GSTP) යටතේ ශ්‍රී ලංකාවේ අපනයනය ............ 30

වගු අංකය 3. 12 සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ව්‍යාපෘති හා වැඩසටහන් වල මූල්‍ය හා භෞතික ප්‍රගතිය ............................ 32

වගු අංකය 3. 13 සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමිති විගණනයේ ප්‍රගතිය ............................ 32

වගු අංකය 3. 14 සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමිති ලියාපදිංචි කිරීමේ ප්‍රගතිය ........... 32

වගු අංකය 3. 15 සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සමිති සඳහා ලබා දුන් ණය ........... 32

වගු අංකය 3. 16 සීමාසහිත ලංකා සතොස සමාගමේ 01/2023 සිට 09/2023 දක්වා ශුද්ධ ලාභය/ (අලාභය) ............................ 33

වගු අංකය 3. 17 2023 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලය තුළ ආරම්භ කරන ලද සහ යෝජිත වත්මන් අලෙවිසැල් ............................ 34

වගු අංකය 3. 18 ජාත්‍යන්තර ප්‍රතීතන සංසදය (IAF) හා ජාත්‍යන්තර රසායනාගාර ප්‍රතීතන සහයෝගිතාව (ILAC) අන්‍යෝන්‍ය පිළිගැනීම යටතේ ප්‍රතීතනය ලබා දීමේ ප්‍රගතිය ............................ 34

වගු අංකය 3. 19 අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය 2023.01.01 වන දින සිට 2023.09.30 වන දින දක්වා ලබා දී ඇති නව ප්‍රතීතනයන් ............................ 35

වගු අංකය 3. 20 අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය 2023.01.01 වන දින සිට 2023.09.30 වන දින දක්වා ආදායම් උත්පාදනය ............................ 38

වගු අංකය 3. 21 2023 මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව ගෙවීම් පිළිබඳ තොරතුරු (විශ්ව විද්‍යාල හා අනෙකුත් ආයතන) ............................ 38

වගු අංකය 3. 22 මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව ප්‍රධානය පිළිබඳ තොරතුරු ........................... 39

වගු අංකය 3. 23 විශ්ව විද්‍යාල ප්‍රවේශිත මුළු ශිෂ්‍යත්ව සංඛ්‍යාව හා මහපොළ ශිෂ්‍යත්වලාභීන් අතර සැසඳීම ........................................................................................ 39

වගු අංකය 3. 24 2023 ජනවාරි සිට සැප්තැම්බර් මාසය දක්වා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ ක්‍රියාකරකම්හි ප්‍රගතිය .................................................................. 40

වගු අංකය 3. 25 පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය තෝරාගත් අත්‍යවශ්‍ය භාණ්ඩ හරහා වෙළෙඳාම පහසු කිරීම සඳහා මැදිහත් වීම ....................................................... 42

වගු අංකය 3. 26 පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි මඟින් අමාත්‍යාංශ සහ පාර්ශවකරුවන් වෙත තොරතුරු බෙදා හැරීම ........................................................................ 44

වගු අංකය 3. 27 සමුපකාර ක්ෂේත්‍රයේ මානව සම්පත් සංවර්ධනය හා කළමනාකරණය සඳහා පැවැත්වූ සමුපකාර සේවකයන් දැනුවත් කිරීමේ වැඩමුළු ................................. 45

වගු අංකය 3. 28 ජාතික සමුපකාර සංවර්ධන ආයතනය විසින් පාඨමාලා පැවැත්වීමේ ප්‍රගතිය ...... 46

වගු අංකය 3. 29 ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ ආයතන අංශයේ ප්‍රගතිය ....................... 46

වගු අංකය 3. 30 ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ නේවාසික අංශයේ ප්‍රගතිය .................... 49

වගු අංකය 3. 31 ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ ආදායම් උත්පාදන වැඩසටහන් හා ඒවායේ ප්‍රගතිය ........................................................................................ 49

වගු අංකය 3. 32 ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපල කාර්යාලය විසින් පේටන්ට් බලපත්‍ර ලබා දීමේ ප්‍රගතිය ........................................................................................ 50

වගු අංකය 3. 33 ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපල කාර්යාලය විසින් කාර්මික සැලසුම් ලබා දීමේ ප්‍රගතිය ........................................................................................ 50

වගු අංකය 3. 34 ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපල කාර්යාලය විසින් වෙළෙඳ ලකුණු ලබා දීමේ ප්‍රගතිය ........................................................................................ 50

වගු අංකය 4. 1 සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2024 වසරේ දී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති / වැඩසටහන් ............................................................. 54

වගු අංකය 4. 2 ජාතික සමුපකාර සංවර්ධන ආයතනය විසින් 2024 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් ........................................................................ 58

## පළමු පරිච්ඡේදය

# දැක්ම මෙහෙවර අරමුණු සහ කාර්යයන්

# 01. දැක්ම මෙහෙවර අරමුණු සහ කාර්යයන්

## 1.1. දැක්ම

"තිරසර සංවර්ධිත ශ්‍රී ලංකාවක්"

## 1.2. මෙහෙවර

වෙළෙඳ අංශයේ නායකත්වය සපයමින් සේවා සැපයීමේ හා නියාමන ක්‍රියාකාරකම්වල යෙදෙමින් නිෂ්පාදකයන්, වෙළෙඳුන් හා වෙනත් සේවා සපයන්නන්ගේ සහ පාරිභෝගිකයන්ගේ සමානත්වය හා වෙළෙඳ අයිතීන් තහවුරු කරන දේශීය සහ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වූ ජාතික වෙළෙඳ ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීම, පවත්වාගෙන යාම මෙන්ම ශ්‍රී ලංකාවේ විදේශ වෙළෙඳ සබඳතා වැඩිකර ගැනීමට ද්විපාර්ශ්වීය, කලාපීය හා බහුපාර්ශවීය වෙළෙඳ ගිවිසුම් සඳහා එළඹීම තුළින් නව වෙළෙඳපළ අවස්ථා හිමි කරගැනීමටත්, ශ්‍රී ලාංකිකයින්ගේ එදිනෙදා පාරිභෝජන භාණ්ඩ හා සේවා වල ගුණාත්මකභාවය ඉහළ නැංවීම තුළින් ඉහළ ජීවන තත්ත්වයක් පවත්වා ගෙන යාමටත් දායක වීම.

## 1.3. අරමුණු

i. ජාතික වෙළෙඳ ප්‍රතිපත්තියක් තුළින් දේශීය නිෂ්පාදකයින් හා පාරිභෝගිකයින්ගේ අයිතීන් සුරකෙන පරිදි වෙළෙඳපොළ හැසිරීම පාලනය සඳහා මෙවලමක් ලෙස තීරුබදු ප්‍රතිපත්තිය යොදා ගැනීම හා නිෂ්පාදනයන් දිරිමත් කිරීම සඳහා දේශීය නිෂ්පාදකයින් සඳහා බදු සහන ලබාදීම තුළින් අපනයනය දිරිමත් කිරීම.

ii. වෙළෙඳපොළ තුළ භාණ්ඩ වල මිල අසාමාන්‍ය ලෙස ඉහළ ගොස් ඇති අවස්ථාවන්හිදී, අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල පාලනය කිරීම තුළින් ජීවන වියදම පහළ මට්ටමක පවත්වාගෙන යාම.

iii. විවෘත තරගකාරී වෙළෙඳපොළ පරිසරයක ලංකා සතොස සමාගම, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව, ජාතික මට්ටමින් සමුපකාර සමිති හා සංගම් වැනි රාජ්‍ය ආයතන හරහා පාරිභෝගිකයන් වෙත සහනදායී වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මඟපෙන්වීම සිදු කිරීම.

iv. වෙළෙඳ ප්‍රජාව මෙන්ම පාරිභෝගිකයින්ගේද ප්‍රයෝජනය පිණිස මිණුම් ඒකක ප්‍රමිතීන් නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සහතික වීම.

v. ආහාර සුරක්ෂිතතාව තහවුරු කරලීම සඳහා රට තුළ අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල ආරක්ෂක තොග (Buffer Stock) පවත්වාගෙන යාමට අවශ්‍ය නෛතික රාමුව මෙන්ම යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

vi. අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවලට අදාල දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම, එම දත්ත පද්ධති යාවත්කාලීන කිරීම හා එම දත්ත බාහිර තොරතුරු සපයන ආයතන සමඟ සම්බන්ධ කිරීමේ යාන්ත්‍රණයක් සැකසීම.

vii. දේශීය නිෂ්පාදනයන් හා අපනයන භාණ්ඩවල, නිසි ප්‍රමිතීන් ආරක්ෂා කිරීමට අදාළ විධිවිධානයන් ක්‍රියාත්මක කිරීමට මඟපෙන්වීම.

viii. උසස් අධ්‍යාපනය සඳහා දරු දැරියන් දිරිමත් කිරීමට අදාළ සුභසාධන ක්‍රියාවලින් පවත්වා ගෙන යාමට දායකත්වය ලබාදීම.

ix. ජාතික බුද්ධිමය දේපල ආරක්ෂා කිරීම සඳහා සංරක්ෂණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම සඳහා මඟපෙන්වීම.

x. ජාතික හා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව කරගෙන යනු ලබන අනුකූලතා තක්සේරු ප්‍රතීතන සේවා සහතික කිරීමට අදාළ මඟපෙන්වීම.

xi. ශ්‍රී ලංකාවේ ආර්ථික හා වාණිජ අභිරුචීන් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීමට, ජාත්‍යන්තර වෙළෙඳපළ අවස්ථා සඳහා අපනයනකරුවන් දිරිගැන්වීමට අවශ්‍ය ආයතනික පසුබිම සකස්කරදීම හා ඒ හා සම්බන්ධිත ආයතන දිරිගැන්වීම.

xii. අදාළ ද්විපාර්ශවීය, කලාපීය හා බහුපාර්ශවීය වශයෙන් රටවල් සමඟ ගිවිසුම්ගතවීම් වලදී පහසුකම් සැලසීම හා සම්බන්ධීකරණය.

xiii. ශ්‍රී ලංකාවේ අපනයන සඳහා වරණීය පාද ක්‍රමය ( GSP ) අන්‍යොන්‍ය නොවන වෙළෙඳ ගිවිසුම් ( NMTR ), නිදහස් වෙළෙඳ ගිවිසුම් ( FTA ) සහ කලාපීය වෙළෙඳ ගිවිසුම් ( RTA ) සඳහා අදාළ නෛතිකමය සම්බන්ධීකරණයට අවශ්‍ය මඟපෙන්වීම.

**1.4. කාර්යයන්**

I. රට හදන සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුකූලව සහ රජය මඟින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා වෙළෙඳ විෂයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය කිරීම.

II. අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන්, ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරිම, පසු විපරම් කිරීම හා ඇගයීම.

III. ජාතික වෙළෙඳ ප්‍රතිපත්තියක් සකස් කිරීම හා එම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාළ වන ආයතන සම්බන්ධීකරණය කිරීමට කටයුතු කිරීම.

IV. දේශීය පාරිභෝගිකයා ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය මිල පාලනයන් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නෛතික විධිවිධාන සැලැස්වීම.

V. දේශීය වෙළෙඳපළ තුළ ඇතිවන මිල උච්චාවචනයන් පාලනය කිරීම සඳහා මැදිහත්කරුවෙකු ලෙස ක්‍රියාකිරීම.

VI. ලෝක වෙළෙඳපොළ තුළ නව අපනයන අවස්ථා හඳුනාගැනීමට මෙන්ම නව ද්විපාර්ශවීය, කලාපීය හා බහුපාර්ශවීය වෙළෙඳ ගිවිසුම් ඇති කර ගැනීමේ අවස්ථා පිළිබඳ ගවේශණය කිරීමට ආයතන දිරිමත් කිරීම හා අවශ්‍ය පහසුකම් සැලසීම.

VII. පාරිභෝගිකයා වඩාත් සුරක්ෂිත කිරීම සඳහා අදාළ වන නීති, අණ පනත් යාවත්කාලීන කිරීම.

**1.5. අමාත්‍යාංශය යටතේ ඇති ආයතන**

i. ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව
ii. මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව
iii. වාණිජ දෙපාර්තමේන්තුව
iv. සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
v. සීමාසහිත ලංකා සතොස සමාගම
vi. අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය
vii. ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල
viii. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය
ix. සමුපකාර සේවක කොමිෂන් සභාව
x. ජාතික සමුපකාර සංවර්ධන ආයතනය
xi. ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය
xii. සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව

# දෙවන පරිච්ඡේදය

# සුවිශේෂිතා

## 02. සුවිශේෂිතා

**2.1** තිරිඟු පිටි ගෘහස්ථ හා කාර්මික පරිභෝජනය සඳහා භාවිතා කරන ප්‍රධාන අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යයක් වන අතර වාර්ෂික අවශ්‍යතාවය මෙ.ටො 720,000 කි. මෙම අවශ්‍යතාවය ප්‍රධාන වශයෙන් මෙතෙක් සපයාගනු ලැබුවේ තිරිඟු ඇට ආනයනය කර දේශීයව අඹරා තිරිඟු පිටි සෑදීම තුළිනි. නමුත් 2022 වසරේදී තිරිඟු පිටි ලෙස සෘජුවම ආනයනය කිරීමේ අවස්ථා වැඩි කරන ලදී. ඒ අනුව, 2021 වසරේ තිරිඟු පිටි ආනයනය මෙ.ටො. 11,456 ට සාපේක්ෂව 2022 වර්ෂය තුළ තිරිඟු පිටි ආනයනය මෙ. ටොන් 233,902 ක ඓතිහාසික ඉහළම අගයක් වාර්තා කළේය. ඒ අනුව වෙළෙඳ පොළ තුළ තිරිඟු පිටි මිල පාරිභෝගිකයන්ට දැරිය හැකි මිලක් යටතේ පවත්වා ගැනීමට හැකි විය. 2023.09.30 දක්වා තිරිඟු පිටි මෙ.ටො. 140,170 ක් විය.

**2.2** රට තුළ පැවති ආර්ථික අර්බුදයෙන් මිදීම සඳහා ගෘහ ආර්ථිකය ශක්තිමත් කර සුරක්ෂිතතාවය තහවුරු කිරීමේ අරමුණින් අඩු ආදායම්ලාභීන් සඳහා පෝෂණ මට්ටම හා ආදායම ඉහළ නැංවීම තුළින් ජීවන වියදම කළමනාකරණය කිරීමේ එක් පියවරක් වශයෙන් වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය වෙත වෙන් කරන ලද ප්‍රතිපාදනවල ඉතිරිය භාවිතා කර ව්‍යවසායකින් ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහනක් හඳුන්වා දෙන ලදී. මේ යටතේ දරුවන්ගේ හා ගැබිණි මව්වරුන්ගේ පෝෂණ මට්ටම ඉහළ නැංවීමේ දීර්ඝ කාලීන පියවරක් වශයෙන් බිත්තර, මස් හා කිරි නිෂ්පාදන ඉහළ දැමීම සඳහා කුකුළු පැටව්, එළු පැටව් සහ ඌරු පැටව් බෙදා හැරීමට ද කටයුතු කරන ලදී. එමෙන්ම ස්වයං රැකියා සඳහා මූල ප්‍රාග්ධනය සපයා ගත නොහැකි විශේෂයෙන් කාන්තා ව්‍යවසායකයින් සඳහා සිය ව්‍යාපාර කටයුතුවලට අවශ්‍ය උපකරණ ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව හරහා අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ නිර්දේශය මත බෙදා හැරීමට කටයුතු කරන ලදී. මෙම වැඩසටහන මූලික වශයෙන් ගම්පහ දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කරන ලද අතර මෙම වසර තුළදීම පුත්තලම, මඩකලපුව හා කුරුණෑගල යන දිස්ත්‍රික්කවල ද පුළුල් කිරීමට සැලසුම් කර ඇත. මෙම වැඩසටහන සඳහා අමාත්‍යාංශය විසින් රුපියල් මිලියන 89.4 ක් වැය කර ඇත.

**2.3** වාණිජ විෂය ධාරාව හදාරන අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ සිසුන් වෙනුවෙන් ගරු අමාත්‍යතුමාගේ සංකල්පයක් පරිදි ආරම්භ කරන ලද "ආර්ථික හා වෙළෙඳ කටයුතු" පිළිබඳ වැඩමුළු මාලාවේ පළමුවැන්න තුඩැල්ල ක්‍රිස්තුරාජ විද්‍යාලයීය පාසල් පරිශ්‍රයේදී පැවැත්විණ.
මෙහිදී රටේ ආර්ථික සංවර්ධනය සඳහා අපනයනවල වැදගත්කම, නිදහස් වෙළෙඳ ගිවිසුම් සහ අනාගත සැලසුම්, පාරිභෝගිකයා ආරක්ෂා කිරීම සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ කාර්යභාරය, අපනයන සංවර්ධන මණ්ඩලයේ මූලික අපනයන ක්‍රියාවලිය, අපනයන වෙළෙඳපොළ හඳුන්වාදීම, අපනයන වෙළෙඳපොළට ඇතුල්වීම, නීතිමය අවශ්‍යතා සහ වෙළෙඳ අවස්ථා හා ශ්‍රී ලංකාවේ ආර්ථික, සමාජ හා පාරිසරික ස්ථායිතාව සඳහා ප්‍රතීතන මණ්ඩලයේ කාර්යභාරය සම්බන්ධයෙන් සිසුන් දැනුවත් කරන ලදී.

**2.4** 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 13 හා 32 වගන්ති යටතේ පැමිණිලි සඳහා පරීක්ෂණ පැවැත්වීමට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වෙත බලතල පවතී. තවද, පනතේ 2 (1) වගන්තිය හා පනතේ 3 වගන්තිය එක්ව කියවීමේදී ,පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය, අධිකාරියේ සාමාජිකයන් වන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු බවට සඳහන් වේ. ඒ අනුව, දැනට පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව අධිකාරියේ සභාපතිතුමන් සහ පූර්ණකාලීන සාමාජිකයන් විසින් 13 හා 32 වගන්ති යටතේ පැමිණිලි සඳහා පරීක්ෂණ පැවැත්වීම සහ ඊට අදාළ නියමයන් ලබාදීම සිදුකරනු ලැබේ.

**2.5** පාරිභෝගික පැමිණිලි සඳහා පරීක්ෂණ පැවැත්වීම කඩිනම් කිරීම කළ යුතුව ඇත. එබැවින් වෙළෙඳ වාණිජ හා ආහාර සුරක්ෂිතා අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද කැබිනට් පත්‍රිකාවක් මඟින් පාරිභෝගික පැමිණිලි විභාග කිරීමේ ක්‍රමවේදය දිස්ත්‍රික් ලේකම් කොට්ඨාස මට්ටමට විමධ්‍යගත කිරීමට සහ දිස්ත්‍රික් ලේකම්, නීති ආධාර කොමිෂන් සභාවේ නීති නිලධාරීන් සහ පාරිභෝගික අධිකාරියේ පොෂ්‍ය විමර්ශන නිලධාරීන්ගෙන් සමන්විත පරීක්ෂණ මණ්ඩලයක් පිහිටුවීමට යෝජනා කරන ලදී.

**2.6** දැනට මධ්‍යගතව පැවති පාරිභෝගික සේවා අධිකාරිය වෙත දීප ව්‍යාප්තව ලැබෙන පැමිණිලි විභාග කිරීමේ ක්‍රමවේදය අදාළ දිස්ත්‍රික් මට්ටමින් සිදු කිරීම සඳහා විමධ්‍යගත වැඩසටහන හඳුන්වා දීම තුලින් පාරිභෝගිකයාට පහසුවක් ලබා දීම.

**2.7 මහපොළ අධ්‍යාපන හා වෙළෙඳ ප්‍රදර්ශනය නැවත ආරම්භ කිරීම**

මහපොළ අරමුදල හා සංකල්පය ආරම්භ කල අවධියේ 1981/82 මහපොළ නිර්මාතෘ ගරු දිවංගත ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා විසින් අධ්‍යාපන හා වෙළෙඳ ප්‍රදර්ශනය ආරම්භ කළ අතර පසුව වර්ෂ 10ක පමණ කාලයක් එම ප්‍රදර්ශනය පැවැත්වීම නවතා තිබුණි. 2023 වර්ෂයේ සිට එම වෙළෙඳ ප්‍රදර්ශනය නැවත ආරම්භ කිරීමට භාරකාර මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර 2023 දෙසැම්බර් දෙවන සතියේ වෙළෙඳ ප්‍රදර්ශනය පැවැත්වීමට කටයුතු යොදා ඇත. මෙමඟින් මහපොළ අරමුදල ශක්තිමත් කිරීම සඳහා අතිරේක ආදායමක් උපයා ගැනීම අපේක්‍ෂා කෙරේ.

**2.8** දේශීය වෙළෙඳපොළට සැපයෙන පොල්තෙල් වල ගුණාත්මකභාවය හා වෙළෙඳපොළට සැපයෙන ඇසුරුම්කරණයෙන් තොර පොල්තෙල් වල ගුණාත්මක තත්ත්වය පරීක්ෂා කිරීම සම්බන්ධයෙන් පියවරක් ලෙස එම පොල්තෙල් වෙළෙඳපොළට නිකුත් කළ සමාගම කුමක්ද යන්න පිළිබඳ එම පොල්තෙල් අලෙවිකරුවන් විසින් සඳහන් කළ යුතු වන ආකාරයට පියවර ගැනීමට අවශ්‍ය ක්‍රමවේද සකස් කිරීමටත්, මෙම නිෂ්පාදන වෙළෙඳපොළට නිකුත් කිරීම පිළිබඳ පසුවිපරම් කිරීමට අවශ්‍ය විධිවිධාන සැලසීමටත්, ඒ අනුව කටයුතු කිරීමටත් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට උපදෙස් දෙන ලදී.

**2.9** වාණිජ දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක රාජ්‍ය දූත සේවාවන්වලදී අනෙකුත් රාජ්‍යයන්හි වෙළෙඳපොළ අවශ්‍යතා මොනවාද යන්න හඳුනාගත යුතු බවත් එක් එක් රාජ්‍යයන් සඳහා එකිනෙකට වෙනස් අපනයන උපාය මාර්ග භාවිතා කිරීම පිළිබඳවත්, තත්ත්වයෙන් උසස් නිෂ්පාදන මඟින් වෙළෙඳපොළ තරගකාරීත්වය ඇති කළ හැකි ආකාර පිළිබඳවත් ශ්‍රී ලංකා මෘදුකාංග සේවා ආයතන සංගමයේ (SLASSCOM) නියෝජිතයන් සමඟ සාකච්ඡාවක් පවත්වන ලදී. එහිදී තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය විශාල සම්භාවිතාවක් සහිත අංශයක් ලෙස රාජ්‍ය අංශය සමඟ වඩාත් සමීපව කටයුතු කිරීමේ වැදගත්කම සම්බන්ධයෙන්ද අදහස් ඉදිරිපත් කරනලදී. මෙම වැඩසටහන ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති අතර ඒ සඳහා වාණිජ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහභාගී විය.

**2.10** "සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව (සතොස) ප්‍රතිව්‍යුහගත කිරීම" යන මැයෙන් අමප අංක 23/1208/627/018 හා 2023.06.26 දිනැතිව ගරු වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2023.07.10 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී එළඹි තීරණය ප්‍රකාරව, එහි සියලු සේවකයින් 2023.09.30 දිනෙන් විශ්‍රාමගන්වා ඇත. එම අමාත්‍ය මණ්ඩල අනුමැතිය පරිදි පත් කරන ලද නිලධාරී කමිටුව විසින් සතොස සියලුම සේවකයින්ට සකස් කරන වන්දි සූත්‍රය පදනම් කරගෙන වන්දි ගෙවීම් සිදු කල

අතර සමුපකාර තොග වෙළෙඳ සංස්ථාවේ වගකීම් හා වත්කම් පිළිබඳව ගත යුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් නිර්දේශ ලබා ගැනීම සඳහා ඉහළ නිලධාරී කමිටුවක් පත් කර ඇත. ඒ අනුව කටයුතු සිදු වන තෙක් සතොස සතු වත්කම් කළමනාකරණ කටයුතු ලංකා සතොස සමාගමෙන් සිදු කර ගැනීමට පියවර ගෙන ඇත.

**2.11** "ජාතික සමුපකාර ව්‍යාපාරය හා සම්බන්ධ රේඛීය ආයතන ප්‍රතිව්‍යුහගත කිරීම" යන මැයෙන් අමප අංක 23/1626/627/020 හා 2023.08.24 දිනැතිව ගරු වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2023.10.23 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී ප්‍රතිපත්තිමය අනුමැතියක් ලබා දී ඇත. ඒ අනුව දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනතේ විධිවිධාන අනුව රේඛීය සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන ප්‍රාථමික සමුපකාර සමිතිවල ප්‍රධාන කාර්යාල පිහිටා ඇති ස්ථානය අයත්වන පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවල අධීක්ෂණය යටතට පත් කිරීමට, රේඛීය සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තුගත තනතුරුවල සේවයේ නියුතු නිලධාරීන් සීමිත පිරිසක් රඳවා ගෙන ඉතිරි අය ඔවුන්ගේ මනාපය පරිදි පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවලට මුදා හැරීමට, 1992 අංක 51 දරන සමුපකාර සේවක කොමිෂන් සභා (සංශෝධන) පනතේ විධිවිධාන අනුව ස්ථාපිත රේඛීය සමුපකාර සේවක කොමිෂන් සභාව ද අහෝසි කිරීමට සහ 2001 අංක 1 දරන ජාතික සමුපකාර සංවර්ධන ආයතනය (සංස්ථාගත කිරීමේ) පනතේ 3 වන වගන්තියේ සඳහන් ආයතනයේ බලතල ක්‍රියාත්මක කිරීම හා එහි 4 වන වගන්තියේ සඳහන් ආයතනයේ කර්තව්‍ය වඩාත් කාර්යක්ෂම කිරීම සඳහා එම ආයතනය කොළඹ 03, ගාලු පාරේ පිහිටි ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලයේ ප්‍රධාන ගොඩනැගිල්ලේ ස්ථානගත කර එහි කටයුතු ඒ ආකාරයෙන්ම පවත්වාගෙන යාමට කටයුතු සම්පාදනය කර ඇත.

**2.12 ආහාර සුරක්ෂිතතාව සපුරාලීම හරහා බිත්තර ආනයනය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම**

ආහාර සුරක්ෂිතතාව සපුරාලීම සඳහා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව හරහා බිත්තර ආනයනය කිරීමට අනුමැතිය ලැබ 2023.10.09 දින වන විට බිත්තර මිලියන 109.6 ආනයනය කර බෙදාහැර ඇත.

**2.13 විවෘත ගිණුම් යටතේ (Open Accounts Payment Term) අත්‍යවශ්‍ය ආහාර 10ක් ආනයනය කිරීම**

අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය හිඟයකින් තොරව පාරිභෝගික ජනතාවට සැපයීම සඳහා 2022.07.01 දින සිට විවෘත ගිණුම් යටතේ (Open Accounts Payment Term) අත්‍යවශ්‍ය ආහාර 10ක් ආනයනය කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලදී. ඒ අනුව ආනයනකරුවන් 1170 දෙනෙකු සඳහා ආහාර ද්‍රව්‍ය මෙ.ටොන් 411,375ක ප්‍රමාණයක් නිර්දේශ ඇත.

**2.14 ඉන්දීය ණය යෝජනා ක්‍රමය( Indian Credit Line) යටතේ අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය 15ක් ආනයනය කිරීම**

ඉන්දීය ණය යෝජනා ක්‍රමය( Indian Credit Line) යටතේ අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය 15ක් ආනයනය කිරීම සඳහා වෙන් කරන ලද ඇමරිකානු ඩොලර් මිලියන 200ක ණය පහසුකමට අමතරව තවත් ඇමරිකානු ඩොලර් මිලියන 100ක ණය පහසුකම් ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලදි. ඒ අනුව ආනයනකරුවන් **185** දෙනෙකු සඳහා ආහාර ද්‍රව්‍ය මෙ.ටොන් 350,588ක ප්‍රමාණයක් වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය විසින් නිර්දේශ කරන ලද අතර ඉන් මෙ.ටොන් 346,787ක ප්‍රමාණයක් සඳහා ඉන්දීය මහකොමසාරිස් කාර්යාලය විසින් අනුමැතිය ලබා දී ඇත.

**2.15 උෂ්ණත්වය පාලිත ගබඩාවේ වැඩ නැවත ආරම්භ කිරීම**

ඉන්දීය රජය සහ ශ්‍රී ලංකා මධ්‍යම රජයේ සහයෝගීතාවය ඇතිව දඹුල්ල ප්‍රදේශයේ ඉදිකිරීම් කටයුතු සිදු කෙරෙමින් පවතින නැවුම් එළවළු හා පළතුරු ගබඩා කිරීම සඳහා උෂ්ණත්වය හා ආර්ද්‍රතාවය පාලනය කරන ලද මෙට්‍රික් ටොන් 5000 ක ධාරිතාවයෙන් යුතු ගබඩා සංකීර්ණයේ වැඩ කටයුතු 2023 වසරේදී නැවතත් ආරම්භ කරන ලදී.

**2.16 විදේශයන් මඟින් ලැබුණු ආහාර සහනාධාර බෙදාහැරීමේ**

2020 වසර මුල් භාගයේදී ඇරඹි කොවිඩ් 19 වසංගත තත්ත්වයේ බලපෑම 2022 වසරේදීද පැවති අතරම රට තුළ හටගත් ආර්ථික දුෂ්කරතාවලින් බලපෑමට පත් පවුල් වෙත ලබා දීම සඳහා විදේශයන් මඟින් ලැබුණු ආහාර සහනාධාර ශ්‍රී ලංකා රජය වෙනුවෙන් භාරගෙන වරායෙන් නිශ්කාෂණය කර බෙදාහැරීමේ කටයුතු 2023 වසරේදී ද ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී. ඒ අනුව තායිලන්තය සහ තායිවානය යන රටවලින් ලැබුණු සහල්, සීනි, පරිප්පු ඇතුලු ආහාර ද්‍රව්‍ය ශ්‍රී ලංකා රජය වෙනුවෙන් භාරගෙන වරායෙන් නිෂ්කාශණය කර නියමිත පරිදි බෙදා හැරීමේ කටයුතු සිදු කරන ලදී. තව ද ලෝක ආහාර වැඩසටහන යටතේ ජනාධිපති කාර්යාලය වෙත ලැබුණු සහනාධාර බෙදාහැරීමේ කටයුතු ද 2023 වසරේ දීද සිදු කර ඇත.

**2.17 ලංකා සතොස සමාගමේ මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා අභ්‍යන්තර ක්‍රියාවන් රාශියක් හඳුන්වාදීම තුළින් 2023 ජනවාරි සිට මෙහෙයුම් ලාභය වැඩිකර ගැනීමත් ජූලි මාසයේ සිට ශුද්ධ ලාභය වැඩිකර ගැනීමටත් ලංකා සතොස සමාගම සමත් වී ඇත**

2023 ජනවාරි සිට ජුනි දක්වා අලාභය රු. මි. 51 ක් වූ ලංකා සතොස සැප්තැම්බර් වන විට ශුද්ධ ලාභය රු. මි. 61 ක් දක්වා වර්ධනය කර ඇත.

**2.18 මැඩ්රිඩ් සන්ධාන පත්‍රයට ප්‍රවේශ වීම සඳහා මූලික කාර්යයන් අවසන් කිරීම**

දේශීය වෙළෙඳ ලකුණු ජාත්‍යන්තර ව ලියාපදිංචි කිරීමේ පහසුකම් සපයනු ලබන ලෝක බුද්ධිමය දේපළ සංවිධානය මඟින් පරිපාලනය කරනු ලබන මැඩ්රිඩ් සන්ධාන පත්‍රය වෙත ප්‍රවේශ වීම සඳහා බුද්ධිමය දේපළ පනතට අවශ්‍ය සංශෝධන කටයුතු සිදු කරමින් පවතී.

එම කෙටුම්පත සඳහා බුද්ධිමය දේපළ සංවිධානයේ උපදේශකවරුන්ගේ නිරීක්ෂණ ලැබී ඇති අතර, එම නිරීක්ෂණ හා බුද්ධිමය දේපළ කාර්යාලයේ නිරීක්ෂණ සමග නීති කෙටුම්පත් සම්පාදකගේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර ජාත්‍යන්තරව වෙළෙඳ ලකුණු ලියාපදිංචි කළ හැකි පහසු මාර්ගයක් ස්ථාපනය කරමින්, බුද්ධිමය දේපළ පනත සංශෝධනය, 2023 දෙසැම්බර් මසට පෙර අනුමැති සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වේ.

**2.19 භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීම සඳහා පහසුකම් සැපයීම**

ද්‍රව්‍යයක හෝ නිෂ්පාදිතයක සම්භවය කිසියම් නිශ්චිත භූගෝලීය ප්‍රදේශයක බවත් එහි විශේෂ ගුණාංග, ගති ලක්ෂණ හා කීර්තිනාමයක් එම භූගෝලීය සම්භවයේ හේතුවෙන් ඇතිවී ඇති බැව් පාරිභෝගිකයන්ට හා වෙළෙඳුන්ට පෙන්නුම් කිරීම සඳහා භූගෝලීය දර්ශක භාවිතා කරනු ලැබේ. ශ්‍රී ලංකාව තුළ භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීමේ විශේෂ ක්‍රමවේදයක් මෙතෙක් නොතිබුණු අතර, වෙළෙඳ ලකුණු යටතේ සහතික ලකුණක් ලෙස ලියාපදිංචි කිරීම පමණක් සිදු කර තිබේ.

භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීම මඟින් ලංකා තේ, ලංකා කුරුඳු ආදී භූගෝලීයව වැදගත්කම් දරණ ශ්‍රී ලංකා නිෂ්පාදන සඳහා පුළුල් විදේශීය වෙළෙඳපළක් ඇති කර ගැනීමට අපේක්ෂිත ය.

2022 වර්ෂයේ මුල් භාගයේදී බුද්ධිමය දේපළ පනත සඳහා 2022 අංක 08 දරන සංශෝධනය සිදු කරන ලදි. එම නීතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය රෙගුලාසි සකස් කර නීති කෙටුම්පත් සම්පාදකගේ අනුමැතිය ලබා ගැනීම සඳහා යොමු කිරීමට මෙම වසර තුළ දී හැකි විය. ඒ අනුව අවසන් කාර්තුව තුළ භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීම ආරම්භ කිරීමට සඳහා වන රෙගුලාසි පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට නියමිත ය.

**2.20 බුද්ධිමය දේපළ විෂය පිළිබඳ මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම**

බුද්ධිමය දේපළ හා එහි භාවිතය පිළිබඳව මහජනතාව හා අදාළ පාර්ශව දැනුවත් කිරීම සඳහා බුද්ධිමය දේපළ කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන්ගේ සම්පත් දායකත්වයෙන් ගුවන් විදුලි වැඩසටහන් හා භෞතික/මාර්ගගත දැනුවත් කිරීමේ වැඩසටහන් පහක් පැවැත්වීමට මෙම වසර තුළ හැකි විය. ඊට අමතරව, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සම්බන්ධීකරණය කරගනිමින් මාර්ගගතව දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවේ වැඩසටහන් හතක් මෙම වසර තුළ පවත්වා ඇත.

**2.21** සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් චීන ආධාර යටතේ පාසල් සිසුන්හට සහල් බෙදා හැරීමේ වැඩසටහන - පළමු අදියර යටතේ සහල් මෙ.ටො 5000 ක් ද දෙවන අදියර යටතේ සහල් මෙ.ටො 5800 ද බෙදා හැරීම් කර ඇත.

**2.22** සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2023 වර්ෂය සඳහා පාසල් සිසුන්ගේ නිල ඇඳුම් අවශ්‍යතාවයෙන් 70% ක් චීන රජයේ ප්‍රදානයක් ලෙස ලැබූ අතර එම නිල ඇඳුම් තොග වරාය නිෂ්කාශන කටයුතුවලින් පසුව ආරක්ෂාකාරී ලෙස ගබඩා කර, කොට්ඨාස අධ්‍යාපන කාර්යාල වෙත ප්‍රවාහනය කර භාර දීමේ කටයුතු මෙම දෙපාර්තමේන්තුව විසින් සිදු කර ඇත.

**2.23** සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ලෝක ආහාර වැඩසටහන යටතේ පාසල් වෙත සහල් පළමු, දෙවන හා තෙවන අදියර ලෙස සියලු පලාත් වෙත බෙදා හැරීම් කටයුතු සිදුකරන ලදී.

**2.24** 2023 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා පාරිභෝගික සේවා අධිකාරිය විසින් පාරිභෝගිකයන් දැනුවත් කිරීම් 255 ක් ද, වෙළෙඳ දැනුවත් කිරීම 41 ක් ද, පාසැල් දැනුවත් කිරීම් 93 ක් ද, ප්‍රදර්ශන 7 ක් ද, ජංගම දැනුවත් කිරීම් (වෙළෙඳ සහ මහජන) 393ක් ද, විශේෂ දැනුවත් කිරීම් 20 ක් ද සිදු කර ඇත.

**2.25** දිස්ත්‍රික් මට්ටමින් දැනට සිදුකරන විවිධ නිෂ්පාදනයන් හා සේවා අපනයන වෙළෙඳපොළ වෙත යොමු කිරීම සඳහා වාණිජ දෙපාර්තමේන්තුව විසින් දිස්ත්‍රික් මට්ටමින්, නිෂ්පාදකයින්, ව්‍යවසායකයින්, නව නිපැයුම්කරුවන් දැනුවත් කිරීම සඳහා වැඩමුළු පැවැත්වීමට කටයුතු කිරීම.

**2.26** ගම්පහ හා කොළඹ දිස්ත්‍රිකයන්හි ඇතැම් නිෂ්පාදකයන් චීනයේ පැවති වෙළෙඳ ප්‍රදර්ශන වෙත යොමු කරන ලදී.

# තෙවන පරිච්ඡේදය

# 2023 - ප්‍රගතිය

# 03. 2023 වසරේ ප්‍රගතිය ( 2023.01.01 සිට 2023.09.30 දක්වා)

## 3.1. වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය

### i. 2023.09.30 දක්වා මූල්‍ය ප්‍රගතිය

*වගු අංකය **3. 1** වෙළෙඳ වාණිජ හා ආහාර සුරන්ෂිතතා අමාත්‍යාංශයේ ප්‍රගතිය*

| වියදම් විස්තර | 2023 වර්ෂය සඳහා සංශෝධිත ප්‍රතිපාදන (රු.මි.) | 2023.09.30 දක්වා මූල්‍ය ප්‍රගතිය | |
|---|---|---|---|
| | | (රු.මි.) | % |
| පුනරාවර්තන වියදම් | 1,094.3 | 632.16 | 57.77 |
| ප්‍රාග්ධනය වියදම් | 22.2 | 4.13 | 18.62 |
| ප්‍රාග්ධනය ව්‍යාපෘති | 3,943 | 2,899.47 | 73.53 |

මූලාශ්‍රය- වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය

### ii. ජාතික වෙළෙඳ ප්‍රතිපත්තිය සකස් කිරීමේ කාර්යයේ ප්‍රගතිය

අභ්‍යන්තර හා ජාත්‍යන්තර වෙළෙඳ කටයුතු ක්‍රමානුකූලව හා විධිමත්ව සිදු කිරීම පාදක කර ගනිමින් සැකසුණු සහ ආර්ථික ප්‍රතිපත්ති රාමුවෙහි වෙළෙඳ හා ආයෝජන ක්ෂේත්‍ර කෙරෙහි ඉහළ ප්‍රමුඛතාවයක් ලබා දී ඇති පසුබිමක් යටතේ වඩාත් පැහැදිලි දැක්මක් සහිතව වෙළෙඳාම හා සම්බන්ධ තීරණ ගැනීමේ ක්‍රියාවලියට මගපෙන්වීම සඳහා ජාතික වෙළෙඳ ප්‍රතිපත්තියක් සකස් කිරීමේ කාර්යය 2023 මාර්තු මසදී නැවත ආරම්භ කරන ලදී.

- 2017 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය සහිත ජාතික වෙළෙඳ ප්‍රතිපත්තිය පාදක කර ගනිමින් 2048 වර්ෂය ඉලක්ක කරගනිමින් සකස් කරනු ලබන ජාතික වෙළෙඳ ප්‍රතිපත්තියේ පළමු කෙටුම්පත සකස් කිරීම.

- ගරු වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගේ උපදෙස් පරිදි 2048 වර්ෂය ඉලක්ක කරගනිමින් සකස් කරනු ලබන ජාතික වෙළෙඳ ප්‍රතිපත්තිය සමාලෝචනය කිරීම සඳහා නව කමිටුවක් පත් කිරීම.

- 2023.08.11 දින වන විට සමාලෝචන කමිටුව වෙතින් ලබාදෙන ලද අදහස් පාදක කර ගනිමින් ජාතික වෙළෙඳ ප්‍රතිපත්තියේ දෙවන කෙටුම්පත සකස් කිරීම.

- ජාතික වෙළෙඳ ප්‍රතිපත්තියේ දෙවන කෙටුම්පත ජනාධිපති කාර්යාලයේ ජාත්‍යන්තර වෙළෙඳ අංශය වෙත යොමු කර ඇත. එහිදී ලැබෙන අදහස් හා යෝජනා පදනම් කර ගනිමින් සංස්කරණය කරන ලද නව කෙටුම්පත ජාතික ක්‍රමසම්පාදන කමිටුව වෙත යැවීමටත් ඉන්පසුව එම කමිටුවේ අදහස් පදනම් කර ගනිමින් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට පියවර ගැනීමට අපේක්ෂිතය.

**iii. විදේශීය පුහුණු පාඨමාලා සඳහා අමාත්‍යාංශයේ සහ ඒ යටතේ පවතින ආයතනවල නිලධාරීන් යොමු කිරීම**

*වගු අංකය 3. 2 විදේශීය පුහුණු පාඨමාලා සඳහා නිලධාරීන් යොමු කිරීම*

| අනු අංකය | පුහුණු පාඨමාලාවේ නම | ප්‍රදායක ආයතනය/ රට | සහභාගී වූ නිලධාරීන් ගණන |
|---|---|---|---|
| 01 | First Trade Facilitation Capacity Building Programme, 07-23 May 2023 | BIMSTEC Secretariat, Dhaka | 01 |
| 02 | SCP: Public Private Partnerships: Infrastructure Projects Development From 06-10 March 2023 (E-Learning) | Singapore Cooperation Programme | 01 |
| 03 | Seminar on Negotiation Capacity Building of Free Trade Agreement for Sri Lanka from 17 to 30 May 2023 – China – In person | Shandong Foreign Trade Vocational College, China | 05 |
| 04 | Seminar on Cross border E-commerce for Sri Lanka from 07 to 20 August 2023 – China – In person | Free Trade Development Board of Zhejiang Province, China | 03 |
| 05 | Sixth Session of the Multi-year Expert Meeting on Enhancing the Enabling Economic Environment at All Levels in Support of Inclusive and Sustainable Development and the Promotion of Economic Integration and Cooperation Geneva, 30-31 October 2023 | United Nations Conference on Trade and Development | 01 |
| 06 | Seminar on International Management Capability of Enterprises for Developing Countries, 12 October 01 November 2023 | Shanghai Business School, China | 01 |

මූලාශ්‍රය- වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය

**iv.** මුදල් අමාත්‍යාංශයේ හා ජාතික විගණන කාර්යාලයේ සමාජිකයන්ගේ සහභාගිත්වයෙන් විගණන කළමනාකරන රැස්වීම් 3ක් පවත්වා අමාත්‍යාංශය හා අනුබද්ධ ආයතන වෙත අවශ්‍ය මඟ පෙන්වීම් සිදුකර ඇත.

**3.2. ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව**

**i. සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් නගා සිටුවීම සඳහා ප්‍රතිපාදන ලබා දීම**

සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් නගා සිටුවීම සඳහා ඉදිරිපත් කරන ලද අංක 20/0722/218/010 දරණ 2020.04.14 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට ලැබුණු අමාත්‍ය මණ්ඩල තීරණය අනුව 2023 වසරේදීද රුපියල් මිලියන 50 ක ප්‍රතිපාදන ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව වෙත ලැබුණු අතර ඉන් රුපියල් මිලියන 20ක් සී/ස ගම්පහ දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයන්ගේ සමූපකාර සමිතිය වෙතද රුපියල් මිලියන 05 ක් සී/ස රත්නපුර දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයන්ගේ සමූපකාර සමිතිය වෙතද මාස හයක ගිවිසුම් කාලයක් යටතේ ලබා දෙන ලදි.

**ii. උෂ්ණත්වය පාලිත ගබඩාවේ ඉදිකිරීම් නැවත ආරම්භ කිරීම**

2023.09.19 දින සිට මෙම ව්‍යාපෘතියේ සංවර්ධන කටයුතු නැවත ආරම්භ කර ඇති අතර එහි මේ වන විට බිම් සැකසීම් සිදු කරන අතර රැහැන් ඇදීමේ (Wiring ) කටයුතු 90% ක් අවසන් වී ඇත. යන්ත්‍ර සවි කිරීමේ කටයුතු 80% ක ප්‍රමාණයක් නිම කර ඇති අතර ඉදිකිරීමේ සමස්ත භෞතික ප්‍රගතිය 70% කි.

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පෙර සිසිලනය හා පසු උණුසුම් පහසුකම් (Pre cooling and Post heating ) සම්පූර්ණ කිරීම සඳහා අමතර ප්‍රතිපාදන වන රු.38,607,975.00 මුදලක් ලබා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත.

## 3.3. මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව

### i. ආදායම් උත්පාදන ව්‍යාපෘති/ක්‍රියාකාරකම්

*වගු අංකය 3. 3 මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ ආදායම් උත්පාදන ව්‍යාපෘති/ක්‍රියාකාරකම්*

| මාසය | අංකශෝධන ආදායම (රු.මි.) | මාදිලි අනුමැති ආදායම (රු.මි.) | සත්‍යායන ආදායම (රු.මි.) |
|---|---|---|---|
| ජනවාරි | 1.23 | 0.21 | 32.22 |
| පෙබරවාරි | 0.34 | 0.18 | 39.01 |
| මාර්තු | 0.57 | 0.12 | 41.90 |
| අප්‍රේල් | 0.20 | 0.12 | 21.01 |
| මැයි | 0.53 | 0.11 | 31.65 |
| ජූනි | 0.44 | 0.21 | 28.24 |
| ජූලි | 0.78 | 0.04 | 28.94 |
| අගෝස්තු | 0.35 | 0.04 | 29.09 |
| **එකතුව** | **4.44** | **1.03** | **252.06** |

මූලාශ්‍රය: මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව

### ii. ආයතනයේ ප්‍රගතිය

*වගු අංකය 3. 4 මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය*

| ආදායම් මාර්ග | | භෞතික ප්‍රගතිය | | ආදායම (රු. මි.) | |
|---|---|---|---|---|---|
| අංකශෝධනය | | ඉලක්ක | ඉටුකළ ප්‍රමාණය | ඉලක්ක | සත්‍ය ආදායම |
| 01 | ජාතික මිනුම් පර්යේෂණාගාරය මඟින් සිදුකරනු ලැබූ අංකශෝධන ප්‍රමාණයන් | 1000 | 914 | 2.96 | **4.44** |
| ලියාපදිංචි සහතික නිකුත් කිරීම | | | | | |
| 02 | ලියාපදිංචි සහතික නිකුත්කල ප්‍රමාණය (අලුත්වැඩියා කිරීම, ආනයනය කර විකිණීම, නිෂ්පාදනය කර විකිණීම සහ විකිණීම) | 400 | 120 | 0.96 | 0.38 |
| මාදිලි අනුමැතිය | | | | | |
| 03 | මාදිලි අනුමැතිය ලබාදුන් ප්‍රමාණය | 40 | 20 | 0.32 | 1.03 |
| සත්‍යායන වැඩසටහන් | | | | | |
| 05 | සත්‍යායනය කරන ලද කිරුම් හා මිනුම් උපකරණ ප්‍රමාණය | 400,000 | 280,631 | 297.00 | 252.06 |
| වැටලීම් | | | | | |
| 06 | වැටලීම් කරන ලද ප්‍රමාණය | 110,64 | 19,151 | - | **-** |
| 08 | සිදුකරන ලද දැනුවත් කිරීම් වැඩසටහන් ප්‍රමාණය | 600 | 612 | - | **-** |
| | **එකතුව** | **413,104** | **301,448** | **301.24** | **257.91** |

මූලාශ්‍රය: මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව

**iii. ශ්‍රී ලංකාවේ ජාතික මිනුම් විද්‍යාගාරය සඳහා ජාත්‍යන්තර පිළිගැනීම ලබා ගැනීම**

- Physikalish Technische Bundesnstalt (PTB) - ශ්‍රී ලංකා ද්විපාර්ශවික ව්‍යාපෘතිය ජාතික තත්ත්ව යටිතල පහසුකම් සංවර්ධනය කිරිම - දෙවන අදියර
  Strengthening quality infrastructures in Sri Lanka.

- Physikalish Technische Bundesnstalt (PTB) ශ්‍රී ලංකා ද්විපාර්ශවික ව්‍යාපෘතියේ දෙවන අදියර මඟින් ශ්‍රී ලංකාවේ ජාතික තත්ත්ව යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සිදුකරනු ලබයි. මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව මෙම ව්‍යාපෘතියේ ජාතික මට්ටමේ ප්‍රධාන ව්‍යාපෘති හවුල් පාර්ශවයක් ලෙසට කටයුතු කරනු ලබයි. ජාතික මිනුම් විද්‍යාගාරය සඳහා පුහුණු උපදේශන සේවා සහ මිනුම් කටයුතු සංවර්ධනය සඳහා මෙම ව්‍යාපෘතියෙන් ප්‍රතිලාභ හිමි වේ.

- UNIDO – කෘෂි ආහාර අංශයේ සංවර්ධනය සඳහා ප්‍රමිති මත පදනම් වූ ප්‍රමුඛ භාවිතයන් ප්‍රවාහය කිරිම.
  Main streaming Standard based best practice for agro-food for Sector Development.

- UNIDO සංවිධානයේ නව ව්‍යාපෘතිය මඟින් ශ්‍රී ලංකාවේ ආහාර සුකරක්ෂිතතාවය සහ ආරක්ෂාව ශක්තිමත් කිරිම සඳහා ගුණාත්මක යටිතල පහසුකම් සපයමින් කටයුතු කරයි. මෙම ව්‍යාපෘතියේ ද මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව ප්‍රධාන ව්‍යාපෘති හවුල්කරුවෙකු ලෙසට කටයුතු කරනු ලබයි. මෙම ව්‍යාපෘතිය මඟින් පුහුණු, උපදේශන සේවා, මිනුම් සංවර්ධන හා විදේශ ආධාර ලෙස මිනුම් විද්‍යාගාරය සඳහා උපකරණ ලබා දෙනු ලැබේ.

*වගු අංකය 3. 5 මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ මිනුම් විද්‍යාගාර අන්තර් සංසන්දනය*

| විද්‍යාගාරය | මිනුම් | අන්තර් සංසන්දනය |
|---|---|---|
| ස්කන්ධමිතික විද්‍යාගාරය | ස්කන්ධය පිළිබඳ මිනුම් (Class F1) | **PTB** ව්‍යාපෘතිය යටතේ ක්‍රමාංකන විද්‍යාගාර සඳහා වූ අන්තර් සංසන්දනයක් සඳහා තාක්ෂණික සහයෝගය දැක්වීම. |
| පීඩනමිතික විද්‍යාගාරය | ද්‍රව පීඩනය (**700** bar) | **PTB** - ශ්‍රී ලංකා ව්‍යාපෘතියේ අනුග්‍රහය යටතේ මධ්‍යම හා දකුණු ආසියානු කලාපයේ පිහිටි ජාතික මිනුම් විද්‍යා ආයතනය (NMI) සමඟ පවත්වනු ලබන අන්තර් සංසන්දනය සඳහා නියමු විද්‍යාගාරය ලෙස ක්‍රියා කිරීම හා අදාළ නිර්දේශ අගයන් (reference value) සැපයීම. නේපාලය, උස්බෙකිස්තානය, කිර්කිස්තානය සහ මොන්ගෝලියාව යන රටවල් සහභාගි වේ. |
| පරිමාමිතික විද්‍යාගාරය | පරිමාමිතික උපකරණ ( 100 **ml** හා 20 **L** ) | ආසියා ශාන්තිකර මිනුම් විද්‍යා වැඩසටහනේ අන්තර් සංසන්දනයක් : APMP-M-FF-K 4.1-2022 |

මූලාශ්‍රය: මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව

## 3.4. වාණිජ දෙපාර්තමේන්තුව

i. **ජාතික වෙළෙඳ පහසුකම් කමිටු (NTFC) රැස්වීම් සම්බන්ධීකරණය සහ සහභාගීත්වය සහ ශ්‍රී ලංකාවේ වෙළෙඳ පහසුකම් ගිවිසුම (TFA) ක්‍රියාත්මක කිරීමට දායක වීම**

- පළමු කාර්තුමය රැස්වීම 2023 මාර්තු 10 වන දින පවත්වන ලද අතර දෙවන කාර්තුමය රැස්වීම 2023 ජූනි 15 වන දින NTFC හි සාමාජිකයින් 16 දෙනාගේම සහභාගීත්වයෙන් පැවැත්විණි.

- අවශ්‍ය තාක්ෂණික සහාය සහ ධාරිතා ගොඩනැගීමේ වැඩසටහන් සඳහා TFA ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වෙතින් යෝජනා 20ක් එකතු කර ඒවා දායක ආයතන සමඟ බෙදා ගන්නා ලදී.
- ශ්‍රී ලංකාව තුළ TFA කඩිනම්ව ක්‍රියාත්මක කිරීමට වැඩි පරිත්‍යාගශීලීන්ගේ සහාය ලබා ගැනීම සඳහා ලෝක බැංකුව (WB) සහ ජාත්‍යන්තර වෙළෙඳ මධ්‍යස්ථානය (ITC) සමඟ රැස්වීම් පැවැත්වීය.

- 2023 ජූනි 07 වැනි දින ජනාධිපති ලේකම් කාර්යාලයේ පැවති රැස්වීමේදී ජනාධිපති ලේකම්වරයාගේ උපදෙස් පරිදි මුදල් අමාත්‍යාංශය යටතේ NTFC ගැසට් කිරීමට සහ NTFC ලේකම් කාර්යාලයේ සංයුතිය ප්‍රතිව්‍යුහගත කිරීමට කටයුතු කිරීම.

ii. **ජාතික වෙළෙඳ පහසුකම් කමිටු (NTFC) ලේකම් කාර්යාලය සඳහා ප්‍රගති වාර්තා කිරීමේ මෙවලම**

- මෘදුකාංගය (Progress reporting Tool) ITC සහ GIZ සංවිධානයේ සහාය ඇතිව සංවර්ධනය කර 2022 අගෝස්තු 08 දින දියත් කරන ලදී.

- සියලුම TFA ක්‍රියාත්මක කරන ආයතනවලට ඔවුන්ගේ ප්‍රගතිය මෙවලමට ඇතුලත් කිරීම (Upload) කරන්නේ කෙසේද යන්න පිළිබඳව පුහුණුව ලබා දෙන ලදී.

- TFA කමිටු රැස්වීමේදීද මෙම මෙවලම ලෝක වෙළෙඳ සංවිධානය (WTO) වෙත හඳුන්වා දෙන ලදී

- මෙම මෙවලම NTFC හි අනාගත ක්‍රියාකාරකම් වලට අදාළ සියලුම දත්ත සඳහා ප්‍රධාන ගබඩාව ලෙස භාවිතා කරනු ඇත.

iii. **A & B කාණ්ඩය යටතේ නම් කරන ලද පොරොත්තු TFA විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා NTFC සමඟ සම්බන්ධීකරණය කිරීම සහ 2023/2024 තුළ ක්‍රියාත්මක කිරීමේ කාල සීමාවන් වැටෙන C කාණ්ඩය යටතේ නම් කර ඇති TFA ප්‍රතිපාදන[1]**

- තාක්ෂණික සහාය ලැයිස්තුවේ තවදුරටත් සහාය අවශ්‍ය ප්‍රමාද වූ ක්‍රියාමාර්ග ඉස්මතු කර පරිත්‍යාගශීලීන් සමඟ බෙදා ගන්නා ලදී.

- NTFC වෙනුවෙන්, ලෝක බැංකුව (WB) 2023 සැප්තැම්බර් 20 සහ 21 යන දිනවල TFA හි ක්‍රියාත්මක කරන ආයතන හතරක් සඳහා සම්බන්ධීකරණ අවදානම් කළමනාකරණය, වැඩිදියුණු කළ පාලනයන් සහ පරීක්ෂණ සහ අනුකූලතා පරීක්ෂණ ක්‍රියා පටිපාටි පිළිබඳ තාක්ෂණික ධාරිතාව ගොඩනැගීමේ සැසියක් සංවිධානය කරන ලදී.

---

[1] 2017 වෙළෙඳ පහසුකරණ ගිවිසුමේ සපුරාලිය යුතු ප්‍රතිපාදන (Provision) A,B,C යනුවෙන් කාණ්ඩ 3ට වර්ග කෙරේ.
A :- 20017 වසරේදී ශ්‍රී ලකාව විසින් මෙම ගිවිසුමට අත්සන් කරන විටදී සපුරා තිබූ ප්‍රතිපාදන (Provision).
B :- ඉදිරි වර්ෂවල සපුරාලීමට අපේක්ෂිත ප්‍රතිපාදන (Provision).
C :- එක් එක් ප්‍රතිපාදන (Provision) සපුරාලීමට නියමිත දිනය.

- NTFC ලේකම් කාර්යාලයේ ප්‍රධානියා ලෝක වෙළෙඳ සංවිධානය (WTO) හි පැවති වාර්ෂික TFA රැස්වීමට සහභාගී වූ අතර ලෝක වෙළෙඳ සංවිධානය (WTO) වෙතින් පරිත්‍යාගශීලීන්ගේ සහාය ලබා ගැනීමේ අරමුණින් C කාණ්ඩයේ කැපවීම් සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය පරිත්‍යාගශීලීන් සමඟ කටයුතු කිරීම.

iv. **ලෝක වෙළෙඳ සංවිධානය (WTO) විශේෂඥයින්ගේ සහභාගීත්වයෙන් ජාතික වැඩමුළු සංවිධානය කිරීම**

- 2023 වසර සඳහා ශ්‍රී ලංකාව සඳහා සුදුසු වැඩමුළු ලෝක වෙළෙඳ සංවිධානය (WTO) විශේෂඥයින්ගේ සහභාගීත්වයෙන් සංවිධානය කිරීම සඳහා කටයුතු කරමින් පවතී.

v. **දකුණු ආසියානු වරණීය වෙළෙඳ ගිවිසුම / දකුණු ආසියානු කලාපීය නිදහස් වෙළෙඳ ගිවිසුම (SAPTA/SAFTA )**

- **දකුණු ආසියානු වරණීය වෙළෙඳ ගිවිසුම (SAPTA)**

2023 වසරේ පළමු මාස හය තුළ SAPTA යටතේ ශ්‍රී ලංකාවේ අපනයන ඇමෙරිකානු ඩොලර් මිලියන 0.60 ක් ලෙස වාර්තා වී ඇත. SAPTA යටතේ අපනයනය කරන ලද ප්‍රධාන භාණ්ඩ වූයේ 2023 ජනවාරි සිට ජූනි දක්වා කාලය තුළ ඝන රබර් හැර අනෙකුත් වල්කනයිස් කරන ලද රබර් භාණ්ඩ ය. 2022 දී ඩොලර් මිලියන 0.26 ක් වූ අතර එය මේ වසරේ පළමු මාස හය තුළ ඇමරිකානු ඩොලර් 0.10 ක් පමණ විය.

- **දකුණු ආසියානු කලාපීය නිදහස් වෙළෙඳ ගිවිසුම (SAFTA)**

ශ්‍රී ලංකාව 2012.12.31 දින සිට ක්‍රියාත්මක වන පරිදි අදියර II යටතේ අදියර වශයෙන් එකඟ වූ තීරුබදු මත රේගු ආනයන බදු (CID) අඩු කරමින් වාරික 6න් 5ක් දැනටමත් ක්‍රියාත්මක කර ඇත. 2018.12.31 වන විට ශ්‍රී ලංකාව එය සම්පූර්ණ කිරීමට නියමිතව තිබුණද, SAFTA වෙළෙඳ ලිබරලිකරණ වැඩසටහන (TLP) හි II අදියර ශ්‍රී ලංකාවට අවසන් කිරීමට නොහැකි වූයේ එය සමාලෝචනය කිරීමට රජය ගත් තීරණයක් හේතුවෙන් වන අතර මේ පිළිබඳව ශ්‍රී ලංකාවේ මුදල් අමාත්‍යාංශය සමඟ පසු විපරම් කර ඇත. මෙම ක්‍රියාවලිය තවමත් සිදු වෙමින් පවතී.

ශ්‍රී ලංකාව හැර අනෙකුත් සියලුම සාමාජික රටවල් ඔවුන්ගේ සංවේදී ලැයිස්තු 20% කින් අඩු කිරීමට එකඟ වී ඇති අතර, ශ්‍රී ලංකාව SAFTA වෙළෙඳ ලිබරලිකරණ වැඩසටහන (TLP) හි III අදියර යටතේ 10% ක අඩු කිරීමකට පමණක් එකඟ වී ඇත. පාර්ශ්වකරුවන් සමඟ කරන ලද උපදේශන මත පදනම්ව, වාණිජ දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවට සිය 10% අඩු කිරීමේ කැපවීම සපුරාලීම සඳහා අවශ්‍ය තීරුබදු රේඛා සංඛ්‍යාව හඳුනා ගන්නා ලෙස මුදල් අමාත්‍යාංශයෙන් ඉල්ලා ඇති අතර එම කාරණය මුදල් අමාත්‍යාංශය සමඟ පසු විපරම් කර ඇත.

SAFTA යටතේ ශ්‍රී ලංකාවේ වෙළඳාම නොවැදගත්ය; සාර්ක් කලාපයේ ප්‍රධාන වෙළෙඳ හවුල්කරුවන් වන ඉන්දියාව සහ පකිස්ථානය සමඟ වෙළෙඳ ගිවිසුම් දෙක යටතේ වෙළඳාම වැඩි වශයෙන් උත්පාදනය වේ. SAFTA යටතේ ශ්‍රී ලංකාවේ අපනයන 2023 මුල් මාස හය තුළ ඇමෙරිකානු ඩොලර් 29.69ක් ලෙස වාර්තා විය. SAFTA තීරුබදු ප්‍රතිලාභ භුක්ති විඳින ප්‍රධාන

අපනයන භාණ්ඩ අතර ගම්මිරිස්, වියළි පොල්, සාදික්කා, ඇලුමිනියම් බහාලුම් ආදිය ඇතුළත් වේ. SAFTA යටතේ ශ්‍රී ලංකාවේ ආනයනය ඇ.ඩො. 2023 ජනවාරි සිට ජුනි දක්වා කාලය තුළ මිලියන 2.59 කි.

vi. **ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම (ISFTA) යටතේ තීරුබදු අනුපාත කෝටා සහතික (TRQC) නිකුත් කිරීම**

*වගු අංකය 3. 6 ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම (ISFTA) යටතේ තීරුබදු අනුපාත කෝටා සහතික (TRQC) නිකුත් කිරීම*

| මාසය | ලියාපදිංචි සමාගම්වලින් සිදුකරන ලද ඉල්ලීම් ගණන | නිකුත් කරන ලද සහතිකපත්‍ර සංඛ්‍යාව | නිකුත් කරන ලද කොටස් සංඛ්‍යාව |
|---|---|---|---|
| ජනවාරි | 247 | 247 | 450,499 |
| පෙබරවාරි | 330 | 330 | 675,786 |
| මාර්තු | 322 | 322 | 675,344 |
| අප්‍රේල් | 225 | 225 | 533,249 |
| මැයි | 273 | 273 | 704,483 |
| ජූනි | 279 | 279 | 973,604 |
| ජූලි | 417 | 417 | 1,045,490 |
| අගෝස්තු | 238 | 238 | 703,441 |
| සැප්තැම්බර් | 189 | 189 | 839,718 |
| **එකතුව** | **2520** | **2520** | **6,601,614** |

මූලාශ්‍රය: වාණිජ දෙපාර්තමේන්තුව

vii. සමාගම් 49 ක් සඳහා තීරුබදු අනුපාත කෝටා සහතික (TRQC) 1554ක් හරහා කොටස් 6,001,733ක් නිකුත් කරන ලදී.

*වගු අංකය 3. 7 තීරුබදු අනුපාත කෝටා සහතික (TRQC) නිකුත් කිරීම*

| මාසය | ලියාපදිංචි සමාගම්වලින් සිදුකරන ලද ඉල්ලීම් ගණන | නිකුත් කරන ලද සහතිකපත්‍ර සංඛ්‍යාව | නිකුත් කරන ලද කොටස් සංඛ්‍යාව |
|---|---|---|---|
| ජනවාරි | 140 | 140 | 631,501 |
| පෙබරවාරි | 208 | 208 | 871485 |
| මාර්තු | 156 | 156 | 735,288 |
| අප්‍රේල් | 103 | 103 | 469,672 |
| මැයි | 187 | 187 | 512,483 |
| ජූනි | 224 | 224 | 624,095 |
| ජූලි | 191 | 191 | 634,416 |
| අගෝස්තු | 195 | 195 | 798,754 |
| සැප්තැම්බර් | 150 | 150 | 724,039 |
| **එකතුව** | **1,554** | **1,554** | **6,001,733** |

මූලාශ්‍රය: වාණිජ දෙපාර්තමේන්තුව

viii. **ආසියා පැසිෆික් වෙළෙඳ ගිවිසුම (APTA)**

APTA යටතේ ශ්‍රී ලංකාවේ අපනයන 2023 පළමු මාස හය තුළ ඇමෙරිකානු ඩොලර් මිලියන 108.65ක් ලෙස වාර්තා විය. APTA යටතේ අපනයනය කරන ලද ප්‍රධාන භාණ්ඩ වූයේ තේ, සක්‍රිය කාබන්, පොල් ආශ්‍රිත නිෂ්පාදන සහ ඇඟලුම් ය. APTA යටතේ ශ්‍රී ලංකාවේ ආනයනය මේ වසරේ අවසන් මාස හය තුළ ඇමෙරිකානු ඩොලර් මිලියන 3.01ක් ලෙස වාර්තා විය.

**අසියා ශාන්තිකර වෙළෙඳ ගිවිසුම (APTA) යටතේ අපනයනය සහ ආනයනය ප්‍රගතිය APTA යටතේ අපනයනය සහ ආනයනය**

*වගු අංකය 3. 8 අසියා ශාන්තිකර වෙළෙඳ ගිවිසුම (APTA) යටතේ අපනයනය සහ ආනයනය ප්‍රගතිය*

| වෙළෙඳාම | 2018 | 2019 | 2020 | 2021 | 2022 | ජනවාරි-ජූලි 2023 |
|---|---|---|---|---|---|---|
| APTAයටතේ අපනයන (ඇ.ඩො.මි.) | 155.85 | 179.27 | 204.67 | 238.61 | 225.16 | 108.65 |
| APTA යටතේ ආනයන (ඇ.ඩො.මි.) | 18.00 | 19.88 | 20.51 | 24.22 | 8.09 | 3.01 |

මූලාශ්‍රය: වාණිජ දෙපාර්තමේන්තුව

ix. **ඉන්දියානු සාගර කලාපීය සංගමය (IORA)**

ශ්‍රී ලංකාව 2023 මැයි 23 සහ සැප්තැම්බර් 5 යන දිනවල පාහේ පවත්වන ලද වෙළඳාම සහ ආයෝජන පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායමේ (WGTI) -IORA හි 21 සහ 22 වැනි රැස්වීම්වලට සහභාගී විය.

WGTI හි එකඟ වූ වැඩ වැඩසටහනේ ඉදිරි ගමන පිළිබඳව ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම් සාකච්ඡා කළ අතර, "ප්‍රතිරෝධී සහ පුරෝකථනය කළ හැකි සැපයුම් දාමයන් හරහා කලාපයේ ආර්ථික සමෘද්ධිය ඇති කිරීම" සහ "ඩිජිටල් වෙළඳාමට ඇති බාධක අඩු කිරීම" පිළිබඳ උපායමාර්ගික සාකච්ඡා දෙකක් පිළිවෙළින් පැවැත්විණි.

x. **විදේශීය වෙළෙඳපොළ අවස්ථා විවර කර ගැනීම විදේශ වාණිජ නියෝජනය**

වෙළඳාම, ආයෝජනය සහ සංචාරක ව්‍යාපාරය කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් සත්කාරක රටවලදී ශ්‍රී ලංකාවේ වාණිජ හා ආර්ථික අපේක්ෂා ප්‍රවර්ධනය හා සුරක්ෂිත කිරීම.

සඳහා වන වාණිජ දෙපාර්තමේන්තුවේ විදේශ වාණිජ නියෝජනය කිරීමේ කාර්යය එතෙර ශ්‍රී ලංකා දූත මණ්ඩල 31ක් නියෝජනය කරන නිලධාරීන් 33 න් සමන්විත වේ.

*වගු අංකය 3. 9 විදේශයන්හි සේවයේ නියුතු වාණිජ නිළධාරින් විසින් ඉටුකරනු ලැබූ කාර්යයන්*

| අනු අංකය | කාර්යය | ක්‍රියාකාරකම් ගණන |
|---|---|---|
| 1 | ව්‍යාපාර ගැලපීම් සංවිධානය කිරීම (B සිට B රැස්වීම්) | 197 |
| 2 | ව්‍යාපාර ජාල සැසිවාර පැවැත්වීම | 44 |
| 3 | වෙනත් රටවල ශ්‍රී ලාංකික වෙළඳාම ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම (ව්‍යාපාරික සම්මේලන, සම්මන්ත්‍රණ ආදිය) | 19 |
| 4 | වෙනත් රටවල පැවැත්වෙන වෙළෙඳ ප්‍රදර්ශන/ සල්පිල් සඳහා ශ්‍රී ලාංකීය සහභාගීත්වය සංවිධානය | 48 |
| 5 | ශ්‍රී ලංකාවේ ප්‍රදර්ශන/වෙළෙඳ ප්‍රදර්ශනවලට සහභාගි වීම සඳහා අභ්‍යන්තර මිලදී ගැනීමේ මෙහෙයුම් සංවිධානය කිරීම | 12 |
| 6 | ශ්‍රී ලංකාවෙන් සත්කාරක රට වෙත වෙළෙඳ නියෝජිතයින්ගේ සංචාරය සංවිධානය කිරීම | 13 |
| 7 | වෙළඳාම පිළිබඳ පැමිණිලි විසඳීමට කටයුතු කිරීම | 21 |
| 8 | අපනයන වෙළෙඳ විමසුම් වෙනුවෙන් කටයුතු කිරීම | 113 |
| 9 | වෙළෙඳපල වාර්තා සැපයීම | 13 |
| 10 | සත්කාරක/ප්‍රතීතනය ලත් රටවල ශ්‍රී ලංකා ප්‍රදර්ශන ප්‍රවර්ධනය කිරීම | 19 |
| 11 | අනාගත ව්‍යාපාරික හවුල්කරුවන් සහ වෙළෙඳ සමඟ රැස්වීම් | 81 |
| 12 | වෙළෙඳපොළ ප්‍රවේශය පිළිබඳ කාරණා සඳහා මැදිහත් වීම | 16 |
| 13 | ආයෝජන පිළිබඳ සම්මන්ත්‍රණ පැවැත්වීම | 16 |
| 14 | ආයෝජන යෝජනාවන් පිළිබඳ කටයුතු කිරීම | 11 |
| 15 | අයෝජන ප්‍රවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම | 8 |
| 16 | සංචාරක ප්‍රවර්ධන කාර්යයන් සංවිධානය කිරීම/පහසුකරණය | 56 |
| 17 | වෙනත් රටවල පැවැත්වෙන සංචාරක ප්‍රදර්ශන සඳහා ශ්‍රී ලංකාවේ සහභාගීත්වය සංවිධානය කිරීම/ පහසුකරණය | 13 |
| 18 | වෙනත් සංචාරක ක්‍රියාකාරකම් (උදා- සංචාරක විමසීම් ආදිය) | 244 |

මූලාශ්‍රය: වාණිජ දෙපාර්තමේන්තුව

xi. **නේවාසික වීසා නිකුත් කිරීම**

ශ්‍රී ලාංකීය වෙළෙඳ සහ සේවා සපයන සමාගම් සඳහා විදේශිකයන්ගේ සේවය ලබා ගැනීම පිණිස, දෙපාර්තමේන්තුව විසින් විදේශිකයන් 49 දෙනෙකු සහ ඔවුන්ගෙන් යැපෙන්නන් 38 දෙනෙකුට නේවාසික වීසා සඳහා නිර්දේශ නිකුත් කර ඇත.

xii. **ප්‍රභවස්ථාන සහතිකපත් නිකුත් කිරීම**

ප්‍රභවස්ථාන සහතික මාර්ගගතව නිකුත් කිරීම සඳහා පද්ධතියක් සකස් කිරීම මෙන්ම සමාගම් ලියාපදිංචි කිරීම ඇතුළු උපකාරක සේවා සැපයීම ද අඛණ්ඩව සිදු කරන ලදී.
අපනයනකරුවන් වෙත ප්‍රභවස්ථාන සහතික (COO) නිකුත් කිරීම සහ අනෙකුත් උපකාරක සේවා ලබා දීම 2023.01.01 සිට 2023.09.30 දක්වා

*වගු අංකය 3. 10 2023.01.01 සිට 2023.09.30 දක්වා අපනයනකරුවන් වෙත ප්‍රභවස්ථාන සහතික (COO) නිකුත් කිරීම*

| අනු අංකය | සපයන සේවාවන් | සේවා ඉල්ලුම | සේවා සැපයීම |
|---|---|---|---|
| 01 | නිකුත් කරන ලද ප්‍රභවස්ථාන සහතික (ISFTA, PSFTA, APTA, SAFTA, SAPTA, GSTP, ජපාන GSP, ඇ.එ.ජ .GSP, ඕස්ට්‍රේලියානු GSP, තුර්කි GSP, යුරේසියානු ආර්ථික සංගමය EAEU GSP, යුරෝපා සංගමය GSP, එක්සත් රාජධානිය GSP යටතේ) | 20,164 | 20,164 |
| 02 | ISFTA යටතේ කෝටා වෙන්කිරීම | 1,554 | 1,554 |
| 03 | වරණීය යෝජනා ක්‍රම යටතේ නව ලියාපදිංචිය | 150 | 150 |
| 04 | අපනයනකරුගේ ප්‍රකාශ ලියාපදිංචිය (EU-REX) | 55 | 55 |
| 05 | පිරිවැය ප්‍රකාශ අනුමත කිරීම | 5,090 | 5,090 |
| 06 | දිවුරුම් ප්‍රකාශ | 2,748 | 2,748 |
| 07 | සත්‍යාපන සහතික | 342 | 342 |
| 08 | අපනයනකරුවන්හට පැහැදිලි කිරීමේ /විස්තර කිරීමේ සේවා | 9,827 | 9,827 |

මූලාශ්‍රය: වාණිජ දෙපාර්තමේන්තුව

xiii. **වෙළෙඳ විමසුම් පිළිබඳ කටයුතු කිරීම**

සමාලෝචිත කාලය තුළ වාණිජ නිලධාරීන් වෙත වෙළෙඳ විමසුම් 113 ක ප්‍රමාණයක් ලැබී ඇති අතර විදේශීය වෙළෙඳපොළ තුළ ශ්‍රී ලාංකීය නිෂ්පාදනයන් ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් යුතුව ඒවාට නිසි පිළිතුරු වශයෙන් අදාළ තොරතුරු/ මඟපෙන්වීම් ලබා දෙන ලදී.

xiv. **වෙළෙඳ ආරවුල් විසඳීම සඳහා සහයෝගය**

වෙළෙඳ පැමිණිලි සාමාන්‍යයෙන් දෙපාර්තමේන්තුවට එතෙර ශ්‍රී ලංකා දූත මණ්ඩල/ ශ්‍රී ලංකාවේ විදේශ තානාපති කාර්යාලය හරහා හෝ ඍජුවම ලැබේ. අපනයන සහ ආනයන කටයුතු ආශ්‍රිත වෙළෙඳ ආරවුල් ඊට අදාළ පාර්ශව අතර සුහදශීලී අයුරින් විසඳාගැනීම සඳහා වාණිජ දෙපාර්තමේන්තුව අතරමැදියෙකු/පහසුකම් සපයන්නෙකු වශයෙන් කටයුතු කරනු ලැබේ. අදාළ කාලසීමාව තුළ වාණිජ නිලධාරීන් වෙත වෙළෙඳ ආරවුල් 21 ක ප්‍රමාණයක් ද දෙපාර්තමේන්තුව වෙත වෙළෙඳ ආරවුල් 18 ක ප්‍රමාණයක් ද ලැබී ඇති අතර ඒ සම්බන්ධයෙන් එතෙර ස්ථානගත වාණිජ නිලධාරීන්ගේ සහයෝගයෙන් අවශ්‍ය කටයුතු සිදු කර ඇත.

xv. **ලෝක වෙළෙඳ සංවිධානයේ (WTO) අමාත්‍ය සමුළුව සඳහා සූදානම් කිරීම් සහ 13 වන අමාත්‍ය සමුළුව (MC- 13) හි සහභාගීත්වය**

- MC 13, 2023 පෙබරවාරි මාසයේදී එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ අබුඩාබි හිදී පැවැත්වූ අතර MC 13 සඳහා ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායමේ ප්‍රධානියා ලෙස වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යවරයා සහභාගී විය.

- MC 13 සඳහා පූර්වගාමියා ලෙස ක්‍රියා කරන ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ රැස්වීම (SOM) 2023 ඔක්තෝබර් 23-24 දිනවල පැවැත්වෙන අතර 2023 සැප්තැම්බර් මාසයේදී SOM සඳහා යෙදවුම් සැපයීම සඳහා පාර්ශවකරුවන්ගේ උපදේශන රැස්වීම් පැවැත්විණි.

- කෘෂිකර්මය පිළිබඳ පාර්ශවකරුවන්ගේ උපදේශන 2023 සැප්තැම්බර් 14 දින පවත්වන ලද අතර කෘෂිකාර්මික කටයුතු සම්බන්ධයෙන් ලෝක වෙළෙඳ සංවිධානයේ අපක්ෂපාතී වත්මන් ස්ථාවරය අප විසින් පවත්වා ගත යුතු බව රැස්වීම ඒකමතිකව ප්‍රකාශ කළේය.

- ආයෝජන පිළිබඳ ගිවිසුම පිළිබඳ පාර්ශ්වකරුවන්ගේ උපදේශනය 2023 සැප්තැම්බර් 15 වන දින සිදු වූ අතර, ගිවිසුම තවදුරටත් අධ්‍යයනය කිරීමට සහ ආයෝජන පහසු කිරීම සම්බන්ධයෙන් අපගේ ස්ථාවරය තීරණය කිරීමට ශ්‍රී ලංකාවට තවත් කාලයක් අවශ්‍ය බව පාර්ශවකරුවන් තීරණය කළේය.

- ලෝක වෙළෙඳ සංවිධානය (WTO) හි ඉලෙක්ට්‍රොනික සම්ප්‍රේෂණ සඳහා රේගු බදු පැනවීම තහනම් කිරීම (E- Commerce Moratorium) පිළිබඳ පාර්ශ්වකරුවන්ගේ උපදේශනය සැප්තැම්බර් 19 වන දින පවත්වන ලද අතර, මෙම තහනම සම්බන්ධයෙන් ලෝක වෙළෙඳ සංවිධානය (WTO) සාමාජිකයින් කිහිපදෙනෙකු අතර යම් එකඟතාවයක් ඇති වුවහොත් එය අවහිර නොකිරීමටත් තාවකාලිකව තබා ගැනීමටත් සහය දීමට පාර්ශවකරුවන් තීරණය කළහ. තවද මෙම පාර්ශවකරුවන්ගේ රැස්වීම් අඛණ්ඩ වේදිකාවක් ලෙස සහ අඛණ්ඩ සංවාදයක් ලෙස භාවිතා කිරීමට තීරණය කරන ලද අතර එහිදී සියලුම පාර්ශවකරුවන් හමුවී මෙම මාතෘකාව සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ගැටළු සාකච්ඡා කරනු ඇත. මෙම රැස්වීම් සංවිධානය කිරීමට පෙරමුණ ගන්නා ලෙස සියලුම පාර්ශ්වකරුවන් DoC වෙතින් ඉල්ලා සිටි අතර ඉදිරි සාකච්ඡා සඳහා ඔවුන්ගේ උපරිම සහයෝගය ලබා දෙන බවට පොරොන්දු විය.

- ලෝක වෙළෙඳ සංවිධානය (WTO) හි ධීවර සහනාධාර ගිවිසුමට පාරශවකරුවෙක්වීමේ (AFS) ශ්‍රී ලංකාවේ තීරණය සම්බන්ධයෙන් වැඩිදුර සාකච්ඡා කිරීම සඳහා ධීවර හා වෙළෙඳ අමාත්‍යාංශ ලේකම්වරුන් ඇතුළු පාර්ශවකරුවන්ගේ රැස්වීම් පවත්වන ලදී.

- රටක් වශයෙන් අපට වඩාත් සුදුසු තත්ත්වය තීරණය කිරීම සඳහා මෙම ඕනෑම ගිවිසුමක් පිළිබඳ වැඩිදුර පැහැදිලි කිරීම්, අවශ්‍ය නම් අපි ලෝක වෙළෙඳ සංවිධානය (WTO) වෙතින් විශේෂඥ සහාය ඉල්ලා සිටිය හැක.

xvi. **වෙළෙඳ ප්‍රතිකර්ම පනත් ක්‍රියාත්මක කිරීම (Trade Remedy Act)**

- වෙළෙඳ ප්‍රතිකර්ම පනත් ක්‍රියාත්මක කිරීමේ රෙගුලාසි වැඩිදුර නිෂ්කාශනය සඳහා නීතිපති දෙපාර්තමේන්තුවට යවන ලදී. 2023 අප්‍රේල් 26 වන දින නීති ක්‍රියාත්මක කිරීමේ ගැටළු සාකච්ඡා කිරීම සඳහා පාර්ශවකරුවන්ගේ රැස්වීමක් පැවැත්විණි.
- ඉන් පසුව අවධානයට ලක්වන කාල සීමාව තුළ එහි ප්‍රගතිය සාකච්ඡා කිරීම සඳහා තවත් රැස්වීම් වට කිහිපයක් පැවැත්විණි.

xvii. **ද්වීපාර්ශවික වෙළෙඳ සබඳතා නිදහස් වෙළෙඳ ගිවිසුම් (FTA)/ වරණීය වෙළෙඳ ගිවිසුම් (PTA)/ ඒකාබද්ධ කමිටු (JC) යටතේ පවත්වන වෙළෙඳසාකච්ඡා**

ඉන්දියාව සහ පාකිස්තානය සමඟ ශ්‍රී ලංකාවේ ද්වීපාර්ශවික නිදහස් වෙළෙඳ ගිවිසුම් 02ක් ක්‍රියාත්මක වේ. නිදහස් වෙළෙඳ ගිවිසුම (FTA) යටතේ මෙහෙයුම් සහතික කිරීමේ ක්‍රියාපටිපාටි (OCP) අවසන් කිරීම සඳහා ඉන්දියාව සමඟ කාර්යය කණ්ඩායමක් ආරම්භ කරන ලදී. සිංගප්පූරුව සමඟින් එළඹ ඇති නිදහස් වෙළෙඳ ගිවිසුම සම්බන්ධව 15 කාණ්ඩයේ නිෂ්පාදනවල තීරුබදු ඉවත්කිරීම ගැසට් කර ඇත.

තායිලන්තය සමඟ නිදහස් වෙළෙඳ ගිවිසුමක්ද බංගලාදේශය සමඟ වරණීය වෙළෙඳ ගිවිසුමක්ද සාකච්ඡා මට්ටමේ පවතින අතර ඉන්දියාව සමඟ ආර්ථික හා තාක්ෂණ සහයෝගීතා ගිවිසුම (ETCA) ද, චීනය සමඟ නිදහස් වෙළෙඳ ගිවිසුමද සාකච්ඡා නැවත ආරම්භ කිරීමට නියමිත අතර මැලේසියාව සමඟ වරණීය වෙළෙඳ ගිවිසුම පිළිබඳ මූලික අධ්‍යයනයන් අවසන් කර හෝ ඊට අදාළ ඉල්ලා සිටින ලද මූලික නිල සටහන් ආදිය හුවමාරු කිරීමෙන් පසු සාකච්ඡා ආරම්භ කිරීමට නියමිතය.

වාණිජ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් SL-Thailand FTA, SL-India FTA, SL-China FTA සඳහා තාක්ෂණික කමිටුවල සභාපතිවරුන්/සාමාජිකයින් වශයෙන් නිදහස් වෙළෙඳ ගිවිසුම් පිළිබඳ සාකච්ඡා සඳහා තාක්ෂණික සහාය ලබා දේ. මීට අමතරව, ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම (ISFTA) යටතේ ඇහලුම් කෝටාව ඉවත් කිරීම සඳහා ඉන්දියානු බලධාරීන් සමඟ සාකච්ඡා කිරීමට වාණිජ දෙපාර්තමේන්තුව සහාය වේ.
ශ්‍රී ලංකාව කලාපීය විස්තීරණ ආර්ථික හවුල්කාරිත්වය (RCEP) හි සාමාජිකත්වය සඳහා ඉල්ලුම් කර ඇත.

ශ්‍රී ලංකාව සහ ඕස්ට්‍රේලියාව අතර 3 වන ඒකාබද්ධ වෙළෙඳ සහ ආයෝජන කමිටු රැස්වීම සහ රාමු ගිවිසුමේ කාර්තුමය සමාලෝචනය කර ලදුව කාලය දීර්ග කිරීමේ ගිවිසුම 12 දින අත්සන් තබන ලදී.

යුරෝපා සංගමය සමග වාර්ශික ආර්ථික සහ තාක්ෂණ සහයෝගීතා කාර්ය කණ්ඩායම් රැස්වීම පවත්වා ද්වීපාර්ශ්වික වෙළදාම සහ සහයෝගීතාව වැඩි දියුණු කිරීමට අදාල වැදගත් කරුණු සාකච්ඡා කරන ලදී.

xviii. **අභ්‍යන්තර වෙළෙඳ සහ ආයෝජන නියෝජිත කණ්ඩායම් සඳහා පහසුකම් සැලසීම**

ජෝර්ජියාවේ ගරු. ශ්‍රී ලංකා කොන්සාල්වරිය 2023 මැයි 25 සිට ජූනි 6 දක්වා ශ්‍රී ලංකාවට පැමිණි අතර එය තුර්කියේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සහ වාණිජ දෙපාර්තමේන්තුව එක්ව සංවිධානය කරන ලදී. මෙම සංචාරයේදී ශ්‍රී ලංකා කොන්සාල්වරිය, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය, විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය, නාගරික සංවර්ධන රාජ්‍ය අමාත්‍ය සහ සංචාරක නිවාස අමාත්‍ය සමඟ ද්විපාර්ශ්වික සංචාරක හා ආයෝජන සාකච්ඡා පැවැත්විය.

xix. **පිටතට යන වෙළෙඳ නියෝජිත කණ්ඩායම්, ව්‍යාපාරික ආයෝජන සංසද, මාර්ග සංදර්ශන, විදේශීය වෙලඳපොළවල B2B රැස්වීම් සම්බන්ධීකරණය කිරීම**

ගරු. වෙළෙඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා අමාත්‍යවරයා 2023 මැයි 8 සිට 10 දක්වා එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ අබුඩාබි වෙත ගොස් කොළඹ වරාය නගරයේ ඉහළ මට්ටමේ ආයෝජන නියෝජිත පිරිසක් සමඟ වාර්ෂික ආයෝජන රැස්වීමට සහභාගී විය. සංචාරය අතරතුර ගරු අමාත්‍යවරයා එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ විදේශ වෙළෙඳ කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍ය ආචාර්ය Thani bin Ahmed Al Zeoudi මහතා හමුවිය.

xx. **කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් හට අපනයන වෙළෙඳපොළට ප්‍රවේශය පිළිබඳ වැඩමුළු**

වාණිජ දෙපාර්ත්මේන්තුවේ වෙළෙඳ ප්‍රවර්ධන ඒකකය විසින් 19.05.2023 දින ගම්පහ දිස්ත්‍රිකය තුළ සංවිධානය කරන ලද කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් හට අපනයන වෙළෙඳපොළට ප්‍රවේශය පිළිබඳ වැඩමුළුවට විවිධ අපනයන අංශ එනම් කුළු බඩු, පොල් ආශ්‍රිත නිශ්පාදන, තේ, බතික්, ඇඟළුම්, විවිධ මල් වර්ග නියෝජනය කරමින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් 250ක් පමණ සහභාගී විය.

තවද කොළඹ දිස්ත්‍රිකයයේ ප්‍රමුඛ හා මධ්‍ය පරිමාණ අපනයනකරුවන්ගේ වෙළෙඳපොළ ප්‍රවේශය වැඩිදියුණු කිරීමේ වැඩමුළුවක් 2023.09.25 වන දින කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය ශ්‍රවණාගාරයේදී සංවිධානය කරන ලදී. මෙම අවස්ථාවට කොළඹ දිස්ත්‍රිකය පුරා ව්‍යාප්ත විවිධ අපනයන අංශ නියෝජනය කරමින් ප්‍රමුඛ, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් 200ක් පමණ සහභාගි විය. වාණිජ දෙපාර්තමේන්තුවෙන් හා වෙළෙඳ වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයෙන් අපනයනකරුවන්ට ලබාගත හැකි සේවාවන් ද්වි පාර්ශවික, බහුපාර්ශවික, කලාපීය නිදහස් වෙළෙඳ ගිවිසුම් පිළිබඳ සහ GSP+ ප්‍රභවස්ථාන සහතික නිකුත් කිරීම, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් අපනයන වෙළෙඳපොළට සූදානම් කිරීම, විදේශ තානාපති කාර්යාලවල සේවයේ නියුතු වාණිජ දෙපාර්තමේන්තුවේ වෙළෙඳ කොමසාරිස්වරුන්ගෙන් ලබා ගත හැකි සේවාවන්, විදේශ වෙළෙඳපොළ අවස්ථා හඳුනාගැනීම, අපනයන සඳහා අවශ්‍ය සුදුසුකම්, අපනයන ක්‍රියා පටිපාටිය, වෙළෙඳ බිහිදොර සහ මාර්ග ගත ක්‍රමයට සකසන ලද අපනයන ක්‍රියාවලියේ පියවරෙන් පියවර ක්‍රියාකාරිත්වය පිළිබඳ හඳුන්වා දීම, වාණිජ දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවි හඳුන්වා දීම, ඉලෙක්ට්‍රොනික ප්‍රභවස්ථාන සහතිකපත් ක්‍රමය හඳුන්වා දීම පිළිබඳ දැනුවත් කරන ලදී. වාණිජ දෙපාර්තමේන්තුවේ සහ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ නිලධාරින් විසින් සම්පත් දායකත්වය ලබා දෙන ලදී.

*වගු අංකය 3. 11 ගෝලීය වෙළෙඳ වරණ ක්‍රමය (GSTP) යටතේ ශ්‍රී ලංකාවේ අපනයනය*

| HS code | Description | U.S.$ |
|---|---|---|
| **Total Export under GSTP** | | **37.26** |
| 090611 | Cinnamon and cinnamon-tree flowers | 34.67 |
| 230690 | Oil-cake and other solid residues | 0.99 |
| 090710 | Cloves (whole fruit, cloves and stems). | 0.78 |
| 761290 | Aluminium casks, drums, cans, boxes and similar containers | 0.32 |
| 151311 | Coconut (copra), palm kernel | 0.20 |
| 090620 | Cinnamon and cinnamon-tree flowers | 0.09 |
| 530500 | Coconut, abaca (manila hemp or musa textile nee), | 0.06 |
| 380210 | Activated carbon; activated natural mineral products; animal black, including spent animal black. | 0.05 |
| 330190 | Essential oils (terpeneless or not | 0.04 |
| 170290 | Other sugers, including chemically pure lactose maltoes, glucose and fructose, in solid form | 0.02 |
| 080111 | Coconuts, Brazil nuts and cashew nuts, fresh or dried, whether or not shelled or peeled. | 0.01 |
| 300490 | Medicaments (excluding goods of heading 30.02, 30.05 or 30.06) | 0.01 |
| 960310 | Brooms, brushes | 0.01 |

මූලාශ්‍රය: වාණිජ දෙපාර්තමේන්තුව

xxi. **ශ්‍රී ලාංකේය නිෂ්පාදන ප්‍රවර්ධනය පිළිබඳ මාර්ගගත ( zoom ) රැස්වීම පැවැත්වීම**

ගැනුම්කරුවන් සොයා ගැනීම සඳහා එක්සත් රාජධානිය, කැනඩාව, ඇමරිකා එක්සත් ජනපදය, ඕස්ට්‍රේලියාව සහ පකිස්ථානය යන රටවල වාණිජ නිලධාරීන් සමඟ 2022 අගෝස්තු 16 වැනි දින මාර්ගගත රැස්වීමක් සංවිධානය කරන ලදී. ස්විස්ටෙක් ඇලුමිනියම් පුද්ගලික සමාගම විසින් මෙම රටවල එක් එක් වාණිජ නිලධාරීන් සමඟ තත්ත්ව ප්‍රමිතීන් සහ අනෙකුත් වෙළෙඳ මිනුම් අවශ්‍යතා පිළිබඳ අන්තර් ක්‍රියාකාරී සාකච්ඡාවකින් අනතුරුව අපනයන වෙළෙඳපොළ සඳහා ඔවුන්ගේ නිෂ්පාදන පැතිකඩ සහ ඒවායේ තත්ත්ව සහතිකය පිළිබඳ ඉදිරිපත් කිරීමක් සිදු කරන ලදී.

ඉන්දුනීසියාවේ සහ දකුණු අප්‍රිකාවේ ශ්‍රී ලංකා දූත මණ්ඩලවල වාණිජ නිලධාරීන් විසින් තොරතුරු සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා ව්‍යාපාර ගැලපුම් කටයුතු රැස්වීමක් ICTA ආයතනය සමඟ එක්ව ජූනි මස සංවිධානය කරන ලදී. එවගේම තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කර්මාන්තයේ අනාගත සහයෝගිතාව පිළිබඳ සාකච්ඡාවක් 2023.10.03 JETRO ආයතනය සමඟද ඩිජිටල් ආයෝජන සමුළුව ට සමගාමීව ICTA ආයතනය සහ වෙළෙඳ කොමසාරිස් වරුන් සමඟ මාර්ගගත සාකච්ඡාවක්ද වාණිජ දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලදී.

xxii. **අන්තර්ජාතික වෙළෙඳ ප්‍රදර්ශන සහ රැස්වීම් පැවැත්වීම**

කර්මාන්ත අමාත්‍යාංශය හා කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් 2023 ජූනි 22 – 25 දින සංවිධානය කරනු ලබන කාර්මික ප්‍රදර්ශනය සහ 2023 අගෝස්තු 04 - 06 දක්වා බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව (BMICH) පැවැත්වෙන ප්‍රොෆුඩ් ප්‍රොපැක් සහ ඇග්බිස් 2023 ප්‍රදර්ශනය සඳහා විදේශ වෙළෙඳ නියෝජිතයන් සහභාගි කර ගැනීමේ අරමුණින් වෙළෙඳ කොමසාරිස්වරුන් දැනුවත් කිරීමේ සාකච්ඡාවක් මාර්ගගතව පවත්වන ලදී.

වාණිජ දෙපාර්තමේන්තුව (DOC) බීජිං හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සමඟ එක්ව 7 වැනි චීන-දකුණු ආසියානු ප්‍රදර්ශනයේ සහ 27 වැනි චීන (කුන්මිං) ආනයන හා අපනයන ප්‍රදර්ශනයේ දී ශ්‍රී ලංකා මණ්ඩපයේ ප්‍රදර්ශනය කිරීම සඳහා ශ්‍රී ලංකා ව්‍යාපාරික නියෝජිත පිරිසේ සහභාගීත්වය සංවිධානය කරන ලදී. 2023 අගෝස්තු 16-20 දක්වා පැවැත්විණි. සමාගම් විසින් මැණික් සහ ස්වර්ණාභරණ, ලංකා තේ, රසකැවිලි, සැකසූ ආහාර, කජු, කුළුබඩු, පොල් මද නිෂ්පාදන, බතික් සහ හස්ත කර්මාන්ත වැනි නිෂ්පාදන පෙළක් ප්‍රවර්ධනය කරන ලදී. ශ්‍රී ලංකාව චීන-දකුණු ආසියානු ප්‍රදර්ශනය ඉතා සංකේතාත්මක වෙළෙඳ ප්‍රදර්ශනයක් ලෙස සලකනු ලබන අතර එය ආරම්භයේ සිටම ශ්‍රී ලංකාවේ අපනයන ප්‍රජාව විසින් හොඳින් පිළිගෙන ඇත. මෙය ශ්‍රී ලාංකේය සමාගම්වලට තම නිෂ්පාදන චීන වෙළෙඳපොළට ප්‍රදර්ශනය කිරීමට සහ නව ගැනුම්කරුවන් සොයා ගැනීමට ද කදිම අවස්ථාවක් විය. තවද, චීන වෙළෙඳපොළේ භාවිතා වන ගතික ඊ-වාණිජ්‍යය සහ සමාජ මාධ්‍ය අලෙවිකරණ උපාය මාර්ග අවබෝධ කර ගැනීමට එය අවස්ථාවක් විය. ගරු. වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍ය නලින් ප්‍රනාන්දු මහතා කුන්මිං ප්‍රදර්ශනය නැරඹීමට ගිය අතර යුනාන් පළාතේ වාණිජ දෙපාර්තමේන්තුව සමඟ පැවති ද්විපාර්ශ්වික රැස්වීමේ ශ්‍රී ලංකා පාර්ශවයේ මුලසුන දැරූ අතර ශ්‍රී ලංකාව විශේෂයෙන්ම යුනාන් පළාත සමඟ සමීප සහයෝගීතාව ප්‍රකාශ කළේය.

### 3.5. සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

i. ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති/වැඩසටහන් වල මූල්‍ය හා භෞතික ප්‍රගතිය

*වගු අංකය 3. 12 සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ව්‍යාපෘති හා වැඩසටහන් වල මූල්‍ය හා භෞතික ප්‍රගතිය*

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | 2023.09.30 දිනට මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | 2023.09.30 දිනට භෞතික ප්‍රගතිය | භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|---|
| 1 | සී/ස විචිත්‍ර පැළෑටි සහ උඩවැඩියා සමුපකාර සමිතිය - ලක්මල් උයන ව්‍යාපෘතිය. (අයවැය ප්‍රතිපාදන රු.මි. 23) | - | පටක රෝපණ විද්‍යාගාරය ඉදිකිරීම හා උපකරණ මිලදී ගැනීම් සිදුකර ඇත. සමිතිය සතු පැළ අලෙවි මධ්‍යස්ථානය සංවර්ධනය හා පැළ මිලදී ගැනීම් සිදුකර ඇත. | 50 |

**මූලාශ්‍රය: සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව**

ii. **සමිති විගණනයේ ප්‍රගතිය**

*වගු අංකය 3. 13 සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමිති විගණනයේ ප්‍රගතිය*

| අනු අංකය | සැලසුම් කළ විගණන සංඛ්‍යාව | 2023.09.30 දිනට අවසන් කළ විගණන සංඛ්‍යාව | භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|
| 1 | 65 | 43 | 66.15 |

**මූලාශ්‍රය: සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව**

iii. **සමිති ලියාපදිංචි කිරීමේ ප්‍රගතිය**

*වගු අංකය 3. 14 සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමිති ලියාපදිංචි කිරීමේ ප්‍රගතිය*

| අනු අංකය | ඉලක්ක ගත ප්‍රමාණය | 2023.09.30 දිනට ලියාපදිංචි කළ සංඛ්‍යාව | භෞතික ප්‍රගතිය (සමිතියේ නම) | භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|---|
| 1 | 3 | 1 | සී/ස සමස්ත ලංකා සත්ව නිෂ්පාදන හා සත්ව පාලන ගොවි සමූපකාර සමිතිය | 33.33% |

*2023.02.01 දින සිට සමිති ලියාපදිංචිය අත්හිටුවා ඇත.

**මූලාශ්‍රය: සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව**

iv. **සමිති සඳහා ලබා දුන් ණය**

*වගු අංකය 3. 15 සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සමිති සඳහා ලබා දුන් ණය*

| අනු අංකය | සමිතියේ නම | ණය නිකුත් කිරීමට වෙන් කළ ප්‍රතිපාදන වටිනාකම (රු.මි.) | 2023.09.30 දිනට නිකුත් කළ ණය වටිනාකම (රු.මි.) |
|---|---|---|---|
| 1 | සී/ස සමෘද්ධි සංවර්ධන හා කෘෂිකර්ම පර්යේෂණ සහකාර නිලධාරීන්ගේ ණසස සමිතිය | 100 | 15 |
| 2 | සී/ස තැපැල් හා ටෙලිකොම් සේවා සමූපකාර බැංකු සමිතිය | | 50 |

**මූලාශ්‍රය: සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව**

## 3.6. සීමාසහිත ලංකා සතොස සමාගම

**i. ලංකා සතොස සමාගමේ මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා අභ්‍යන්තර ක්‍රියාවන් රාශියක් හඳුන්වාදීම**

- විකුණුම් අයිතම කළමනාකරණ ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව වැඩි කිරීම.
- නව භාණ්ඩ තොග නිකුත් කිරීමට පෙර පැරණි භාණ්ඩ තොග නිකුත් කිරීමට අවශ්‍ය විධිවිධාන සලසා ඇත. ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුතු (Fist in First out) ක්‍රමය නිසි ලෙස ක්‍රියාත්මක කිරීම.
- කලාපීය කළමනාකරුවන්ට වැඩි වගකීම් හෝ වගකීම් සමාලෝචනය කර ඉහල වගකීමක් ලබාදී මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීම.
- ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කිරීම සඳහා නව පටිපාටි ක්‍රියාත්මක කිරීම සහ සැපයුම්කරුවන් නැවත ලියාපදිංචි කිරීම.
- අතිකාල ගෙවීම් පාලනය.
- නඩත්තු පිරිවැය අවම කිරීම.
- ප්‍රවාහන වියදම් අවම කිරීම.
- අඛණ්ඩව පාඩු ලබන වෙළෙඳසැල් වසා දැමීම.
- අභ්‍යන්තර විගණන කටයුතු ශක්තිමත් කිරීම.

**ii. 2022 අගෝස්තු මස සිට මේ දක්වා සිදු කරන ලද ක්‍රියාකාරකම් වෙනස් කිරීම් සහ ක්‍රමවේදයන් හේතුවෙන් ආයතනයේ එදිනෙදා ක්‍රියාකාරකම් මෙන්ම ඒවායේ කාර්යක්ෂමතාවයද වර්ධනය කර ඇති අතර ඒ හේතුවෙන් ආයතනයට 2023 ජනවාරි මාසයේ සිට මෙහෙයුම් ලාභයක්ද, 2023 ජූලි මාසයේ සිට ශුද්ධ ලාභයක්ද ලබාගෙන ඇත. ඒ පිළිබඳ තොරතුරු පහත දැක්වේ**

*වගු අංකය 3. 16 සීමාසහිත ලංකා සතොස සමාගමේ 01/2023 සිට 09/2023 දක්වා ශුද්ධ ලාභය/ (අලාභය)*

| මාසය | බදු පෙර ලාභය/ (අලාභය) (රු.මි.) | ආදායම් බදු වියදම (රු.මි.) | කලච්ඡේදයේ බදු පසු ලාභය/ (අලාභය) (රු.මි.) |
|---|---|---|---|
| ජනවාරි | (121,487,550) | - | (121,487,550) |
| පෙබරවාරි | (117,702,792 | - | (117,702,792) |
| මාර්තු | (4,593,385) | - | (4,593,385) |
| අප්‍රේල් | 173,479,063 | - | 173,479,063 |
| මැයි | (73,783,138) | - | (73,783,138) |
| ජූනි | (51,036,701) | - | (51,036,701) |
| ජූලි | 9,564,302 | - | 9,564,302 |
| අගෝස්තු | 61,986,750 | - | 61,986,750 |
| සැප්තැම්බර් | 61,476,200 | - | 61,476,200 |

**මූලාශ්‍රය: සීමාසහිත ලංකා සතොස සමාගම**

### iii. 2023 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලය තුළ ආරම්භ කරන ලද සහ යෝජිත වත්මන් අලෙවිසැල්

*වගු අංකය 3. 17 2023 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලය තුළ ආරම්භ කරන ලද සහ යෝජිත වත්මන් අලෙවිසැල්*

| කලාපය | අලෙවිසැල් ගණන | ඇස්තමේන්තුගත මුදල (රු.මි.) |
|---|---|---|
| අනුරාධපුරය | 1 | 27 |
| බදුල්ල | 1 | 65 |
| මහනුවර | 1 | 70 |
| රත්නපුර | 1 | 50 |
| ඉදිරි මාස 6 ඇතුළත එක් කලාපයක අලෙවිසැල් 2 බැගින් සංවර්ධනය කිරීමට නියමිත අලෙවිසැල් | 46 | 258 |

**මූලාශ්‍රය: සීමාසහිත ලංකා සතොස සමාගම**

## 3.7. අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය

i. ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයෙන් ප්‍රතීතනය ලබා ගත් ආයතන විසින් නිකුත් කරනු ලබන පරීක්ෂණ වාර්තා හා සහතික සඳහා අන්තර්ජාතික පිළිගැනීම තහවුරු කිරීම සඳහා අප ආයතනය මෙම අන්තර්ජාතික ප්‍රතීතන සංවිධානවල සාමාජිකත්වය පවත්වාගෙනයාම හා ක්‍රියාකාරී දායකත්වය ලබාදීම අනිවාර්ය වේ. මේ තුළින් ජාත්‍යන්තර ප්‍රතීතන සංසදය (IAF) හා ජාත්‍යන්තර රසායනාගාර ප්‍රතීතන සහයෝගිතාව (ILAC) අන්‍යොන්‍ය පිළිගැනීම යටතේ ප්‍රතීතනය ලබා දී ඇති ආයතන.

*වගු අංකය 3. 18 ජාත්‍යන්තර ප්‍රතීතන සංසදය (IAF) හා ජාත්‍යන්තර රසායනාගාර ප්‍රතීතන සහයෝගිතාව (ILAC) අන්‍යොන්‍ය පිළිගැනීම යටතේ ප්‍රතීතනය ලබා දීමේ ප්‍රගතිය*

| විෂය පථය | දෙවන පෙළ | තෙවන පෙළ | ලබා දී ඇති ප්‍රතීතන සංඛ්‍යාව |
|---|---|---|---|
| IAF අන්‍යොන්‍ය පිළිගැනීම | භාණ්ඩ සහතික කිරීම. | ISO/IEC 17065 | 09 |
| | වලංගු කිරීම් හා සහතික කිරීමේ ආයතන | ISO/IEC 17029 | 03 |
| | හරිතාගාර වායු වලංගු කිරීමේ හා සහතික කිරීමේ ආයතන | ISO/IEC 14065 | 01 |
| | ආහාර සුරක්ෂිතතා කළමණාාකරණ පද්ධති | ISO/IEC22000 (FSMS) | 05 |
| | තත්ත්ව කළමනාකරණ පද්ධති සහතික කිරීම. | ISO 9001 (QMS) | 04 |
| | පාරිසරික කළමනාකරණ පද්ධති සහතික කිරීම. | ISO 14001 (EMS) | 03 |
| ILAC අන්‍යොන්‍ය පිළිගැනීම | පරීක්ෂාකිරීමේ රසායනාගාර | ISO/IEC 17025 | 114 |
| | වෛද්‍ය රසායානාගාර | ISO 15189 | 23 |
| | ක්‍රමාංකන පරීක්ෂණාගාර | ISO/IEC 17025 | 15 |
| | පිරික්සුම් ආයතන | ISO/IEC 17020 | 07 |

**මූලාශ්‍රය: අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය**

## ii. 2023.01.01 වන දින සිට 2023.09.30 වන දින දක්වා ලබා දී ඇති නව ප්‍රතීතනයන්

*වගු අංකය 3. 19 අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය 2023.01.01 වන දින සිට 2023.09.30 වන දින දක්වා ලබා දී ඇති නව ප්‍රතීතනයන්*

| අංකය | ආයතනයේ නම | විෂය පථය |
|---|---|---|
| වෛද්‍ය රසායනාගාර | | |
| 01 | Medihelp Hospitals Laboratory | Clinical Biochemistry/ Chemical Pathology, Clinical Pathology, Haematology |
| 02 | Asiri Laboratories, Asiri Hospital Kandy | Clinical Biochemistry/Chemical Pathology, Haematology and Clinical Pathology |
| පරික්ෂා කිරීමේ රසායනාගාර හා ක්‍රමාංකනාගාර | | |
| 03 | MUSSD -Volume Laboratory | Mechanical Calibration (Volume calibration) |
| 04 | Laugfs Gas Terminals – LPG Testing Laboratory | Chemical Testing on LP Gas Testing |
| 05 | Kelun Life Science | Chemical & Biological Testing on pharmaceutical products |
| 06 | Microbiology Laboratory of NIHS -Kalutara | Biological Testing on Food & Agri cultural products |
| 07 | MTS Lanka (Pvt) Ltd | Chemical & Mechanical Testing on Textile & textile products |
| 08 | Calibration Laboratory – Bureau Veritas Consumer products Services Ltd | Mechanical, Thermal & time & Frequency |
| 09 | Gross Alpha Beta Counting Laboratory | Performing Chemical Testing on Water/Waste Water and Solid/Other Solids |
| 10 | LTL Transformers (Pvt) Ltd | Performing electrical testing on transformers and low voltage switch gear |
| 11 | Hydromax Services (Pvt) Ltd | Performing Chemical testing on Water as per APHA test methods |
| 12 | Laboratory of Cotecna Lanka (Pvt) Ltd. | Performing Chemical Testing on Tea & Fly Ash |

| අංකය | ආයතනයේ නම | විෂය පථය |
| --- | --- | --- |
| 13 | Meter Testing and Verification Laboratory-LECO | Performing Electrical Testing on Electricity Meters |
| 14 | Regional Centre for Lighting -CEB | Performing Electrical & Photometric on Self ballasted Lamps/Integral type compact Fluorescent Lamp & LED Lamps |
| 15 | Laboratory of Central Environment Testing and Consultancy (Pvt) Ltd | Performing Chemical Testing on Water |
| 16 | Vinshu Enterprises Ltd | Performing Calibrations on Force |
| පිරික්සුම් ආයතන | | |
| 17 | S G S Lanka (Pvt.) Ltd. | Food and Agriculture product inspections on Import and Export Purposes |
| නිෂ්පාදන සහතිකකරණ ආයතන | | |
| 18 | Bamber and Bruce (Pvt) Ltd | Scope: Friend of the Sea Certification Scheme<br>FOS 0001 – Certification procedure - Aqua, FOS-Wild, FOS-FF, FOS-FM, FOS-FO, FOS-O3 and CoC General requirements, v 9.3 2019-09-10<br>FOS standard – Wild sustainable fishing requirements, v 3.1, 2017-10-18 & v 4, 2020-03-18 for wild catch fisheries<br>FOS standard – Chain of custody criteria and indicators for the certification of the traceability of Friend of the Sea products & Criteria and Indicators for the certification of sustainable Fish feed (FF), Fish meal (FM), Fish oil (FO) and Omega 3 (O3), v 5, 2016-10-24 |
| 19 | Product Certification Division<br>Sri Lanka Standards Institution | SLS 1324: 2018<br>1. Unprocessed agricultural crop livestock, aquaculture and apiculture products, excluding tobacco and any other material restricted by government laws<br>2. Processed Agricultural crop livestock, aquaculture and apiculture products intended for human consumption containing one or more ingredient(s) derived from 1 above. |

| අංකය | ආයතනයේ නම | විෂය පථය |
|---|---|---|
| 20 | Ceycert (Private) Ltd. | SLS 1324: 2018<br>Unprocessed agricultural crop livestock, aquaculture and apiculture products, excluding tobacco and any other material restricted by government laws |
| වලංගුකිරීමේ හා සහතික කිරීමේ ආයතන | | |
| 21 | Sri Lanka Climate Fund | ISO 14064-1: 2018, - Organizational level verification<br>Manufacturing -Manufacturing of Food and Food Processing<br>Manufacturing of Textile and Wearing Apparel<br>Manufacturing of Chemical, Petroleum, rubber and plastic product,<br>Manufacturing of Electric and electronic equipment<br>Manufacturing of Paper and Paper produc<br>Transport - Transportation<br>General - Facility based Services<br>(Banking and Financial Services, Hospital, Hotel, Facility Management, Education)<br>Power Generation and Power transactions - Renewable energy systems and purchased electricity<br>Pulp, Paper and Print<br>Mining and mineral production-(Manufacturing of cement clinker and production of lime or calcination of dolomite or magnetite ,glass and ceramic, mineral wool) |

මූලාශ්‍රය: අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය

### iii. ආදායම් උත්පාදනය ( 2023.01.01. සිට 2023.09.30 දක්වා )

*වගු අංකය 3. 20 අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය 2023.01.01 වන දින සිට 2023.09.30 වන දින දක්වා ආදායම් උත්පාදනය*

| ආදායම් වර්ගීකරණය | දේශීය අනුකූලතා තක්සේරු ආයතන මඟින් ආදායම(රු.මි) | විදේශීය අනුකූලතා තක්සේරු ආයතන මඟින් ආදායම (රු.මි) |
|---|---|---|
| **ප්‍රතීතන** | | |
| රසායනාගාර පරීක්ෂණ | 28.56 | |
| ක්‍රමාංකනාගාර | 6.00 | |
| වෛද්‍ය රසායනාගාර | 6.88 | |
| පරීක්ෂණ ආයතන | 1.81 | |
| නිෂ්පාදන සහතිකකරණ ආයතන | 2.98 | 76.68 **(USD 242,405.5)** |
| පද්ධති සහතිකකිරීමේ ආයතන | 4.75 | |
| පුද්ගල සහතිකකිරීම | 1.44 | |
| වලංගුකිරීමේ හා සහතිකකිරීමේ ආයතන | 1.64 | 2.60 **(USD 8,838.35)** |
| නිපුනතා පරීක්ෂණ ආයතන | 0.70 | |
| **පුහුණු වැඩසටහන්** | 7.47 | |
| **මුළු ආදායම** | **62.23** | **79.28 (USD 251,243.85)** |
| **දේශීය මුදල් හා ඩොලර් ආදායම මුළු ආදායමේ ප්‍රතිශතයක් ලෙස** | **43.98%** | **56.02%** |

මූලාශ්‍රය: අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය

## 3.8. ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල

### i. 2023 ශිෂ්‍යත්ව ගෙවීම් පිළිබඳ තොරතුරු (විශ්ව විද්‍යාල හා අනෙකුත් ආයතන)

*වගු අංකය 3. 21 2023 මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව ගෙවීම් පිළිබඳ තොරතුරු (විශ්ව විද්‍යාල හා අනෙකුත් ආයතන)*

| මාසය | විශ්ව විද්‍යාල සඳහා රු.5,000 ශිෂ්‍යත්වය ලබන සිසුන් ගණන | අනෙකුත් ආයතන සඳහා රු.2,500 ශිෂ්‍යත්වය ලබන සිසුන් ගණන | මහපොළ භාරකාර අරමුදලේ දායකත්වය (රු.) | භාණ්ඩාගාරයේ දායකත්වය (රු.) | මාසිකව මහපොළ ශිෂ්‍යත්ව සඳහා ගෙවනු ලබන මුළු මුදල (රු.) |
|---|---|---|---|---|---|
| ජනවාරි | 188,744,400 | 2,863,500 | 99,218,400 | 92,389,500 | 191,607,900 |
| පෙබරවාරි | 180,173,400 | 1,778,500 | 93,761,700 | 88,190,200 | 181,951,900 |
| මාර්තු | 185,125,100 | 2,616,000 | 97,122,950 | 90,618,150 | 187,741,100 |
| අප්‍රේල් | 123,169,800 | 3,966,000 | 66,824,150 | 60,311,650 | 127,135,800 |
| මැයි | 172,607,150 | 7,470,650 | 95,592,000 | 84,485,800 | 180,077,800 |
| ජුනි | 152,906,900 | 3,318,896 | 81,385,646 | 74,840,150 | 156,225,796 |
| ජුලි | 154,934,350 | - | 79.131,350 | 75,803,000 | 154,934,350 |
| එකතුව | **1,157,661,100** | **22,013,546** | **613,036,196** | **566,638,450** | **1,179,674,646** |

මූලාශ්‍රය: ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල

## ii. ශිෂ්‍යත්ව ප්‍රදානය

*වගු අංකය 3. 22 මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව ප්‍රධානය පිළිබඳ තොරතුරු*

| සිසුන් ඇතුළත් කරගැනීම | 2018/19 | 2019/20 | 2020/21 | 2021/22 | ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| විශ්වවිද්‍යාල සිසුන් | 14,984 | 15,001 | 16,000 | 16,000 | 61,985 |
| උසස් අධ්‍යාපන තාක්‍ෂණ ආයතන සිසුන් | 1,500 | 1,500 | 1,500 | 1,500 | 6,000 |
| අනෙකුත් ආයතන සිසුන් | 1,000 | 1,151 | 1,000 | 1,000 | 4,151 |
| **එකතුව** | **17,484** | **17,652** | **18,500** | **18,500** | **72,136** |

**මුලාශ්‍රය: ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල**

## iii. විශ්ව විද්‍යාල ප්‍රවේශිත මුළු ශිෂ්‍යත්ව සංඛ්‍යාව හා මහපොළ ශිෂ්‍යත්වලාභීන් අතර සැසඳීම

*වගු අංකය 3. 23 විශ්ව විද්‍යාල ප්‍රවේශිත මුළු ශිෂ්‍යත්ව සංඛ්‍යාව හා මහපොළ ශිෂ්‍යත්වලාභීන් අතර සැසඳීම*

| වර්ෂය | 17/18 | 18/19 | 19/20 | 20/21 | 21/22 |
|---|---|---|---|---|---|
| විශ්වවිද්‍යාලවලට ඇතුලත් වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | 30,000 | 31,158 | 34,161 | 35,000 | 40,111 |
| ආදායම් සීමාව ( රු.ලක්‍ෂ 5 ට අඩු) අනුව සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව | 15,000 | 20,000 | 17,890 | 20,000 | 26,000 |
| මහපොළ ශිෂ්‍යත්වලාභීන් සංඛ්‍යාව | 14,500 | 14,984 | 15,001 | 16,000 | 16,000 |
| ආදායම් සීමාව අනුව සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව මුළු ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස | 50% | 64.1% | 52% | 57.1% | 64.88% |
| මහාපොළ ලාභීන් මුළු ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස | 48% | 48.% | 44% | 45.71% | 39.88% |
| ආදායම් සීමාව අනුව සුදුසුකම් ලැබූ සිසුන් අතරින් මහපොළ ලැබූ සිසුන් | 96% | 75% | 84% | 86% | 61.5% |

**මුලාශ්‍රය: ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල**

## 3.9. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

### i. 2023 ජනවාරි සිට සැප්තැම්බර් මාසය දක්වා ආයතනයේ ප්‍රගතිය

*වගු අංකය 3. 24 2023 ජනවාරි සිට සැප්තැම්බර් මාසය දක්වා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ ක්‍රියාකරකම්හි ප්‍රගතිය*

| විස්තරය | ප්‍රමාණය |
|---|---|
| **පාරිභෝගික ආරක්ෂණය හා සහන සේවා** | |
| වෙළෙඳපොළ වැටලීම් | 18,015 |
| නඩු පැවරීම් | 16,397 |
| සුපිරි වෙළෙඳසැල් වැටලීම් ප්‍රමාණය | 540 |
| දඩ මුදල් (රුපියල්) | 200,761,400.00 |
| **පාරිභෝගික දැනුවත් කිරීමේ වැඩසටහන්** | |
| මහජන දැනුවත්කිරීම් | 255 |
| වෙළෙඳ  දැනුවත්කිරීම් | 41 |
| පාසල් දැනුවත්කිරීම් | 93 |
| ප්‍රදර්ශන | 7 |
| ජංගම දැනුවත්කිරීම් (වෙළෙඳ සහ මහජන) | 393 |
| විශේෂ දැනුවත්කිරීම් | 20 |
| **ලිඛිතව ලැබෙන පාරිභෝගික සහන පැමිණිලි** | |
| නව පැමිණිලි ලැබීම් | 1,100 |
| පාරිභෝගික කටයුතු පිළිබඳ පනත ප්‍රකාරව මැදිහත්විය හැකි පැමිණිලි | 491 |
| පාරිභෝගික කටයුතු පිළිබඳ ප්‍රකාරව මැදිහත්විය නොහැකි පැමිණිලි | 609 |
| ප්‍රධාන කාර්යාලය මඟින් දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත යොමු කරන පැමිණිලි | 45 |
| ක්‍රියාමාර්ග ගෙන අවසන් කරන ලද පැමිණිලි | 246 |
| වෙනත් ආයතන වෙත යොමු කරන ලද පැමිණිලි | 247 |
| අනුකූලවීම් හා බලගැන්වීවේ අංශය වෙත යොමු කරන ලද පැමිණිලි | 114 |
| ප්‍රධාන කාර්යාලයේ වෙනත් අංශ වෙත යොමු කරන ලද පැමිණිලි | 4 |
| සහනය ලබා දීමට නොහැකි හෝ ඉදිරි ක්‍රියාමාර්ග ගත නොහැකි පැමිණිලි (ප්‍රතික්ෂේප කිරීමේ/අනුපිටපත්/බැහැර තබන ලද) | 300 |
| වැටලීම් සඳහා යොමු කරන ලද ලිඛිත පැමිණිලි (1977) | 66 |
| මාසයේ අවසන් දිනට ක්‍රියාමාර්ග ගැනීමට නියමිත පැමිණිලි | 78 |

| විස්තරය | ප්‍රමාණය |
|---|---|
| සමථ කිරීමට මැදිහත් වූ පැමිණිලිවල වටිනාකම (රුපියල්) | 25,694,645.80 |
| **ලිඛිතව ලැබෙන පාරිභෝගික සහන පැමිණිලි - දිස්ත්‍රික් කාර්යාල (2023.09.30 දිනට Google දත්ත පද්ධතියට අනුව)** | |
| මුළු පැමිණිලි සංඛ්‍යාව | 414 |
| සමථයට පත්කළ පැමිණිලි සංඛ්‍යාව | 146 |
| ක්‍රියාමාර්ග ගෙන අවසන් කරන ලද පැමිණිලි | 124 |
| ප්‍රධාන කාර්යාලය/ අනුකූලවීම් හා බලගැන්වීම් අංශය වෙත යොමු කරන ලද පැමිණිලි | 21 |
| මාසයේ අවසන් දිනට ක්‍රියාමාර්ග ගැනීමට නියමිත පැමිණිලි | 32 |
| **1977 පාරිභෝගික කෙටි පැමිණිලි සේවය (1977 Consumer Hotline)** | |
| මුළු පැමිණිලි ප්රමාණය | 5,528 |
| ක්‍රියාමාර්ග ගත මුළු පැමිණිලි සංඛ්‍යාව | 3,022 |
| සාර්ථක වැටලීම් ප්‍රමාණය | 1,361 |
| අසාර්ථක වැටලීම් ප්‍රමාණය | 652 |
| වෙළෙඳසල් වසා තැබීම | 124 |
| පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට අයත් නොවන පැමිණිලි | 181 |
| අවවාද කිරීම්/දැනුවත් කිරීම් | 571 |
| ස්ථාන හඳුනා නොගැනීම් | 133 |
| ක්‍රියාමාර්ග ගැනීමට නියමිත පැමිණිලි සංඛ්‍යාව | 2,506 |
| **1977 විද්‍යුත් තැපැල වෙත ලැබෙන පාරිභෝගික පැමිණිලි (Voice Mail)** | |
| මාසය තුල ලැබුණු මුළු හඬ පණිවිඩ සංඛ්‍යාව (Voice Message) | 6,838 |
| පාරිභෝගික පැමිණිල්ලක් අන්තර්ගතව පවතී පණිවුඩ සංඛ්‍යාව | 681 |
| **ප්‍රාදේශීය කටයුතු ඒකකය වෙත ලැබෙන ලිඛිත පාරිභෝගික පැමිණිලි** | |
| මාසය තුල ලැබුණු මුළු පැමිණිලි සංඛ්‍යාව | 27 |
| ප්‍රාදේශීය කටයුතු ඒකකය මඟින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත යොමු කරන ලද පැමිණිලි | 27 |
| **අභියාචනා** | |
| අභියාචනා ලැබීම | 520 |
| නඩු පැවරීමට තීරණය කිරීම | 209 |

| විස්තරය | ප්‍රමාණය |
|---|---|
| අවවාද කිරීමට තීරණය කිරීම | 126 |
| තීරණය සඳහා අභියාචනා මණ්ඩලයට ඉදිරිපත් කිරීමට නියමිත අභියාචනා | 185 |
| **සාම්පල පරික්ෂා කිරීම්** | |
| පරික්ෂා කල සාම්පල් | 119 |
| ආහාර ද්‍රව්‍ය සම්බන්ධ සාම්පල | 58 |
| ආහාර නොවන ද්‍රව්‍ය සම්බන්ධ සාම්පල | 61 |
| අනුකුල නොවූ සාම්පල | 57 |
| අනුකුල නොවූ සාම්පල | 32 |
| වාර්තා ලැබීමට නියමිත සාම්පල | 30 |
| නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට යොමු කර ඇති සාම්පල | 32 |
| පරික්ෂා කල නොහැකි සාම්පල | - |
| **තෝරාගත් ආනයනික භාණ්ඩ වල උපරිම සිල්ලර මිළ සම්බන්ධ යොමු කිරීම්** | |
| තරගකාරිත්ව ප්‍රවර්ධන අංශය වෙතින් ලැබුණු අයදුම්පත් ප්‍රමාණය | 62 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත යොමු කරන ලද අයදුම්පත් ප්‍රමාණය | 62 |

**මූලාශ්‍රය: පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය**

ii. පාරිභෝගික සේවා අධිකාරියට දෝෂ සහගත භාණ්ඩ පිළිබඳව ලැබෙන පැමිණිලි කඩිනමින් විමර්ශනය කිරීම හා ඒවා පිළිබඳව නිත්‍යානුකූලව කටයුතු කිරීම.

- පරීක්ෂණ සඳහා ලැබුණු නව පැමිණිලි 254
- පාරිභෝගික පැමිණිලි සම්බන්ධයෙන් පවත්වනු ලබන විමසීම් 640
- විමර්ශනවලදී පැමිණිලි විසඳීම 101
- නියෝග නිකුත් කිරීම් 62
- පනතේ 11,30,31,57 වගන්ති යටතේ ගොනු කරන ලද අධිකරණ නඩු 79
- උසාවි මගින් නියම කරන ලද දඩ මුදල් ප්‍රමාණය රු. 637,000

**iii. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනතේ 14, 18 සහ 19 හි විධිවිධාන යටතේ තෝරාගත් අත්‍යවශ්‍ය භාණ්ඩ හරහා වෙළෙඳාම පහසු කිරීම සඳහා මැදිහත් වීම**

*වගු අංකය 3. 25 පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය තෝරාගත් අත්‍යවශ්‍ය භාණ්ඩ හරහා වෙළෙඳාම පහසු කිරීම සඳහා මැදිහත් වීම*

| අනු අංකය | භාණ්ඩය | ප්‍රතිඵලය |
|---|---|---|
| 1 | සිමෙන්ති | රු. 2,950/= බෑගයක් සිට.රු. 1,920/=-1,950/= |
| 2 | යකඩ | එකකට.රු.320,000/= සිට රු. 245,000/= දක්වා |
| 3 | කේබල් සහ වයර් | ඇතැම් වයර් වර්ග, සමාගම් මිල අඩු කිරීමට ඉදිරිපත් වී ඇත |

| අනු අංකය | **භාණ්ඩය** | **ප්‍රතිඵලය** |
|---|---|---|
| 4 | පූර්ණ යොදය සහිත කිරිපිටි | කිලෝවකට රු. 3,100/- සිට කිලෝවකට රු. 2,375/= - රු. 2700/- අතර |
| 5 | සපත්තු | 10% සිට 15% දක්වා මිල අඩු කර ඇත |
| 6 | පාසල් බෑග් | ප්‍රමාණවත් නොවන දත්ත හේතුවෙන් ප්‍රතික්ෂේප විය |
| 7 | ඇලුමිනියම් | ආන්තිකය පාලනය කළ යුතුය. |
| 8 | කුකුල් මස් | රු, 1,350 සිට රු. 1,150/= |
| 9 | පාන් | රු.. 170/= සිට රු. 150/= |
| 10 | ලූණු | ආන්තිකය පාලනය කළ යුතුය. |
| 11 | තිරිඟු පිටි | වරින් වර මිල අඩු කිරීම් සිදු කර ඇත |
| 12 | කුළුබඩු (මිරිස් කුඩු) | පරිමාණය සහ ගුණාත්මකභාවය මත පදනම්ව මිල වෙනස් වේ. |
| 13 | තිරිඟු පිටි, මුං ඇට, බඩ ඉරිඟු | ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා වෙළෙඳ සහ තීරුබදු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී |
| 14 | දේශීය කිරිපිටි, දේශීය සීනි, උඳු සහ පොහොර | කාර්යක්ෂමතාව වැඩිදියුණු කළ යුතු අතර දේශීය කිරිපිටි මිල කුඩා ප්‍රතිශතයකින් මිල අඩු කර ඇත. |
| 15 | රසායනාගාර ගාස්තු | පරීක්ෂණ ගාස්තු 25කට වඩා අධ්‍යයනය කර ඇත. |
| 16 | සබන් සහ ටින් මාළු. කුළුබඩු (තුනපහ සහ කහ) | දැනට සිදුවෙමින් පවතී |
| 17 | මේදය, සබන් සහ ටින් මාළු. විශේෂ (කරපිංචා සහ කහ) | දැනට සිදුවෙමින් පවතී |
| 18 | මාළු මිල | අමාත්‍යවරයා වෙත වාර්තාවක් ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි මත්ස්‍ය මිල නියම කිරීමේ ව්‍යුහය පිළිබඳව විශේෂඥ කමිටුව මේ වන විට අධ්‍යයනය කරමින් සිටී. |
| 19 | අභ්‍යාස පොත් | අධිකාරියේ නිර්දේශ ජනාධිපති ලේකම් කාර්යාලයට ලබාදී ඇත. |
| 20 | ව්‍යුහාත්මක නොවන ප්‍රෝටීන් (NS 01) සහ සම්පූර්ණ රුධිර ප්‍රමාණය පිළිබඳ ඩෙංගු ප්‍රතිදේහජනක පරීක්ෂණය | ගැසට් නිවේදනය නැවත සලකා බැලීම සඳහා |
| 21 | කුකුළු පැටවෙකු සඳහා යන ඇස්තමේන්තු පිරිවැය | මිල තීරණය කිරීමට වෙළෙඳපොළ යාන්ත්‍රණයට අවසර දී ඇත |
| 22 | සම්පූර්ණ යොදය සහිත කිරිපිටි, තිරිඟු පිටි, සීනි, වියළි හාල්මැස්සන්, පරිප්පු වැනි අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය මිල ගණන් | ප්‍රතිපත්ති තීරණ සහ පාර්ශවකරුවන්ගේ සාකච්ඡා සඳහා රේඛීය අමාත්‍යාංශය වෙත තොරතුරු ඉදිරිපත් කිරීම. |

**මූලාශ්‍රය: පරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය**

**iv. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි මඟින් අමාත්‍යාංශ සහ පාර්ශවකරුවන් වෙත තොරතුරු බෙදා හැරීම හරහා වෙළඳාමට පහසුකම් සැලසීම**

*වගු අංකය 3. 26 පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි මඟින් අමාත්‍යාංශ සහ පාර්ශවකරුවන් වෙත තොරතුරු බෙදා හැරීම*

| අංකය | විස්තරය |
|---|---|
| **1** | දෛනික මිල රැස්කිරීමේ වාර්තා ඉදිරිපත් කිරීම - 173 |
| **2** | සිල්ලර මිල විචලනය - 18 |
| **3** | අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය - 18 |
| **4** | ලබා ගත හැකි සමීක්ෂණ වාර්තාව - නිෂ්පාදනය සහ පුරෝකථනය |
| **5** | සිනි සඳහා වූ ශේෂ පත්‍රය |
| **6** | වෙළෙඳපළ සමීක්ෂණ පැවැත්වීම සහ තොරතුරු සංසරණය කිරීම |
| **7** | ගබඩා ලියාපදිංචිය යටතේ ලැබුණු අයදුම්පත් යාවත්කාලීන කර, ඉල්ලීම මත බැංකු වෙත තහවුරු කිරීම් ලබාදීම |
| **8** | අධිකරණ නඩු වලට අදාළ තොරතුරු ඉදිරිපත් කිරීම |

**මූලාශ්‍රය: පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය**

**v. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනතේ විධිවිධාන සහ භාවිතයන් හරහා පාරිභෝගික උනන්දුව වැඩි දියුණු කිරීම සහ සුරක්ෂිත කිරීම**

•නව ආහාර ද්‍රව්‍ය සහ සෞඛ්‍ය සම්බන්ධ පාරිභෝගික භාණ්ඩ හඳුනාගැනීම් - 04
•පැමිණිලි විසඳා / නියෝග නිකුත් කිරීම් - 01

**vi. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි මඟින් පරීක්ෂණ පැවැත්වීම සහ තරඟකාරී විරෝධී සහ අසාධාරණ වෙළෙඳ භාවිතයන් පිළිබඳ පැමිණිලි සම්බන්ධයෙන් මැදිහත් වීම**

- සිදුකරන ලද පරීක්ෂණ - 15
- පසුගිය කාලසීමාවෙන් ලැබුණු පැමිණිලි - 06
- කාල සීමාව තුළ ලැබුණු පැමිණිලි - 33
- ආරවුල් විසඳීම් - 24

**vii. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි මඟින් තරඟකාරීත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා වෙළඳුන් සඳහා උපදේශන වැඩසටහන් පැවැත්වීම**

- පවත්වන ලද වැඩසටහන් ගණන - 08

**viii. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි මඟින් රෙගුලාසි ක්‍රියාත්මක කිරීම අංක 87. (5 HS කේත)**

- ලැබුණු අයදුම්පත්වලට එරෙහිව නිකුත් කරන ලද යොමු අංක - 67

**ix. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි මඟින් විවෘත වෙළෙඳපොලේ නිරීක්ෂණය කරන ලද හඳුනාගත් නිෂ්පාදනවල වෙළෙඳ නාම**

- නිරීක්ෂණය කරන ලද හඳුනාගත් නිෂ්පාදන ගණන - 10

**x. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි මඟින් සෞඛ්‍ය සම්පන්න සමාජයක් ප්‍රවර්ධනය කිරීම සඳහා පර්යේෂණ හා සංවර්ධන අධ්‍යයන පැවැත්වීම**

- වෙළෙඳපල බුද්ධි සමීක්ෂණ පැවැත්වීම
- සිදු කරන ලද වෙළෙඳපල බුද්ධි සමීක්ෂණ ගණන - 11
- ඉදිරිපත් කරන ලද වාර්තා - 02

## 3.10. සමුපකාර සේවක කොමිෂන් සභාව

- කොමිෂන් සභාවට 2023 වසරේ මේ දක්වා ඉදිරිපත් කෙරුණු අභියාචනා 24 ක් සම්බන්ධයෙන් අවශ්‍ය පරීක්ෂණ පවත්වා ඒ පිළිබඳ කොමිෂන් සභාවේ තීරණය දැනුම් දී ඇත.

- සමුපකාර ක්ෂේත්‍රයේ උපදේශන සේවා සැපයීම යටතේ අවස්ථා 47 කදී සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් උපදේශන ලබාදීම සිදුකර ඇත.

- සමුපකාර සමිතිවලට සේවකයින් බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධව 2023 වසරේ මේ දක්වා කාලය තුල ඉදිරිපත් වූ ඉල්ලීම් 76 ක් සඳහා කොමිෂන් සභාවේ තීරණය අදාල සමුපකාර සමිති / සංගම් වෙත දැනුම් දී ඇත.

- ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් 2019 වසරට අදාලව සිදු කල මූල්‍ය හා කාර්යසාධනය පිළිබඳ ඇගයීම් ක්‍රියාවලිය යටතේ සම්මාන සහතික පත්‍රයක් දිනාගනිමින් සමුපකාර සේවක කොමිෂන් සභාව ඇගයීමට ලක් වී ඇත.

- සමුපකාර ක්ෂේත්‍රයේ මානව සම්පත් සංවර්ධනය හා කළමනාකරණය සඳහා සමුපකාර සේවකයන් දැනුවත් කිරීමේ වැඩමුළු 05 ක් පවත්වා ඇත.

*වගු අංකය 3. 27 සමුපකාර ක්ෂේත්‍රයේ මානව සම්පත් සංවර්ධනය හා කළමනාකරණය සඳහා පැවැත්වූ සමුපකාර සේවකයන් දැනුවත් කිරීමේ වැඩමුළු*

| වැඩමුළුව පැවැත්වූ සමිතිය / සංගමය | සහභාගීත්වය |
|---|---|
| සී/ස තැපැල් හා ටෙලිකොම් සේවක සමුපකාර බැංකු සමිතිය | 36 |
| සී/ස සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සමුපකාර සහ ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 162 |
| ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය | 31 |
| සී/ස ශ්‍රී ලංකාවේ සකසුරුවම් හා ණය ගනුදෙනු සමුපකාර සමිති මහා සංගමය | 26 |
| සී/ස රාජ්‍ය සේවා සමුපකාර ණය දීමේ හා ඉතිරි කිරීමේ සමිතිය | 44 |

**මූලාශ්‍රය: සමුපකාර සේවක කොමිෂන් සභාව**

## 3.11. ජාතික සමුපකාර සංවර්ධන ආයතනය

### i. අධ්‍යයන අංශයේ පාඨමාලා ප්‍රගතිය

*වගු අංකය 3. 28 ජාතික සමුපකාර සංවර්ධන ආයතනය විසින් පාඨමාලා පැවැත්වීමේ ප්‍රගතිය*

| අනු අංකය | පාඨමාලා වර්ගය | ඉලක්කගත පාඨමාලා ප්‍රමාණය | සත්‍ය වශයෙන් ක්‍රියාත්මක කළ පාඨමාලා ප්‍රමාණය | ඉලක්කගත සහභාගීත්වය | සත්‍ය සහභාගීත්වය | ලැබී ඇති සත්‍ය ආදායම (රු.) |
|---|---|---|---|---|---|---|
| 1 | නිත්‍ය පුහුණු පාඨමාලා | **01** | **01** | **67** | **67** | **1,115,040.00** |
| 2 | ඩිප්ලෝමා පාඨමාලා | **07** | **06** | **30** | **214** | **3,763,000.00** |
| 3 | සහතිකපත්‍ර පාඨමාලා | **03** | **04** | **30** | **78** | **1,563,250.00** |
| 4 | කෙටිකාලීන පාඨමාලා | **22** | **14** | **40** | **455** | **1,826,650.00** |
| | බාහිර ඉල්ලීම මත | **-** | **16** | **-** | **583** | **4,007,298.43** |
| | කෙටිකාලීන පාඨමාලා (නොමිලයේ) | **38** | **04** | **40** | **112** | **-** |

**මූලාශ්‍රය: ජාතික සමුපකාර සංවර්ධන ආයතනය**

### ii. ආයතන අංශයේ ප්‍රගතිය

*වගු අංකය 3. 29 ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ ආයතන අංශයේ ප්‍රගතිය*

| කාර්යභාරය | ප්‍රගතිය |
|---|---|
| ජාත්‍යාන්තර සමුපකාර දින ආයතනික වැඩසටහන | COOP සහන Saturday' නමින් වෙළෙඳ ප්‍රදර්ශනයක් මහනුවර සහස් උයනේ දී 01.07.2023 දින දී පවත්වන ලදී. |
| වාර්ෂික සහතිකපත්‍ර ප්‍රදානෝත්සවය | මෙය 2023.07.28 දින මහින්ද රාජපක්ෂ රඟහලේදී පවත්වන ලදී. මේ සඳහා ඩිප්ලෝමාධාරීන් 476 ද සහතිකපත්‍රලාභීන් 512 ද සුදුසුකම් ලබන ලදී. |
| වාර්ෂික සමුපකාර කථිකාවතක් පැවැත්වීම | රේඛීය හා පළාත් සමුපකාර සේවක කොමිෂන් සහ සමඟ සබඳතා ප්‍රවර්ධනය කර ගැනීමේ සාකච්ඡාවක් 2023.09.22 දින සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරුන් සහ සභාපතිවරුන්, පළාත් කොමසාරිස්වරුන් සහ සහකාර කොමසාරිස්වරුන්ගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී. |

<table>
<tr><th>කාර්යභාරය</th><th>ප්‍රගතිය</th></tr>
<tr><td>අන්තර්ජාතික සමුපකාර සංවිධාන සමඟ වැඩසටහන් පැවැත්වීම</td><td>මෙම වැඩසටහන් දේශීය හා විදේශීය පුහුණුලාභීන් හා සම්පත්දායකයින්ගේ සහභාගීත්වයෙන් සාර්ථකව අවසන් කර ඇත.
<table>
<tr><th>වැඩසටහන</th><th>පැවැත් වූ දිනය</th><th>ලද ආධාර මුදල (රු)</th><th>සියළු වියදම් දැරූ පසු අතිරික්තය (රු)</th></tr>
<tr><td>01</td><td>2023.01.23-26 දක්වා</td><td>878,000.00</td><td>97,498.97</td></tr>
<tr><td>02</td><td>2023.03.27-29 දක්වා</td><td>699,529.78</td><td>68,846.78</td></tr>
</table></td></tr>
<tr><td>ආයතන පරිශ්‍රයේ වෙළෙඳ ප්‍රදර්ශනයක් පැවැත්වීම</td><td>“COOP සහන Saturday” නමින් පාරිභෝගික වෙළෙඳ ප්‍රදර්ශනය හා සමගාමීව මහනුවර සහස් උයන වෙළෙඳ පරිශ්‍රයේ වෙළෙඳ කුටියක් සුහසාධන සංගමය හරහා සෑම සෙනසුරාදා දිනකම පවත්වාගෙන යාමට කටයුතු කිරීමට අනුගාමීව මධ්‍යම පළාත් කර්මාන්ත ප්‍රදර්ශනයේ වෙළෙඳ කුටියක් පවත්වා ගෙන යාමට නියමිතය.</td></tr>
<tr><td>සමාජ වගකීම් පිළිබඳ කාර්යයන් ඉටු කිරිම</td><td>මෙවර ජගත් පරිසර දින සැමරීම වෙනුවෙන් වූ “ප්ලාස්ටික් මඟින් සිදුවන දූෂණය පිටු දකිමු” යන තේමාව යටතේ ආයතන පරිශ්‍රයට පැමිණෙන බාහිර පාර්ශවයන් දැනුවත් කිරීමට විවිධ වැඩසටහන් කිහිපයක් සංවිධානය කිරීම සහ කාර්ය මණ්ඩලයේ දායකත්වයෙන් ශ්‍රමදාන වැඩසටහනක් සංවිධානය කර ආයතන පරිශ්‍රයේ පැවැති ප්ලාස්ටික් අපද්‍රව්‍ය රැස් කර ප්‍රතිචක්‍රීකරණය කිරීම සඳහා පාතදුම්බර ප්‍රාදේශීය සභාව වෙත යැවීමට කටයුතු කර ඇත.<br>රටේ පවතින ආර්ථික අර්බුදය හමුවේ රජයේ සම්පත් උපරිම ලෙස උපයෝජනය කරනු වස් මෙම ආයතනයේ භූමිය ප්‍රශස්ථ ලෙස භාවිතා කිරීමේ වැඩපිළිවලක් ලෙස දැනට වගා කර ඇති පොල් පැල සඳහා පොහොර යොදමින් මනා ලෙස නඩත්තු කිරීමට සහ තවදුරටත් පොල් පැල සිටුවිය හැකි අවකාශය සොයා බලා එම කාර්ය ඉටු කිරීමට 157 වන කළමනාකාරණ මණ්ඩල රැස්වීමේදී තීරණය වී ඇත.<br>එසේම ආයතන භූමිය භෝග වලින් සශ්‍රීක කිරීම සඳහා වගා කළ හැකි කෙටි කාලීන භෝග හඳුනාගෙන එම භෝග වගා කිරීමට ද අවශ්‍ය මූලික කටයුතු සූදානම් කරමින් පවති.</td></tr>
<tr><td>සේවා ගුණාත්මකභාවය වර්ධනය කිරීම.(ඵලදායීතා වැඩසටහන)</td><td>ආයතනයේ නිලධාරීන් සහභාගි කරවාගෙන ඵලදායීතා කව ස්ථාපිත කර, කව මඟින් ඉටුකළ හැකි ක්‍රියාකාරකම් හඳුනා ගැනීමට කටයුතු කර ඇත.</td></tr>
<tr><td>තිරසාර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීම</td><td>2023 සමුපකාර දින තේමාව අනුව සමුපකාර සංවර්ධනය සඳහා තිරසර සංවර්ධනය යන්න තේමා කර ගනිමින් 101 වන ජාත්‍යන්තර සමුපකාර දිනය සමගාමීව නව පිවිසුම සඟරාව එළි දැක්විණ.</td></tr>
</table>

| කාර්යභාරය | ප්‍රගතිය |
|---|---|
| කාර්යය මණ්ඩල පුහුණුව | රාජ්‍ය වියදම් පාලනය යටතේ අතවාවශ්‍ය පුහුණු අවස්ථා සඳහා පමණක් නිලධාරීන් යොමු කිරීමට නියෝග ලැබී ඇත. (නිලධාරීන් 22ක් පුහුණු වැඩමුළු සඳහා යොමු කර ඇති අතර නිලධාරීන් 06 දෙනෙකු පුහුණු වැඩමුළුව අවසන් කර ඇත.) මෙම ආයතනය අධ්‍යයන ආයතනයක් වන බැවින් විශේෂයෙන් අධ්‍යයන කාර්ය මණ්ඩලයේ දැනුම යාවත්කාලීන වීම අත්‍යාවශ්‍ය කරුණක් වී ඇත. එම නිසා කාර්ය මණ්ඩලය සඳහා පුහුණු අවස්ථා ලබා දීමට අනුමැතිය ඉල්ලා අයවැය අධ්‍යක්ෂ වෙත 2023.09.15 දිනැතිව ලිපියක් යොමු කර ඇත. |
| කාර්යය මණ්ඩල ඇගයීම | මේ වන විට වාර මැද කටයුතු අවසන් කර ඇත. |
| කාර්යය මණ්ඩල සුභසාධනය | නිලධාරීන් වෙනුවෙන් වෛද්‍ය සායනයක් පැවැත්වීමට කටයුතු සූදානම් කරමින් පවතින අතර මේ සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කර දෙන මෙන් ලිඛිත ඉල්ලීමක් කර ඇති අතර පිළිතුරු ලද වහාම ඒ සම්බන්ධව ක්‍රියාත්මක වීමට සැලසුම් කර ඇත.රාජ්‍ය වියදම් කළමනාකරණය යටතේ ආයතනික කාර්ය මණ්ඩල පුහුණු අවශ්‍යතා, කාර්ය මණ්ඩල අභිප්‍රේරණ වැඩමුළු ඇතුළු කාර්ය මණ්ඩලයේ ආතතිය, අතෘප්තිය විතැන් කිරීමට හේතුවන කාර්යයන් වෙනුවෙන් මුල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම සීමා කර ඇත. එයට විකල්පයක් ලෙස මෙම ආයතනයේ සේවක සුභ සාධක සංගමය විසින් සේවා සැපයීමේ යෝජනාවලියක් ක්‍රියාත්මක කර ලැබෙන සේවා පහසුකම් වලින් සේවක පුහුණු කිරීම්, සේවක අභිප්‍රේරණ වැඩසටහන් සඳහා යම් දායකත්වයක් ලබා දීමට හැකි බවට යෝජනාවක් ඉදිරිපත් කර ඇත. එම යෝජනාව 2023.09.27 දින පැවැත්වෙන ආයතනික කළමනාකරණ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කර ඇත. |
| කාර්යය මණ්ඩල රක්ෂණාවරණය | 149 වැනි කළමනාකරණ මණ්ඩල රැස්වීමේ තීරණය පරිදි රක්ෂණාවරණක් ලබා ගැනීමට තවදුරටත් බාධාවක් පවතින බව එම සමාගමෙන් කරන ලද විමසීමේ දී දැන්වීම හේතුවෙන් වෙනත් රජයේ රක්ෂණ සමාගමකින් හෝ කාර්ය මණ්ඩලයට වැඩි ප්‍රතිලාභ ලබා දෙන රක්ෂණ සමාගමකින් කළමනාකරණ මණ්ඩලය වෙත රක්ෂණාවරණයක් ලබා ගැනීමට ඇති හැකියාව පිළිබඳ සොයා බැලීමට කටයුතු කරමින් සිටි. |
| නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වීම | මෙය අගෝස්තු මස 05 වන දින පවත්වන ලදී. මේ සඳහා AR-1, MM 1-2, JM 1-1, MA-4, MA 1-1 යන වැටුප් කේතවල නිලධාරීන් 14 දෙනෙකු සහභාගී වී ඇත. |
| කළමනාකරණ මණ්ඩල කටයුතු | මේ වන විට කළමනාකරණ මණ්ඩල රැස්වීම් 08 ක් පවත්වා ඇත. |
| අධ්‍යයන මණ්ඩල කටයුතු | මේ වන විට අධ්‍යයන මණ්ඩල රැස්වීම් 02ක් පවත්වා ඇත. |
| වාර්ෂික වාර්තාව | 2022 වර්ෂයට අදාළ වාර්ෂික වාර්තාව මුද්‍රණ කටයුතු සඳහා යොමු කිරීමට නියමිතය. |
| කාර්යාල උපකරණ, ලී බඩු,ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ හා අනෙකුත් උපාංග | මේ යටතේ UPS යන්ත්‍ර 06ක් මිල දී ගෙන ඇත. |

**මූලාශ්‍රය: ජාතික සමුපකාර සංවර්ධන ආයතනය**

## iii. නේවාසික අංශයේ ප්‍රගතිය

*වගු අංකය 3. 30 ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ නේවාසික අංශයේ ප්‍රගතිය*

| උපාය මාර්ගික අරමුණු | පැවැත් වූ වැඩසටහන් සංඛ්‍යාව | සහභාගිත්වය | උප ක්‍රියාකාරකම් | ආදායම (රු) |
|---|---|---|---|---|
| බාහිර සංවිධාන සඳහා සේවා සැපයීම හා සංවර්ධනය | 30 | 16253 | ශ්‍රවණාගාරය | 6,366,640.00 |
| | 390 | | රැස්වීම් හා දේශන ශාලා | 3,496,050.00 |
| | | | නේවාසික පහසුකම් | 6,558,976.00 |
| | | | භෝජනාගාර පහසුකම් | 1,815,452.80 |
| | | | මුද්‍රණ හා ශ්‍රව්‍ය දෘශ්‍ය පහසුකම් | 777,100.00 |
| | | | වෙනත් | 325,461.00 |

මූලාශ්‍රය: ජාතික සමුපකාර සංවර්ධන ආයතනය

## iv. ආදායම් උත්පාදන වැඩසටහන් හා ඒවායේ ප්‍රගතිය

*වගු අංකය 3. 31 ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ ආදායම් උත්පාදන වැඩසටහන් හා ඒවායේ ප්‍රගතිය*

| විස්තරය | ඇස්තමේන්තු ගත ආදායම (රු.) | 2023 සැප්තැම්බර් මාසය සඳහා | | | 2023.09.30 න් අවසන් කාලය සඳහා | | |
|---|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තු ගත ආදායම (රු.) | සත්‍ය ආදායම (රු.) | ළඟා කරගත් ප්‍රමාණය (%) | ඇස්තමේන්තු ගත ආදායම (රු.) | සත්‍ය ආදායම (රු.) | ළඟා කරගත් ආදායම (%) |
| **පාඨමාලා ආදායම** | **21,984,792** | **1,786,321** | **2,458,018** | **138** | **15,067,308** | **16,111,558** | **107** |
| ශාලා පහසුකම්, නේවාසික පහසුකම්,කුලී පදනම මඟින් ලද ආදායම | **19,266,445** | **1,605,537** | **4,068,320** | **253** | **14,449,834** | **16,670,501** | **115** |
| **පොලී ආදායම** | **2,100,000** | **175,000** | **421,332** | **241** | **1,575,000** | **4,443,256** | **282** |
| **වෙනත් ආදායම්** | **3,745,000** | **299,583** | **616,905** | **206** | **2,667,917** | **5,083,036** | **191** |

මූලාශ්‍රය: ජාතික සමුපකාර සංවර්ධන ආයතනය

## 3.12. ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපල කාර්යාලය

### i. පේටන්ට් බලපත්‍ර

*වගු අංකය 3. 32 ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපල කාර්යාලය විසින් පේටන්ට් බලපත්‍ර ලබා දීමේ ප්‍රගතිය*

| විස්තරය | ජාතික | ජාත්‍යන්තර | පේටන්ට් සහයෝගිතා ගිවිසුම (PCT) | එකතුව |
|---|---|---|---|---|
| ලද අයදුම්පත් සංඛ්‍යාව | 139 | 14 | 167 | **320** |
| ද්විතීයික පරීක්ෂාවෙන් පසු ලියාපදිංචිය සඳහා පිළිගත් සංඛ්‍යාව | 48 | 22 | 76 | **146** |
| ද්විතීයික පරීක්ෂාව සිදු කර දෝෂ දක්වා යැවීම් සහ ප්‍රතික්ෂේපිත සංඛ්‍යාව | 26 | 1 | 118 | **145** |
| ප්‍රසිද්ධියට පත් කරන ලද සංඛ්‍යාව | 270 | 7 | 262 | **539** |
| ලියාපදිංචි කරන ලද සංඛ්‍යාව | 37 | 7 | 108 | **153** |

මූලාශ්‍රය: ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපල කාර්යාලය

### ii. කාර්මික සැලසුම්

*වගු අංකය 3. 33 ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපල කාර්යාලය විසින් කාර්මික සැලසුම් ලබා දීමේ ප්‍රගතිය*

| විස්තරය | ජාතික | ජාත්‍යන්තර | එකතුව |
|---|---|---|---|
| අයදුම්පත් සංඛ්‍යාව | 80 | 36 | **116** |
| ද්විතීයික පරීක්ෂාවෙන් පසු ලියාපදිංචිය සඳහා පිළිගත් සංඛ්‍යාව | 121 | 15 | **136** |
| ද්විතීයික පරීක්ෂාව සිදුකර ප්‍රතික්ෂේපිත සංඛ්‍යාව | 30 | 9 | **39** |
| ප්‍රසිද්ධියට පත් කරන ලද සංඛ්‍යාව | 34 | 4 | **38** |
| ලියාපදිංචි කරන ලද සංඛ්‍යාව | 45 | 13 | **58** |

මූලාශ්‍රය: ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපල කාර්යාලය

### iii. වෙළෙඳ ලකුණු

*වගු අංකය 3. 34 ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපල කාර්යාලය විසින් වෙළෙඳ ලකුණු ලබා දීමේ ප්‍රගතිය*

| විස්තරය | ජාතික | ජාත්‍යන්තර | එකතුව |
|---|---|---|---|
| අයදුම්පත් සංඛ්‍යාව | 5678 | 2239 | **7917** |
| ද්විතීයික පරීක්ෂා කරන ලද සංඛ්‍යාව | 3823 | 2282 | **6105** |
| පිළිගන්නා ලද අයදුම්පත් සංඛ්‍යාව | 2383 | 1995 | **4378** |
| ප්‍රතික්ෂේපිත අයදුම්පත් සංඛ්‍යාව | 1028 | 261 | **1289** |
| ප්‍රසිද්ධියට පත් කරන ලද සංඛ්‍යාව | 1912 | 1922 | **3834** |
| ලියාපදිංචි කරන ලද සංඛ්‍යාව | 1760 | 1331 | **3091** |

මූලාශ්‍රය: ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපල කාර්යාලය

# සිව්වන පරිච්ඡේදය

# 2024 - ඉදිරි සැලසුම්

## 04. 2024 - ඉදිරි සැලැසුම්

### 4.1. වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය

i. කොළඹ මාකන් මාකර් මාවතේ, සමුපකාර චතුරස්‍රය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ වැඩ කටයුතු ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

ii. 2024 වර්ෂය සඳහා දෙවන අදියර ලෙස කිකිළි පැටවුන් බෙදා දීමේ ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු.

iii. 2024 වර්ෂය සඳහා අඩු ආදායම් ලාභී ග්‍රාමීය කාන්තා ව්‍යවසායකයින් බල ගැන්වීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

### 4.2. ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව

2024 වසර තුළදී දඹුල්ල උෂ්ණත්වය හා ආර්ද්‍රතාවය පාලනය කරන ලද ගබඩා සංකීර්ණයේ මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීම.

### 4.3. මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව

i. නව මිනුම් ප්‍රමිති ස්ථාපනය කරමින් ජාතික මිනුම් පර්යේෂණාගාරයේ කාර්යභාරය පුළුල් කිරීම.

ii. මිනුම් ක්ෂේත්‍ර 5ක් සඳහා ජාතික මිනුම් පර්යේෂණාගාරයේ කාර්යභාරය පුළුල් කිරීම.

iii. දෙපාර්තමේන්තුවේ පුහුණු අංශයේ පාඨමාලා පිළිගත් වෘත්තීය පුහුණුවක් ලබා දීම දක්වා වැඩි දියුණු කිරීම. - ඇස්තමේන්තු මුදල රුපියල් මිලියන 9 කි.

iv. විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා මිනුම් විද්‍යාව විෂයක් ලෙස ඇතුළත් කිරීමට කටයුතු සම්පාදනය කිරීම.

v. මිනුම් ඒකක ප්‍රමිති හා සේවා පනත සහ රෙගුලාසි යාවත්කාලීන කිරීම. ඒ අනුව දෙපාර්තමේන්තු සේවාවන් මඟින් උපයන රාජ්‍ය ආදායම වර්ධනය කිරීම සහ දෙපාර්තමේන්තුව විසින් සපයන සේවාවන් විධිමත් කිරීම අරමුණු කර ඇත.

vi. ජාතික තත්ත්ව යටිතල පහසුකම් සපයන වෙනත් ආයතන සඳහා අන්තර්ජාතික පිළිගැනීම ලබාගැනීම සඳහා පහසුකම් සැලසීම.

vii. ස්වයංක්‍රීය ජාල පද්ධතියක් ස්ථාපිත කිරීම. - ඇස්තමේන්තු මුදල රුපියල් මිලියන 70 කි. මෙහි දී දිස්ත්‍රික් කාර්යාල 25 ප්‍රධාන කාර්යාලය සමඟ සම්බන්ධ කිරීමත් වෙළෙඳ දත්ත පද්ධතිය සකස් කිරීම තුළින් පාරිභෝගික ජනතාවට නිවැරදි හා විශ්වාසනීය කිරුම් මිනුම් සේවාවක් තහවුරු කිරීමත් අපේක්ෂිතය.

## 4.4. සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

### 2024 වසරේ දී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති / වැඩසටහන්

*වගු අංකය 4. 1 සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2024 වසරේ දී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති / වැඩසටහන්*

| අනු අංක | ව්‍යාපෘතියේ නම | ව්‍යාපෘතියේ අරමුණු |
|---|---|---|
| 01 | පෝෂණ ඌණතාවය අවම කිරීම උදෙසා ප්‍රෝටීන බහුල ආහාර නිෂ්පාදනය කිරීම සඳහා කාන්තා ව්‍යවසායකයන්ගේ දායකත්වය ලබාගැනීම. (බිත්තර කුකුළන් හා මස් කුකුළන් නිෂ්පාදනය) | ශක්තිමත් සමිති හඳුනා ගනිමින් සමිති තෝරා ගැනීම සිදුකිරීම |
| 02 | සූර්ය බලශක්තිය භාවිතයට යොමුකිරීම | ජාතික මට්ටමේ සමිති 20 ක් සඳහා රු.මි. 1 බැගින් ණය ලබාදීමක් සිදුකිරීම |
| 03 | පාසල් දරුවන් සඳහා Laptop පරිගණක ලබාදීම | ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම |
| 04 | සුළු පරිමාණ නිෂ්පාදකයින් දිරිගැන්වීම සඳහා සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම | මූලික හඳුනා ගැනීම් සිදුකිරීම |
| 05 | Smart Elders Homes, smart Daycare centers ආරම්භ කිරීම | මූලික හඳුනා ගැනීම් සිදුකිරීම |

**මූලාශ්‍රය: ශ්‍රී සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව**

## 4.5. සීමාසහිත ලංකා සතොස සමාගම

i. 2024 වසර තුළ ලංකා සතොස මෙගා (mega) අලෙවිසැල් 05ක් හා සාමාන්‍ය ලංකා සතොස අලෙවිසැල් 10ක් ආරම්භ කිරීමට යෝජිත අතර එමගින් පාරිභෝගිකයන් සඳහා හිඟතාවයකින් තොරව රජයේ සහන මිලට භාණ්ඩ මිලදී ගැනීමට සමස්ත අලෙවිසැල් ජාලය 465 දක්වා වර්ධනය කිරීමට හැකිවේ.

ii. ලංකා සතොස අලෙවිසැල් ජාලයේ මෙහෙයුම් ආදායම බිලියන 4.8 දක්වා වර්ධනය කරගැනීමටත් මෙහෙයුම් ලාභය රු.මිලියන 708ක් දක්වා වර්ධනය කර ගැනීමටත් ශුද්ධ ලාභය මිලියන 26 දකවා වැඩිකර ගැනීමටත් අපේක්ෂිතය

## 4.6. අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය (SLAB)

### i. ප්‍රතීතන ක්‍රියාවලිය ඩිජිටල්කරණය කිරීමේ වැඩසටහන

සියලුම ප්‍රතීතන වැඩසටහන් සඳහා ඩිජිටල්කරණය කිරීමේ වැඩසටහන පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීම. තව දුරටත් ආයතනික වෙබ් අඩවිය හරහා ක්‍රියාත්මක වන “Payment Platform” හඳුන්වාදීම මඟින් ආයතනයේ ගණුදෙණුකරුවන් හට මාර්ගගත ක්‍රමයට තම ගෙවීම් අප ආයතනයට ගෙවීමේ හැකියාව ලැබෙනු ඇත.

**ii. අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය (SLAB) ප්‍රතීතනය සඳහා ප්‍රවර්ධන හා සන්නාමකරණය හඳුන්වා දීම.**

ඉදිරි වසර තුළ දී තෝරාගත් ප්‍රධාන අපනයන ගමනාන්ත (ඉන්දියාව, ඩුබායි වැනි) ඉලක්ක කර ගනිමින් SLAB ප්‍රතීතනය ප්‍රචලිත කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. මෙහිදී විදේශ රාජ්‍යතාන්ත්‍රික ධූතමණ්ඩල, වාණිජ නිලධාරීන් වැනි නිලධාරීන්ගේ සහාය ඇතිව එම රටවල රේගුව, ප්‍රතීතන ආයතන හා අනෙකුත් නිලධාරීන් සමඟ සාකච්ඡා කර පරීක්ෂණ වාර්තා හා සහතික කිරීම්වල ගැටළු තිබේ නම් ඒවා හඳුනාගැනීමට කටයුතු සිදු කරන අතර එම ගැටළු නිරාකරණය කරමින් ශ්‍රී ලාංකික අපනයන කරුවන්ට සහාය ලබා දීමේ අරමුණින් මෙම වැඩසටහන සැලසුම් කර ඇත.

**iii. නව ප්‍රතීතන වැඩසටහන් හඳුන්වාදීම තුළින් ආයතනය මගින් ලබාදෙන ප්‍රතීතන සේවාවන් තව දුරටත් පුළුල් කිරීමට කටයුතු කිරීම**

2023 වසරේදී පවත්වනු ලැබූ අන්තර්ජාතික ඇගයීම් ක්‍රියාවලිය (Peer Evaluation) තුළින් දැනට අප ආයතන මගින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රවීණතා පරීක්ෂණ සපයන්නන් ප්‍රතීතනය කිරීමේ වැඩසටහන, පුද්ගලයන් සහතික කිරීමේ ආයතන ප්‍රතීතනය කිරීමේ වැඩසටහන, බලශක්ති කළමනාකරණ පද්ධති, වෘත්තීය සෞඛ්‍ය සහ ආරක්ෂිත කළමනාකරණ පද්ධති ප්‍රතීතන වැඩසටහන් සඳහා 2024 වසරේදී අන්තර්ජාතික පිළිගැනීම් ලබාගැනීමට අපේක්ෂිතය.

ඒ අනුව 2024 වසර තුළදී මෙම ප්‍රතීතනයන් තව දුරටත් පුළුල් කිරීමට අපේක්ෂා කරනු ඇත. ඊට අමතරව 2024 වසර තුළ දී නව ප්‍රතීතන වැඩසටහන් ලෙස යොමු ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමේ වැඩසටහන (Reference Material Programme) (RMP) (ISO17034) ස්ථාපිත කිරීමට නියමිත ය. තව දුරටත් නව ප්‍රතීතන වැඩසටහනක් ලෙස ජෛව බැංකුකරණය (Bio babhy) (ISO20387) අනුකූලතා කළමනාකරණ පද්ධති (Compliance Management System) (ISO/IEC 37301) සහ අධ්‍යාපන කළමනාකරණ පද්ධති (Education Management System) හඳුන්වාදීමට කටයුතු කිරීමට අපේක්ෂිතය.

### 4.7. ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල

i. **ශිෂ්‍යත්වලාභීන් සඳහා දත්ත පද්ධතියක් සකස් කිරීම තුළින් අරමුදල් ප්‍රවර්ධන වැඩසටහන**

විශ්වවිද්‍යාල අධ්‍යයන කටයුතු නිමා කොට දේශීයව හා විදේශීයව විවිධ රැකියාවන්හි හා වෘත්තීන්හි නිරත ශිෂ්‍ය සංඛ්‍යාව ලක්ෂ 03 ක් පමණ වන අතර එම ශිෂ්‍යත්වලාභීන් පිළිබඳ දත්ත සමුදායක් සකස් කර ඇති අතර මහපොළ භාර අරමුදලට යම් දායකත්වයක් ලබා දෙන ලෙස එම දත්ත භාවිතා කරමින් එම සියළු ශිෂ්‍යත්වලාභීන්ගෙන් ඉල්ලීමක් කිරීමට අපේක්ෂිතය. මෙම කාර්යය සඳහා, සෘජු බැංකු ගෙවීම් (මාර්ගගත ගෙවීම් ද්වාරය) පහසුකම් මහජන බැංකුවෙන් ලබා ගෙන ඇති අතර මහපොළ නමින් ෆේස්බුක් පිටුවක් සහ යූටියුබ් නාලිකාවක් දියත් කිරීමට නියමිත අතර, ඒ සමඟින් පුවත්පත් දැන්වීම් සහ විද්‍යුත් මාධ්‍ය භාවිතා කරමින් අරමුදල් ප්‍රවර්ධන වැඩසටහනක් ක්‍රියාවට නැංවීමට වැඩ කටයුතු යොදා තිබේ. 2024 වර්ෂය මෙම අරමුදලේ ප්‍රවර්ධනය තුළින් රු. මිලියන 200 ක පමණ අරමුදලක් ලබා ගැනීමට අපේක්ෂා කෙරේ.

ii. **මහපොළ මාර්ගගත ලොතරැයිය නැවත ක්‍රියාත්මක කිරීම(Online Lottery)**
මහපොළ මාර්ගගත ලොතරැයිය (Online Lottery) නැවත දියත් කිරීම - ප්‍රසම්පාදන කටයුතු 2023 වර්ෂයේ අවසන් කොට ඇති අතර 2024 වර්ෂයේ ආරම්භ කිරීමට යෝජිතය. අපේක්ෂිත ආදායම රු.මිලියන 300කි.

**iii. මහපොළ අධ්‍යාපන හා වෙළෙඳ ප්‍රදර්ශනය නැවත ආරම්භ කිරීම**

2023 වර්ෂය සිට එම වෙළෙඳ ප්‍රදර්ශනය නැවත ආරම්භ කිරීමට භාරකාර මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර 2023 දෙසැම්බර් මාසයේදී පළමු වෙළෙඳ ප්‍රදර්ශනය පැවැත්වීම සඳහා කටයුතු සිදුකරමින් පවතී. මෙමඟින් මහපොළ අරමුදල ශක්තිමත් කිරීම සඳහා අතිරේක ආදායමක් උපයා ගැනීම අපේක්ෂා කෙරේ

## 4.8. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

**i. සෞඛ්‍යයට අහිතකර පාරිභෝගික භාණ්ඩ වෙළෙඳපොළට ඇතුළු වීම වැළැක්වීමට පියවර ගැනීම**

1980 අංක 26 දරන ආහාර පනත යටතේ සෞඛ්‍යයට අහිතකර ආහාර නිෂ්පාදනය, ආනයනය, විකිණීම හෝ බෙදා හැරීම තහනම් වන අතර මෙම පනතේ නීතිමය ප්‍රතිපාදන ක්‍රියාවට නැංවීමේ ප්‍රධාන ආහාර බලධාරියා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාය. එබැවින් සෞඛ්‍ය අමාත්‍යංශය හා අනෙකුත් ආයතන සම්බන්ධීකරණයෙන් සෞඛ්‍යයට අහිතකර ආහාර වෙළෙඳපලට ඇතුළු වීම වැළැක්වීමට පියවර ගැනිම.

සෞඛ්‍යයට අහිතකර ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ වෙළෙඳපලට ඇතුළුවීම වැලැක්වීමට අවශ්‍ය සියලු පියවරයන් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

ඒ සඳහා යෝජිත කාර්යයන්

- ආනයනික සහ දේශීයව නිපදවන භාණ්ඩවල ගුණාත්මක භාවය සහ එම භාණ්ඩ වලට අදාළ ප්‍රමිතීන් නියාමනය කරන ආයතනවල විස්තර ඇතුළත් දත්ත පද්ධතියක් සැකසීම.
- ආහාර හා සෞඛ්‍යයට අදාළ පාරිභෝගික භාණ්ඩ ප්‍රමිතකරණය අනිවාර්ය කිරීම.
- සහතික කිරීම හා සන්නාමකරණය දිරිමත් කිරීම.
- ආහාරමය සහ ආහාරමය නොවන භාණ්ඩ සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යංශය සහ අනෙකුත් ආයතන සමඟ සම්බන්ධීකරණය.
- ඖෂධ පිළිබඳව ජාතික ඖෂධ නියාමන අධිකාරිය සමඟ සම්බන්ධීකරණය, වාර්තා පවත්වාගෙන යාම.
- අන්තර්ජාලය ඔස්සේ සිදුකරන වෙළෙඳ ගනුදෙනු සම්බන්ධ මාර්ගෝපදේශයක් සැකසීම සහ ලියාපදිංචි කිරීම.

**ii. පාරිභෝගික ද්‍රව්‍ය සඳහා සෞඛ්‍ය ආරක්ෂිත බවද ඇතුළත්ව නියමිත ප්‍රමිතකරණයක් ඇති කිරීම**

විවිධ පාරිභෝගික ද්‍රව්‍ය සඳහා මේ වන විට ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් ප්‍රමිතීන් 1500 ක් පමණ සකස් කර ඇති අතර ඒවා භාණ්ඩ ප්‍රමිතීන්, ක්‍රියාවලි ප්‍රමිතීන් හා මාර්ගෝපදේශ වශයෙන් පවතී. මෙයින් තෝරාගත් ප්‍රමිතීන් 47 ක් පමණ අනිවාර්ය කර ඇත. ඒ අනුව ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් තවදුරටත් ප්‍රමිතීන් සකස් කිරීම දිරිමත් කරන අතර ඒ සඳහා සම්පූර්ණ සහාය සහ දායකත්වය ලබාදේ. එමෙන්ම තෝරාගත් ප්‍රමිතීන් අනිවාර්ය කිරිමටද තෝරාගත් භාණ්ඩ සඳහා වන මාර්ගෝපදේශවල ඇතුළත් පිරිවිතර අනිවාර්ය කිරීමටද ක්‍රියාකෙරේ. පාරිභෝගික භාණ්ඩවල ගුණාත්මකභාවය තහවුරු කිරීම සඳහා පාරිභෝගික ද්‍රව්‍ය සහතිකකරණය, ශ්‍රේණිගතකරණය හා

සන්නාමකරණය දිරිමත් කෙරේ. තත්ත්වයෙන් බාල භාණ්ඩ සඳහා නීතිය ක්‍රියාත්මක කර වැරදිකරුවන්ට දඬුවම් ලබා දීමට අපේක්ෂිතය.

ඒ සඳහා යෝජිත කාර්යයන්

- ප්‍රමිති සැකසීම දිරිමත් කිරිම.
- ප්‍රමිති අනිවාර්ය කිරීම හා ප්‍රමිති ගැසට් කිරිම.
- ප්‍රමිතියට අනුව තිබේද යන්න පරීක්ෂා කිරීම සඳහා රසායනාගාර පරීක්ෂාවන් සිදු කිරිම.
- විශ්ව විද්‍යාල හෝ අනෙකුත් පර්යේෂණ ආයතන මඟින් කරන පර්යේෂණ නිබන්ධන පරිශීලනය කිරිම සහ පර්යේෂණ සිදු කරවා ගැනීම.
- තත්වයෙන් බාල භාණ්ඩ ක්ෂණිකව හඳුනාගැනීමේ ක්‍රමවේදයන්, ආහාර කල්තබා ගැනීමේ ක්‍රමවේදයන් හඳුනා ගැනීම සහ ඉදිරිපත් කිරිම.
- දෝෂ සහගත භාණ්ඩ පිළිබඳව ලැබෙන පැමිණිලි කඩිනමින් විමර්ශනය කිරීම, ඒවා පිළිබඳව නීත්‍යානුකූලව කටයුතු කිරිම.
- තෝරාගත් භාණ්ඩ හා සේවාවන් සහතික කිරිම සහ ශ්‍රේණිගත කිරිම දිරිමත් කිරිම.
- සන්නාමකරණය දිරිමත් කිරිම.
- ප්‍රමිති පිළිබඳව පාරිභෝගිකයන් දැනුවත් කිරීම.
- පාරිභෝගික භාණ්ඩවල ගුණාත්මකභාවය තහවුරු කරන අනෙකුත් ආයතන සමග සම්බන්ධීකරණය, වාර්තා පවත්වාගෙන යාම.

**iii. ඉහත සඳහන් කළ සුවිශේෂී ප්‍රමුඛතාවයන්ට අමතරව පාරිභෝගික ආරක්ෂණය සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරනු ලබන සුවිශේෂී කාර්යයක් වන්නේ භාණ්ඩ හා සේවාවන්ගේ සාධාරණ මිල තහවුරු කිරීමයි. මේ සඳහා පහත සඳහන් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට යෝජිතය**

- ඉල්ලීම් මත පදනම්ව නිෂ්පාදන පිරිවැය පදනම් කරගත් මිල සමීකරණ සැකසීම, යාවත්කාලීන කිරීම හා ව්‍යාපාරික ප්‍රජාව දැනුවත් කිරීම.
- වෙළෙඳුන් සහ සංගම් සමග ගිවිසුම්වලට එළඹීම, ක්‍රියාත්මක කිරීම සහ පසු විපරම් කිරීම.
- ආනයනික භාණ්ඩයන්හි රේගු දත්ත විශ්ලේෂණය කිරීම හා සාධාරණ මිල සැකසීම තුළින් තීරණ ගැනීමට පහසු කිරීම.
- ඒකාබද්ධ පරිගණකගත තොරතුරු පද්ධතියක් නිර්මාණය කිරීම, පවත්වාගෙන යාම හා යාවත්කාලීන කිරිම.
- එක් එක් භාණ්ඩවල මිල මෙන්ම භාණ්ඩ වර්ගවල මිල උපනතීන් නිරීක්ෂණය කිරීම, පුරෝකථනය කිරීම හා තීරණ ගැනීම සඳහා ඉදිරිපත් කිරීම.
- තෝරාගත් භාණ්ඩවල නිෂ්පාදනය, ගබඩාකරණය හා බෙදාහැරීම නිරීක්ෂණය කිරීම.
- වෙළෙඳුන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- මිල හා ගුනාත්මක බව පිළිබඳ විශේෂ කමිටු පිහිටවීම හා අදාළ තීරණ ලබා ගැනීම හා ක්‍රියාත්මක කිරීම.
- දීප ව්‍යාප්ත දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- දිස්ත්‍රික් මට්ටමින් පැමිණිලි අධීක්ෂණ කටයුතු විමධ්‍යගත කිරීම.
- ප්‍රාදේශීය මට්ටමින් පාරිභෝගික කමිටු සක්‍රිය කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- ආයතික ක්‍රියාවලින් සක්‍රියව පවත්වාගෙන යාම සඳහා කළමනාකරණ තොරතුරු පද්ධතියක් සැලසුම් කිරීම.

### 4.9. සමුපකාර සේවක කොමිෂන් සභාව

සමුපකාර සේවකයින්ට බලපාන කම්කරු නීතිය හා සමුපකාර නීතිය පිලිබඳව සමුපකාර සේවකයින්ගේ දැනුවත්භාවය ඉහළ නැංවීම සහ ඔවුන්ගේ කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය වර්ධනය කිරීම අරමුණු කර ගනිමින් දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම. ඒ අනුව සමුපකාර සේවා නියුක්තිකයින් වෙනුවෙන් පුහුණු වැඩමුළු 08 ක් පැවැත්වීමට සැලසුම් කර ඇත.

### 4.10. ජාතික සමුපකාර සංවර්ධන ආයතනය

i. **2024 වර්ෂයේ සිදු කිරීමට අපේක්ෂිත පාඨමාලා**

*වගු අංකය 4. 2 ජාතික සමුපකාර සංවර්ධන ආයතනය විසින් 2024 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන්*

| අනු අංකය | ඉලක්ක පාඨමාලාව | පාඨමාලා/ වැඩසටහන් ගණන | අපේක්ෂිත සහභාගීත්වය |
|---|---|---|---|
| 1 | සමුපකාර සමිති තිරසාර ඒකකයක් වශයෙන් ගොඩ නැංවීම | | |
| | • විවිධ සේවා සමුපකාර සමිති සඳහා උපදේශනය | 04 | 200 |
| | • සණස සමිති සඳහා උපදේශනය | 04 | 200 |
| | • ගිණුම්කරණ උපදේශන වැඩසටහන් | 04 | 200 |
| 2 | නිත්‍ය පුහුණු පාඨමාලා | 01 | 40 |
| 3 | උසස් ඩිප්ලෝමා පාඨමාලා | 01 | 20 |
| 4 | ඩිප්ලෝමා පාඨමාලා | 11 | 330 |
| 5 | සහතිකපත්‍ර පාඨමාලා | 09 | 270 |
| 6 | කෙටිකාලීන පාඨමාලා | 42 | 1,680 |

**මූලාශ්‍රය: ජාතික සමුපකාර සංවර්ධන ආයතනය**

**ii.** ආයතනය මඟින් පවත්වන සියලුම ඩිප්ලෝමා පාඨමාලාවන්හි විෂය අන්තර්ගතය සමුපකාර ව්‍යාපාරයේ අවශ්‍යතාව පරිදි සමාලෝචනය කර ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශ (SLQF) තත්ත්වය ලබා ගැනීම හා SLQF-4 මට්ටමේ උසස් ඩිප්ලෝමා පාඨමාලාවක් ආරම්භ කිරීම.

**iii.** උතුරු/නැගෙනහිර පළාත්වල සමුපකාරිකයන්ගේ දැනුම, කුසලතා, ආකල්ප සංවර්ධනය සහ අන්තර් සාමාජික සහජීවනය අරමුණු කරගෙන එම පළාත් ආවරණය වන පරිදි දමිළ මාධ්‍ය පාඨමාලා ආරම්භ කිරීම.

**iv.** ආයතනයේ ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය (LMS) ස්ථාපනය කර මාර්ගගත ශිෂ්‍ය ලියාපදිංචිය, මාර්ගගත ඉගෙනුම් ක්‍රියාවලිය ස්ථාපනය හා විභාග ප්‍රතිඵල නිකුත් කිරීම.

**v.** ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ හඳුනාගත් පුද්ගලික/ විදෙස් විශ්ව විද්‍යාල සමඟ ඒකාබද්ධ පාඨමාලා සංවිධානය කිරීම.

vi. ජාතික වෘත්තීය පුහුණු අධිකාරිය සමඟ ඒකාබද්ධව වෘත්තීය පුහුණු පාඨමාලා සංවිධානය කිරීම.

vii. විවිධ ක්ෂේත්‍ර ඔස්සේ කැපී පෙනෙන ප්‍රගතියක් අත්කර ගත් සමුපකාර සමිතිවල අත්දැකීම්, අනෙකුත් සමුපකාර සමිතිවලට ලබා දීම අරමුණු කරගත් අත්දැකීම් හුවමාරු වැඩසටහන් සංවිධානය කිරීම.

viii. සමුපකාර විෂයය ක්ෂේත්‍රයේ දැනුම කේන්ද්‍රස්ථානය වන ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ පුස්තකාලය ස්වයංක්‍රීයකරණය (Digitalization) කිරීම.

ix. අනාගත පරපුර ව්‍යවසායකත්ව ගුණාංග වලින් යුත්, රැකියා වෙළෙඳපොළට සරිලන පුද්ගලයෙකු බවට පත් කිරීම අරමුණු කරගත් ඉංග්‍රීසි භාෂා කඳවුරු සංවිධානය කිරීම.

x. ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ දූරස්ථව, බස්නාහිර, සබරගමුව, උතුරු මැද, වයඹ හා දකුණු පළාත් ආවරණය වන පරිදි දූරස්ථ පාඨමාලා සංවිධානය කිරීම.

## 4.11. ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය

- ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයෙහි මෘදුකාංග පද්ධතිය වන කාර්මික දේපළ පරිපාලන පද්ධතිය (IPAS) එහි හතරවන මට්ටමට වැඩිදියුණු කිරීම.
- ලෝක බුද්ධිමය දේපළ සංවිධානයේ සහයෝගයෙන් ලිපි ගොනු ඩිජිටල්කරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.
- ලෝක බුද්ධිමය දේපළ සංවිධානය විසින් බුද්ධිමය දේපළ විෂය ප්‍රචලිත කිරීම සඳහා ලංකාව තුළ ක්‍රියාත්මක වැඩසටහන් පැවැත්වීම.
- ප්‍රාදේශීය ලේකම් කාර්යාල සම්බන්ධීකරණය කරගනිමින් බුද්ධිමය දේපළ විෂය පිළිබඳ මහජනතාව දැනුවත් කිරීමේ දීප ව්‍යාප්ත වැඩසටහන් පැවැත්වීම.
- බුද්ධිමය දේපළ කාර්යාලය සඳහා මාර්ගගත ගෙවීමේ ක්‍රමයක් ස්ථාපනය කිරීම.




චීන විදෙස් ආයෝජකයන් පිරිසක් හා වාණිජ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමඟ වෙළෙඳ අමාත්‍යාංශයේදී සිදු කළ ද්විපාර්ශවීය සාකච්ඡාව.
கௌரவ வர்த்தக அமைச்சர் நளின் பெர்னாண்டோ சீன வெளிநாட்டு முதலீட்டாளர்கள் குழு மற்றும் வர்த்தக திணைக்கள அதிகாரிகளுடன் வர்த்தக அமைச்சில் இருதரப்பு கலந்துரையாடலை மேற்கொண்டார்.
Discussion held at the Ministry of trade with a group of Chinese foreign investors and officials of the Department of Commerce.






නේපාලයේ කත්මණ්ඩු අගනුවර පැවති “2023 දකුණු ආසියානු කෘෂි සමුළුවේ” ප්‍රධාන ආරාධිතයා වශයෙන් ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගී වූ අවස්ථාව.
நேபாளத்தின் தலைநகர் காத்மாண்டுவில் நடைபெற்ற "2023 தெற்காசிய விவசாய மாநாட்டில்" இலங்கையைப் பிரதிநிதித்துவப்படுத்தி வர்த்தக அமைச்சர் பிரதம அதிதியாகக் கலந்துகொண்ட சந்தர்ப்பம்.
Represented Sri Lanka as the chief guest at the "2023 South Asian Agricultural Conference" held in the capital city of Kathmandu, Nepal.




රුසියානු ජනරජයේ ස්වර්ඩ්ලොව්ස්ක්( Sverdlovsk) කලාපයේ රාජ්‍ය තාන්ත්‍රික නියෝජිතයන් පිරිසක් හමුවූ අවස්ථාව.
ரஷ்யா குடியரசின் Sverdlovsk பிராந்தியத்தின் இராஜதந்திர பிரதிநிதிகள் குழுவை சந்தித்தார்
A group of diplomatic representatives from the Sverdlovsk Region of the Russian Federation met at the Ministry of Trade.





කොටුව මෙට්‍රොපොලිටන් විශ්වවිද්‍යාල ( මිලෝදා ) පරිශ්‍රයේදී පැවැති ජගත් පාරිභෝගික අයිතිවාසිකම් දින සැමරුම් උළෙල සඳහා සහභාගී වීම
கொழும்பு கோட்டை பெருநகரப் பல்கலைக்கழக (மிலோடா) வளாகத்தில் நடைபெற்ற சர்வதேச நுகர்வோர் உரிமைகள் தின நிகழ்வில் கலந்துகொண்ட கௌரவ வர்த்தக அமைச்சர்
Participating in the World Consumer Rights Day celebrations held at the Fort Metropolitan University (Miloda) campus.





කුරක්කන්, කව්පි, මුංඇට ඇතුළු ක්ෂේත්‍ර බෝගයන් ( Field Crops) සහ කුළු බඩු නිෂ්පාදන ආශ්‍රිත වගාවන්හි ඵලදායීතාවය ඉහළ නැංවීම හා ඵලදාවට සහතික මිලක් ලබා දීම සඳහා ගොවීන් හා රාජ්‍ය නිලධාරීන් සමඟ අමාත්‍යාංශයේදී පැවැත්වූ සාකච්ඡාව.

மாண்புமிகு வர்த்தக அமைச்சர் அவர்கள் கௌபி, பயறு, குரக்கன், மற்றும் மசாலா உற்பத்தி உள்ளிட்ட வயல் பயிர்களின் உற்பத்தித்திறனை அதிகரிக்கவும், பயிருக்கு உத்தரவாத விலையை வழங்கவும் விவசாயிகள் மற்றும் அரச அதிகாரிகளுடன் கலந்துரையாடல் ஒன்றை அமைச்சில் நடத்தினார்.

The discussion held at the Ministry with farmers and government officials to increase the productivity of fields related to field crops including cowpea, cowpea, mung bean and spice products and to provide a guaranteed price for the crop.



බෙලරුස් රාජ්‍යයේ ඉන්දීය,බංගලාදේශ, නේපාල හා ශ්‍රී ලාංකීය තානාපති ඇන්ඩ්‍රෙ අයි. රිසෙව්ස්කි මහතා ඇතුළු රාජ්‍ය තාන්ත්‍රික නියෝජිතයන් පිරිස සමඟ අමාත්‍යාංශයේදී පැවැත්වූ ද්විපාර්ශවීය සාකච්ඡාව.

கௌரவ வர்த்தக அமைச்சர் இந்திய, பங்களாதேஷ் நேபாளம் மற்றும் இலங்கை ஆகிய நாடுகளின் தூதுவர் Mr. Andrei I Rzhevssky உள்ளிட்ட இராஜதந்திரப் பிரதிநிதிகளுடன் அமைச்சில் இருதரப்பு கலந்துரையாடலை மேற்கொண்டார்.

Discussion held Mr. Andrei I Rzhevssky Ambassador of State Belarus for India, Bangladesh, Nepal and Sri Lanka



මොංගෝලියානු රාජ්‍යයේ ඉන්දීය තානාපති ගන්බෝල්ඩ් දම්බජා මහතා සමඟ අධ්‍යාපන, වෙළෙඳ හා සංචාරක යන ක්ෂේත්‍රයන් ආශ්‍රිතව දෙරට අතර ද්විපාර්ශවික සබඳතා වර්ධනය කර ගැනීම සම්බන්ධයෙන් සකච්ඡා කරන ලදී.

கல்வி, வர்த்தகம் மற்றும் சுற்றுலா ஆகிய துறைகளில் இரு நாடுகளுக்கும் இடையிலான இருதரப்பு உறவுகளை மேம்படுத்துவது தொடர்பாக மாண்புமிகு வர்த்தக அமைச்சர் மங்கோலிய மாநிலத்திற்கான இந்தியத் தூதுவர் திரு. கன்போட் தன்பஜவ அவர்களுடன் கலந்துரையாடினார்.

Discussions held with Mr. Ganbold Dambajav, Ambassador of Mongolia for India, regarding the development of bilateral relations between the two countries in the fields of education, trade and tourism.





පාරිභෝගිකයාට ගුණාත්මක තත්ත්වයෙන් යුතු නිෂ්පාදනයන් ලබා දීම සඳහා පොල්තෙල් නිෂ්පාදකයින් සමඟ වෙළෙඳ අමාත්‍යාංශයේදී පැවැත්වූ සාකච්ඡාව

நுகர்வோருக்கு தரமான பொருட்களை வழங்குவது தொடர்பில் வர்த்தக அமைச்சர் அவர்கள் வர்த்தக அமைச்சில் தேங்காய் எண்ணெய் உற்பத்தியாளர்களுடன் கலந்துரையாடலை மேற்கொண்டார்.

Discussion held at Ministry of trade with coconut oil producers to provide quality products to consumers




වාණිජ දෙපාර්තමේන්තුව මඟින් තල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනය ප්‍රවර්ධනය සඳහා තල් කර්මාන්ත සංවර්ධන මණ්ඩලය හා අපනයනකරුවන් සමඟ පැවැත්වූ වැඩසටහන

பனை தொடர்பான பொருட்களை ஏற்றுமதி செய்வதை ஊக்குவிப்பதற்காக பனை கைத்தொழில் அபிவிருத்தி சபை மற்றும் ஏற்றுமதியாளர்களுடன் இணைந்து வர்த்தக திணைக்களத்தினால் நடத்தப்பட்ட நிகழ்ச்சி.

The program conducted by the Department of Commerce with the Palm Industry Development Board and exporters to promote the export of palm related products.



ශ්‍රී ලාංකාවේ බ්‍රිතාන්‍ය මහකොමසාරිස් සාරා හුල්ටන් මහත්මිය හා රාජ්‍ය තාන්ත්‍රික නියෝජිතයන් පිරිසක් සමඟ වෙළෙඳ අමාත්‍යාංශයේදී පැවැත්වූ ද්වීපාර්ශවීය සාකච්ඡාව

கௌரவ வர்த்தக அமைச்சர் இலங்கைக்கான பிரித்தானிய உயர்ஸ்தானிகர் திருமதி சாரா ஹல்டன் மற்றும் இராஜதந்திர பிரதிநிதிகள் குழுவுடன் வர்த்தக அமைச்சில் இருதரப்பு கலந்துரையாடலை மேற்கொண்டார்.

Discussion held on Mrs. Sara Hulton, High Commissioner of British in Sri Lanka and a group of diplomatic representatives at the Ministry of Trade



ජපන් බාහිර වෙළෙඳ සංවිධානයේ (JETRO), නේවාසික නියෝජිත හිරෝකි ඔයි මහතා හා ශ්‍රී ලංකා මෘදුකාංග සේවා සංගමයේ (SLASSCOM) නියෝජිතයන් සමඟ වෙළෙඳ අමාත්‍යාංශයේදී පැවැත්වූ සාකච්ඡාව

மாண்புமிகு வர்த்தக அமைச்சர், ஜப்பான் வெளிநாட்டு வர்த்தக அமைப்பு (JETRO) வதிவிடப் பிரதிநிதி திரு. ஹிரோகி ஓய் மற்றும் இலங்கை மென்பொருள் சேவை சங்கத்தின் (SLASSCOM) பிரதிநிதிகளுடன் வர்த்தக அமைச்சில் கலந்துரையாடலை மேற்கொண்டார்.

The discussion held on Mr. Hiroki Oi, Japan External Trade Organization (JETRO), Resident Representative with the representatives of and Sri Lanka Software Services Association (SLASSCOM) at the Ministry of Trade




පොල්ගහවෙල, රිදියගම, වැලිමඩ හා සියඹලාපේ සතොස ශාඛා විවෘත කිරීමේ අවස්ථාවන්ට සහභාගී වූ අවස්ථාව.

பொல்கஹவெல, ரிதியகம, வெலிமடை மற்றும் சியம்பலாபே ஆகிய இடங்களில் சதொச கிளைகளை திறந்து வைக்கும் நிகழ்வில் கௌரவ வர்த்தக அமைச்சர் கலந்து கொண்ட போது.

Participated in the opening ceremony of Sathosa branches in Polgahawela, Ridhiagama, Welimada and Siambalape.

 

ගීතයක නෛතික අයිතිය සම්බන්ධයෙන් ගායන ශිල්පීන්ට පවතින ගැටළු සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා කළාකරුවන්, බුද්ධිමය දේපළ කාර්යාලයේ නිළධාරීන් සමඟ පැවැත්වූ සාකච්ඡාව

கௌரவ வர்த்தக அமைச்சர் அவர்கள் பாடகர்கள் எதிர்நோக்கும் பிரச்சனைகள் தொடர்பாக கலைஞர்கள் மற்றும் புலமைச் சொத்து அலுவலக அதிகாரிகளுடன் கலந்துரையாடல் ஒன்றை நடாத்தினார்.

The discussion held with the artists, and officials of the Intellectual Property Office to discuss the concerns faced by the singers regarding the legal rights of a song.

 

අපනයන ප්‍රභවස්ථාන සහතිකය ලබා දීමේ ක්‍රියාවලිය ඩිජිටල්කරණය කිරීම වෙනුවෙන් ජාත්‍යන්තර වෙළෙඳ මධ්‍යස්ථානයේ ව්‍යාපෘති කළමණාකාරිනී රාගද් ඇල්ටලී මහත්මිය ඇතුළු පිරිස සමඟ වෙළෙඳ අමාත්‍යාංශයේදී පැවැත්වූ සාකච්ඡාව.

மாண்புமிகு வர்த்தக அமைச்சர் அவர்கள் மூலப்பொருள் உற்பத்தி சான்றிதலை வழங்கும் செயல்முறையை டிஜிட்டல் மயமாக்க சர்வதேச வர்த்தக மையத்துடன் திட்ட மேலாளர் ரகாத் அல்தாலி அவர்கள் உள்ளிட்ட ஏனையோருடன் வர்த்தக அமைச்சில் நடைபெற்ற கலந்துறையாடல்

Discussion held Mrs. Ragad Altali, Project Manager of the International Trade Center for the digitalization of the process of providing Certificates of Origin at the Ministry of trade

 

බ්‍රසීලයෙන් මෙරටට ආනයනය කෙරෙන සීනි තොග ආරක්ෂිතව හා කඩිනමින් ලබා ගැනීමට රාජ්‍ය නිලධාරීන් හා සීනි ආනයනකරුවන් සමඟ වෙළෙඳ අමාත්‍යාංශයේදී පැවැත්වූ සාකච්ඡාව

பிரேசிலில் இருந்து இலங்கைக்கு இறக்குமதி செய்யப்படும் சீனி கையிருப்பை பாதுகாப்பாகவும் விரைவாகவும் பெற்றுக் கொள்வதற்காக அரசாங்க அதிகாரிகள் மற்றும் சீனி இறக்குமதியாளர்களுடன் கௌரவ வர்த்தக அமைச்சர் நளின் பெர்னாண்டோ அவர்கள் வர்த்தக அமைச்சில் கலந்துரையாடலை மேற்கொண்டார்.

Meeting with government officers and sugar importers to get the sugar stock imported from Brazil to Sri Lanka safely and quickly



රූපවාහිනී හා ගුවන් විදුලි මාධ්‍යයන් ඇතුළු විද්‍යුත් මාධ්‍ය මඟින් ප්‍රචාරය කෙරෙන ගීත සඳහා කතෘභාගය ලබා දීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් කළාකරුවන්, බුද්ධිමය දේපළ කාර්යාලයේ නිලධාරීන් සමඟ දෙවනවර වෙළෙඳ අමාත්‍යාංශයේදී පැවැත්වූ සාකච්ඡාව

தொலைகாட்சி, வானொலி உள்ளிட்ட இலத்திரனியல் ஊடகங்கள் ஊடாக ஒலிபரப்பப்படும் பாடல்களுக்கு காப்புரிமை வழங்குவது தொடர்பில் வர்த்தக அமைச்சர் நளின் பெர்னாண்டோ புலமை சொத்துரிமை அலுவலக அதிகாரிகளுடன் இரண்டாவது கலந்துரையாடலை வர்த்தக அமைச்சில் நடத்தினார்.

The discussion held at the Ministry of Commerce for the second time with the officials of the Intellectual Property Office regarding the process of granting copyright for songs broadcasted by electronic media including television and radio media.



පාන් ආඥා පනත අවලංගු කිරීමට ඉදිරිපත් කළ යෝජනාවට කැබිනට් යෝජනාවට අනුමැතිය හිමිවීම හා සමස්ත ලංකා බේකරි නිෂ්පාදන හිමියන්ගේ සංගමය සමග බේකරි ආශ්‍රිත නිෂ්පාදනයන්හි මිල ගණන් පහත හෙළීම සම්බන්ධයෙන් වෙළෙඳ අමාත්‍යාංශයේදී පැවැත්වූ සාකච්ඡාව

மாண்புமிகு வர்த்தக அமைச்சர் பாண் கட்டளைச் சட்டத்தை நீக்குவதற்கான யோசனைக்கு அமைச்சரவை அங்கீகாரம் வழங்கியுள்ளதுடன், பேக்கரி தொடர்பான பொருட்களின் விலைகளை குறைப்பது தொடர்பாக அகில இலங்கை பேக்கரி உற்பத்தி உரிமையாளர்கள் சங்கத்துடன் வர்த்தக அமைச்சில் நடைபெற்ற கலந்துரையாடல்.

The discussion held at the Ministry regarding the approval of the Cabinet proposal for the repeal of the Bread Ordinance and the reduction of prices of bakery-related products with the All Ceylon Bakery Product Owners' Association





සිමෙන්ති වෙළෙඳපොලේ සිමෙන්ති කොට්ටයක උපරිම සිල්ලර මිල රු 2300ක් දක්වා අඩු කිරීම සම්බන්ධයෙන් සිමෙන්ති නිෂ්පාදකයන් සමඟ පැවැත්වූ සාකච්ඡාව

சீமெந்து சந்தையில் மூட்டை ஒன்றின் அதிகபட்ச சில்லறை விலையை 2300 ரூபாவாக குறைப்பது தொடர்பில் கௌரவ வர்த்தக அமைச்சர் சீமெந்து உற்பத்தியாளர்களுடன் கலந்துரையாடினார்.

The discussion held with the cement manufacturers regarding reducing the maximum retail price of a bag of cement to Rs. 2300 in the cement market.





ඕස්ට්‍රේලියානු මහා කොමසාරිස් පෝල් ස්ටෙෆන්ස් මහතා සමඟ වෙළෙඳ, ආර්ථික හා වාණිජ කටයුතු පිළිබඳ වෙළෙඳ අමාත්‍යාංශයේදී පැවැත්වූ ද්විපාර්ශවීය සාකච්ඡාව.

கௌரவ வர்த்தக அமைச்சர் அவுஸ்திரேலிய உயர்ஸ்தானிகர் திரு. போல் ஸ்டீபன்ஸுடன் அவர்களுடன் வர்த்தகம், பொருளாதாரம் மற்றும் வர்த்தகம் தொடர்பாக வர்த்தக அமைச்சில் இருதரப்பு கலந்துரையாடலை மேற்கொண்டார்.

Discussion held Mr. Paul Stephens, Australian High Commissioner about Trade, Economic and Commercial Affairs at the Ministry of Trade



වාණිජ දෙපාර්තමේන්තුව සංවිධානය කළ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් අපනයන වෙළෙඳපොළ වෙත ප්‍රවිශ්ය කිරීමේ වැඩමුළුවට සහභාගී වෙමින්

வர்த்தக திணைக்களத்தினால் ஏற்பாடு செய்யப்பட்ட சிறிய மற்றும் நடுத்தர தொழில் நிறுவனங்களுக்கான ஏற்றுமதி சந்தையில் நுழைவது தொடர்பான செயலமர்வில் கௌரவ வர்த்தக அமைச்சர் அவர்கள் கலந்துகொண்டார்.

Participating in the workshop on entry of small and medium enterprises into the export market organized by the Department of Commerce



තීන්ත හා ටයිල් මිල ගණන් අඩු කිරීම සඳහා එම කර්මාන්ත ආශ්‍රිත සමාගම්හි විධායක නිළධාරීන් සමඟ අමාත්‍යාංශයේදී පැවැත්වූ සාකච්ඡාව.

கௌரவ வர்த்தக அமைச்சர் அவர்கள், பெயின்ட் மற்றும் டைல்ஸ் விலைகளை குறைப்பது தொடர்பாக தொழில்துறையுடன் தொடர்புடைய நிறுவனங்களின் நிர்வாகிகளுடன் கலந்துரையாடல் ஒன்றை அமைச்சில் நடத்தினார்

The discussion held at the Ministry with the executives of the related companies in the industry to reduce the prices of paint and tiles



සිමෙන්ති, යකඩ ඇතුළු අමුද්‍රව්‍ය මිල ගණන් පහත හෙළීම වෙනුවෙන් හා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ප්‍රගමනය වෙනුවෙන් රජයට ගත හැකි ඉදිරි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ඉදිකිරීම් කර්මාන්තය ආශ්‍රිත සංගම් සමඟ වෙළෙඳ අමාත්‍යංශයේදී පැවැත්වූ සාකච්ඡාව

சீமெந்து, இரும்பு உள்ளிட்ட மூலப்பொருட்களின் விலைகளை குறைப்பதற்கு அரசாங்கம் மேற்கொள்ளும் எதிர்கால நடவடிக்கைகள் குறித்தும், அதன் முன்னேற்றம் குறித்தும் நிர்மாணத்துறை தொடர்பான சங்கங்களுடன் வர்த்தக அமைச்சர் கலந்துரையாடினார்.

The discussion held at the Ministry with the associations related to the construction industry regarding the further steps that the government can take to bring down the prices of raw materials including cement and iron and for the advancement of the construction sector.



2023 දෙසැම්බර් මස 13 වනදා සිට 17 වනදා දක්වා ජා-ඇළ නගරසභා ක්‍රීඩාංගණයේදී පැවැත්වීමට නියමිත "මහපොළ අධ්‍යාපනික හා වෙළෙඳ ප්‍රදර්ශනය" වෙනුවෙන් ජා-ඇළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී පැවැත්වූ විශේෂ සාකච්ඡාව සඳහා සහභාගී වෙමින්.

மாண்புமிகு வர்த்தக அமைச்சர் நளின் பெர்னாண்டோ 2023 டிசம்பர் 13 முதல் 17 வரை ஜா-எல மாநகர விளையாட்டு மைதானத்தில். ஜா-எல பிரதேச செயலகத்தில் "மஹாபொல கல்வி மற்றும் வர்த்தக கண்காட்சிக்காக நடைபெற்ற விசேட கலந்துரையாடலில் கலந்து கொண்ட போது.

Participating in the special discussion held at the Ja-Ala Divisional Secretariat for the "Mahapola Educational and Trade Fair" to be held from 13th to 17th December 2023 at the Ja-Ala Municipal Stadium.





බ්‍රිතාන්‍ය මහා කොමසාරිස් ශ්‍රී ලංකාවේ සමීප මිත්‍රශීලී රාජ්‍යයක් වන බ්‍රිතාන්‍යය නව මහකොමසාරිස් ඇන්ඩෲ පැට්‍රික් මහතා සමඟ වෙළෙඳ අමාත්‍යාංශයේදී පැවැත්වූ ද්වි පාර්ශවීය සාකච්ඡාව

கௌரவ வர்த்தக அமைச்சர் பிரித்தானிய உயர்ஸ்தானிகர், இலங்கையின் நெருங்கிய நட்பு நாடு, பிரித்தானியாவின் புதிய உயர்ஸ்தானிகர் திரு. அன்ட்ரூ பேட்ரிக், வர்த்தக அமைச்சில் இருதரப்பு கலந்துரையாடலை மேற்கொண்டார்.

Discussion held Mr. Andrew Patrick, new British High Commissioner for Sri Lanka at the Ministry of Trade




බිත්තර කර්මාන්තය ස්ථාවර කොට බිත්තර නිෂ්පාදනය ඉහළ නැංවීම වෙනුවෙන් මේ වන විටත් බිත්තර නිෂ්පාදනය කරන කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් සඳහා ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයේ පැවැති කුකුළු පැටවු බෙදාදීමේ දීපව්‍යාප්ත වැඩසටහනේ සමාරම්භක අවස්ථාව සඳහා සහභාගී වෙමින්.
முட்டை கைத்தொழிலை ஸ்திரப்படுத்தும் நோக்கில் ஏற்கனவே முட்டை உற்பத்தி செய்து வரும் சிறு மற்றும் நடுத்தர கைத்தொழில்துறையினருக்காக கம்பஹா மாவட்ட செயலக வளாகத்தில் நாடு தழுவிய ரீதியில் நடைபெற்ற கோழிக்குஞ்சுகள் வழங்கும் நிகழ்ச்சியின் ஆரம்ப நிகழ்வில் கௌரவ வர்த்தக அமைச்சர் திரு.நளின் பெர்னாண்டோ கலந்துகொண்டார்.
Participating in the inaugural event of the country-wide program for the distribution of chicks held at the Gampaha District Secretariat premises for the small and medium-scale industrialists who are already producing eggs, in order to stabilize the egg industry and increase the production of eggs





කොළඹ 07 රාජකීය විද්‍යාලීය නව රඟහලේදී ගරු අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණු “සමුපකාර දිනය- 'තිරසාර සංවර්ධනය සඳහා සමුපකාර” යන තේමාව පදනම් කරගනිමින් 101 වෙනි ජාත්‍යන්තර සමුපකාර දින සැමරුම් උත්සවය සඳහා සහභාගී වූ අවස්ථාව
மாண்புமிகு வர்த்தக அமைச்சர் அவர்கள், கொழும்பு றோயல் கல்லூரி புதிய அரங்கில் கௌரவ பிரதமர் தினேஸ் குணவர்தன அவர்களின் தலைமையில் நடைபெற்ற ”நிலையான அபிவிருத்திக்கான கூட்டுறவுகள்” என்ற தொனிப்பொருளின் அடிப்படையிலான 101வது சர்வதேச கூட்டுறவு தின கொண்டாட்டத்தில் கலந்துகொண்டார்.
Participate in the 101st International Cooperative Day celebration based on the theme "Cooperatives for Sustainable Development" which was held at the New Theater of the Royal College, Colombo 07 and the Honorable Prime Minister Dinesh Gunawardena served as the chief guest of this event.




පාරිභෝගිකයන් හට නිසි ප්‍රමිතියකින් යුතු භාණ්ඩ හා සේවා ලැබෙනවාද යන්න සොයා බැලීම සඳහා වැලිසර හා නාරාහේන්පිට විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයන්හි නිරීක්ෂණ චාරිකාවක නිරත වූ අවස්ථාව.
கௌரவ வர்த்தக அமைச்சர் அவர்கள் வெலிசர மற்றும் நாரஹேன்பிட்டி விசேட பொருளாதார மத்திய நிலையங்களில் வாடிக்கையாளர்கள் உரிய தரத்தில் பொருட்கள் மற்றும் சேவைகளைப் பெறுகின்றார்களா என்பதைக் கண்டறிய கண்காணிப்புச் சுற்றுப்பயணம் மேற்கொண்ட சந்தர்ப்பம்.
An observation tour was conducted in Welisara and Narahenpita special economic centers to find out whether the customers are getting quality goods and services



"සදාචාරාත්මක ව්‍යාපාරික පරිසරයක්" මැයෙන් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මගින් සිදු කරනු ලබන දීප ව්‍යාප්ත වෙළෙඳ ව්‍යාපාරිකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවෙහි සමාරම්භක වැඩසටහන සඳහා සහභාගී වෙමින්.
நுகர்வோர் அதிகாரசபையினால் ”நெறிமுறை வர்த்தக சூழல்” தொடர்பான விழிப்புணர்வு நிகழ்ச்சித் தொடர் ஆரம்ப நிகழ்வில் கலந்துகொண்ட கௌரவ வர்த்தக அமைச்சர்.
Participating in the inaugural program of the series of awareness programs - "Ethical Business Environment" - for traders throughout the island conducted by the Consumer Affairs Authority.



"සදාචාරාත්මක ව්‍යාපාරික පරිසරයක්" මැයෙන් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මගින් මීගමුවේදී පැවැත්වූ දීප ව්‍යාප්ත වෙළෙඳ ව්‍යාපාරිකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවෙහි දෙවන වැඩසටහන සඳහා සහභාගී වෙමින්.
நுகர்வோர் அதிகாரசபையினால் ”நெறிமுறை வர்த்தக சூழல்” தொடர்பான விழிப்புணர்வு நிகழ்ச்சித் தொடர் ஆரம்ப நிகழ்வில் கலந்துகொண்ட கௌரவ வர்த்தக அமைச்சர்.
Participating in the second program in the series of awareness programs -"Ethical Business Environment" - for traders throughout the island held by the Consumer Affairs Authority in Negombo



"පාරිභෝගිකයන් විසින් යොමුකරන සහන පැමිණිලි විමර්ශනය විමධ්‍යගත ක්‍රියාවලියක් ඔස්සේ විධිමත් කිරිමේ වැඩසටහන" සඳහා සහභාගී වෙමින්.
மாண்புமிகு வர்த்தக அமைச்சர் அவர்கள், ”பரவலாக்கப்பட்ட செயல்முறையின் மூலம் நுகர்வோரால் குறிப்பிடப்படும் நிவாரண முறைப்பாடுகளின் விசாரணையை முறைப்படுத்துவதற்கான வேலைத்திட்டத்தில்” கலந்துகொண்டார்.
Participating in "Programme to Streamline Investigation of Relief Complaints Referred by Consumers through a Decentralized Process".



ව්‍යවසායකයන් දිරිමත් කිරීම වෙනුවෙන් සීමාසහිත සමස්ත ලංකා ව්‍යවසායක සංවර්ධන සමූපකාර සමිතියේ ජා ඇළ ශාඛාව විවෘත කිරීම සඳහා සහභාගී වෙමින්.
தோழில் முயற்சியாளர்களை ஊக்குவிப்பதற்காக வரையறுக்கப்பட்ட அகில இலங்கை தொழில் முயற்சியாளர் அபிவிருத்தி கூட்டுறவுச் சங்கத்தின் ஜா அல கிளையை திறந்து வைக்கும் நிகழ்வில் கௌரவ வர்த்தக அமைச்சர் அவர்கள் கலந்துகொண்டார்.
Opening ceremony of the All Ceylon Entrepreneur Development Cooperative Society Limited Ja-Ala Branch



වෙළෙඳපොළේ කුකුළු මස් මිල ගණන් අඩු කිරීම සම්බන්ධයෙන් එම නිෂ්පාදකයින් සමඟ පැවති සාකච්ඡාව.
சந்தையில் கோழி இறைச்சி விலை குறைப்பு தொடர்பில் உற்பத்தியாளர்களுடன் கலந்துரையாடல் வர்த்தக அமைச்சர் அவர்களால் நடத்தப்பட்டது.
The discussion held with the producers regarding the reduction of chicken prices in the market.




**වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය**

අංක 492, ආර්. ඒ. ද. මැල් මාවත, කොළඹ 03. දුරකථනය: 0112435511 ෆැක්ස්: 0112432255 විද්‍යුත් තැපැල: info@trademin.gov.lk

**வர்த்தக, வணிக மற்றும் உணவு பாதுகாப்பு அமைச்சு**

இல.492 ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு-03. தொலைபேசி: 0112435511 தொலைநகல்: 0112432255 மின்னஞ்சல்: info@trademin.gov.lk

**Ministry of Trade, Commerce and Food Security**

No 492, R A De Mel Mawatha, Colombo 03. Tel: 0112435511 Fxa: 0112432255 E mail: info@trademin.gov.lk